# රණවිරුවා

2025 පෙබරවාරි • 273 කලාපය



යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩියූ පීඑස්සී අයිජී ඉකුත් පෙබරවාරි මස 06 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයේ දී ජනාධිපති සහ සන්නද්ධ හමුදා සේනාධිනායක අනුර කුමාර දිසානායක මහතා හමුවූ අවස්ථාව

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.



## ආගමික ආශීර්වාද ලැබ







යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී හා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වෙන්ද්‍රිනි දිසානායක මහත්මිය 2025 පෙබරවාරි මස 05 දින ශ්‍රී මහා බෝධිය සහ රුවන්වැලි මහා සෑ විහාරස්ථානය වැඳපුදා ගත්හ.

එහිදී, ඔවුනු නුවර කලාවියේ ප්‍රධාන සංඝනායක සහ අටමස්ථානාධිපති සාහිත්‍යශූරී අතිපූජ්‍ය පල්ලේගම හේමරතන හිමිපාණන්, උතුරු සහ උතුරුමැද පළාත් ප්‍රධාන සංඝනායක සහ ශ්‍රී සම්බුද්ධ ජයන්ති විහාරස්ථානයේ විහාරාධිපති අතිපූජ්‍ය නුගේතැන්න පඤ්ඤානන්ද නායක හිමිපාණන් සහ රුවන්වැලි මහා සෑ විහාරස්ථානයේ විහාරාධිපති අතිපූජ්‍ය ඊතලවැටුනුවැවේ ඥාණතිලක හිමිපාණන් බැහැදැක ආශිර්වාද ලබාගත්හ.

තවද, ජය ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි මහා සෑය සහ ශ්‍රී සම්බුද්ධ ජයන්ති විහාරස්ථාන පුදබිම් තුළ පැවති පූජාවන් සඳහා ද එම දෙපළ සහභාගී වූහ. මෙම සංචාරය අතරතුරදී, යුද්ධ හමුදාධිපති අනුරාධපුර පදවි එඬේරාණන් වන අතිඋතුම් දේව ධර්මාචාර්ය නෝබට් එම් අන්ද්‍රාදි රදගුරුතුමන් ද හමුවී ආශිර්වාද ලබාගත්තේය.

## ලෝක ශූරයාට නව හෙල්ලයක්



2024 ලෝක පැරා ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ පිරිමි F44 හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් මීටර් 67.03 දක්කමක් දක්වා නව ලෝක වාර්තාවක් පිහිට වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ බලලත් නිලධාරී II සමිත දුලාන් කොඩිතුවක්කු වෙත 2025 ජනවාරි මස 29 වන දින අධ්‍යාපන අමාත්‍යාංශයේ දී අග්‍රාමාත්‍යවරියගේ අතින් නව හෙල්ලයක් පිරිනැමිණ. මෙම අවස්ථාවට ප්‍රංශයේ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියකු වන සුභාෂිනී නිරංජලා වීරසිංහ මහත්මිය සහ ඔහුගේ පුහුණුකරු ප්‍රදීප් නිශාන්ත මහතා ද එක්වූහ.

2024 වර්ෂයේ ප්‍රංශයේ පැවැති පැරා ඔලිම්පික් උළෙලට සහභාගී වූ අවස්ථාවේ බලලත් නිලධාරී II සමිත දුලාන් කොඩිතුවක්කු හමුවූ සුභාෂිනී නිරංජලා වීරසිංහ මහත්මිය එහිදී ලබාදුන් පොරොන්දුවක් මල්වල ගන්වමින් තම ශ්‍රී ලංකා සංචාරයේ දී මෙම විශේෂ හෙල්ලය ලබාදීමට කටයුතු කළාය.



# ජනපති සහ යුද හමුදාවේ උසස් නිලධාරීන් අතර හමුවක්



ශ්‍රී ලංකාවේ වත්මන් ආරක්ෂක තත්ත්වය පිළිබඳ සාකච්ඡාවක් ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාලයේදී ඉකුත් පෙබරවාරි මස 25 වන දින පැවැත්විණි.

ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය, ජනාධිපති ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මෙන්ම යුද හමුදාපති ඇතුළු යුද හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් ඊට එක්ව සිටියහ. එහිදී, වත්මන් ආරක්ෂක තත්ත්වය සම්බන්ධයෙන් වූ ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කෙරිණි.



# විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමන් හමුවී



යුද්ධ හමුදාධිපති ඉකුත් පෙබරවාරි මස 07 වන දින විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය විජිත හේරත් මහතා කොළඹ පිහිටි එම අමාත්‍යාංශ කාර්යාලයේ දී හමුවී සුහද කතාබහක නිරතවිය.

# 77 ජාතික නිදහස් දිනය


# අභිමානවත්ව සැමරේ





















"ජාතික පුනරුදයට පෙළ ගැසෙමු" යන තේමාව යටතේ 77 වන ජාතික නිදහස් දින සැමරුම් උත්සවය සන්නද්ධ හමුදා සේනාධිනායක ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2025 පෙබරවාරි මස 04 වන දින උදෑසන කොළඹ නිදහස් චතුරශ්‍රයේ දී අභිමානවත් අයුරින් පැවැත්විණි. එම අවස්ථාවට භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛ ආගමික පූජකවරු, ගරු අග්‍රාමාත්‍යතුමිය, රාජ්‍ය තාන්ත්‍රිකයින්, අමාත්‍යවරු, ආරක්ෂක අංශ නිලධාරීන්, සම්භාවනීය අමුත්තන් සහ තවත් ආරාධිතයින් රැසක් ද සහභාගි වූහ.

එහිදී, ජනාධිපතිතුමා විසින් ජාතික ධජය එසවීමත් සමගම විවිධ සංස්කෘතීන් නියෝජනය කරන පාසල් සිසු සිසුවියන් විසින් දේශප්‍රේමී හැඟීම් උද්දීපනය කරමින් ජාතික ගීය ගායනා කරන්නට විය. තවද, පාසල් සිසුවියන් කණ්ඩායමක් විසින් "ජයමංගල ගාථා" ගායනා කරමින් ජනාධිපතිතුමන් වෙත ආශිර්වාද පුදකරන ලද අතර, මව්බිමේ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීමේ උදාර මෙහෙවර පෙරදැරිව රට වෙනුවෙන් දිවිපිදූ විරෝදාර රණවිරුවන් සිහිපත් කරමින් මිනිත්තු දෙකක නිශ්ශබ්දතාවක් ද පැවැත්විණ. ඉන් අනතුරුව, ජනාධිපතිතුමන් විසින් එම අභිමානවත් අවස්ථාවේ දී ජාතිය ඇමතීමට ද කටයුතු කරන ලදී. 77 වන නිදහස් දිනයට අභිමානයක් එක්කරමින් ත්‍රිවිධ හමුදා සාමාජිකයින්, පොලිස් නිලධාරීන්, විශේෂ කාර්ය බලකායේ නිලධාරීන්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන්, ජාතික ශිෂ්‍යභට බලකායේ සාමාජිකයින්, සේවයේ නිරතව සිටින සහ විශ්‍රාමික, රණක්ෂිතයට පත් රණවිරුවන්ගෙන් සැදුම්ලත් වර්ණවත් හමුදා සම්මාන පෙළපාලිය ජනාධිපතිතුමන් වෙත ආචාරය පුදකළහ. මෙම අභිමානවත් පෙළපාලියේ අණදෙන නිලධාරී ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ වැඩබලන සේනාවිධායක මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී කටයුතු කළේය. අනතුරුව, පැවති සංස්කෘතික නර්තනාංගයන්ගෙන් උත්සවය වඩාත් අලංකාරවත් වූ අතර, එමගින් ශ්‍රී ලංකාව තුළ පවතින සංස්කෘතික විවිධත්වය ලොවට විදහා දැක්විය.







CLEAN SRI LANKA

SOCIALLY . ENVIRONMENTALLY . ETHICALLY

## දෙදින පුහුණු වැඩසටහනක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අනුග්‍රහයෙන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් සංවිධානය කල "Clean Sri Lanka" වැඩසටහන පිළිබඳ දෙදින පුහුණු සැසියක් පනාගොඩ, ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ඉකුත් පෙබරවාරි මස 18 වන දින ආරම්භ කෙරිණ. එහි සමාරම්භක අවස්ථාව සඳහා ජනාධිපති ලේකම් ආචාර්ය නන්දික සනත් කුමානායක මහතා, ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරු, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, යුද්ධ සහ ගුවන් හමුදාධිපතිවරු, ත්‍රිවිධ හමුදා, පොලිස් සාමාජිකයින් මෙන්ම රාජ්‍ය නිලධාරින් පිරිසක් ද සහභාගි වූහ. මෙම සැසිවාරයෙන් පසුව විශේෂිත පුහුණු කණ්ඩායමක මඟ පෙන්වීම යටතේ දින දෙකක පුහුණු වැඩසටහනක් ද ක්‍රියාත්මක වූ අතර, එම පුහුණු සැසිය සඳහා ත්‍රිවිධ හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ සාමාජිකයින් 135 දෙනෙක් සහභාගි වූහ.

## නව පරිගණක ආශ්‍රිත ද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක්



පරිගණක ආශ්‍රිත ද්‍රව්‍ය කළමණාකරණ පද්ධතිය - අදියර 2 සහ myQ1 මෘදුකාංග යෙදවුම් නිල වශයෙන් එළිදැක්වීම ඉකුත් පෙබරවාරි මස 19 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදුකෙරිණි. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩියූ පීඑස්සී අයිජී සහභාගී විය. එහිදී යුද්ධ හමුදාවේ හටකාර්ය සම්පාදනය සහ ද්‍රව්‍ය කළමනාකරණයේ ප්‍රවර්ධනය සනිටුහන් කරමින් යුද්ධ හමුදාධිපති විසින් අදාළ මෘදුකාංග යෙදවුම් නිල වශයෙන් එළිදක්වන ලදි.

# ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදා වෛද්‍ය විද්‍යාර්ථයින්ගේ අධ්‍යයන සැසිවාරය







ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදා වෛද්‍ය විද්‍යාර්ථයින්ගේ සංගමය යනු ශ්‍රී ලංකා යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවන්හි වෛද්‍ය සහ දන්ත වෛද්‍යවරුන්ගෙන් සමන්විත වෘත්තීය සංගමයකි. වාර්ෂිකව සංවිධානය කරනු ලබන මෙම සංසදය මඟින් එයට සහභාගි වන්නන්ගේ දැනුම වැඩි දියුණු කිරීම, නවෝත්පාදනයන් සඳහා මංපෙත් විවර කිරීම සහ හමුදා සෞඛ්‍ය සේවාව සඳහා ගෝලීය දායකත්වය ලබාගැනීම සිදුකරනු ලබයි.

ඒ අනුව ඔවුන්ගේ 8 වන වාර්ෂික අධ්‍යයන සැසිවාරයේ සමාරම්භක උත්සවය "හමුදා සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම, විශිෂ්ටතා නවෝත්පාදනය සහ ගෝලීය බලපෑම" යන තේමාව යටතේ 2025 පෙබරවාරි මස 14 වන දින කොළඹ, ගලදාරි හෝටලයේදී පැවැත්විණ. මෙම උත්සවය මඟින් හමුදා-සිවිල් සහයෝගිතාව වැඩි දියුණු කිරීම සහ හමුදා වෛද්‍ය විද්‍යාව පිළිබඳ විශේෂඥයින් අතර වැඩි නැඹුරුතාවක් ඇති කිරීම අරමුණ විය.

මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස ආරක්ෂක ලේකම් එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී, එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයනය - චීනය), එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ, එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයනය), එස්එන්ඩීයූ (චීනය), පීඑස්සී සහභාගි වූ අතර, එම සංගමයේ ඇරයුමෙන් ගෞරවනීය ආරාධිතයකු ලෙස විකලාංග හා කම්පන ශල්‍ය වෛද්‍ය උපදේශක ආචාර්ය නරේන්ද්‍ර පින්තු මහතා ද ඊට එක්විය.

එසේම, ඊට ත්‍රිවිධ හමුදාධිපතිවරු, ඉන්දීය දූත පිරිසේ විශේෂ ආරාධිතයින් වන Brigadier Tathagatha Chatterjee, Dr. Jyotsna Punj සහ Dr. Ravinder Kumar Pandey ද සහභාගි වූහ. වෛද්‍ය සහ දන්ත වෛද්‍ය ක්ෂේත්‍රයන්ට අදාළ අනෙකුත් ආයතනවලින් වෘත්තිකයන් ඇතුළු තවත් 350කට අධික සංඛ්‍යාවක් ද මෙම සැසිවාර සඳහා එක්වූහ. මෙම තෙදින සැසිවාරයේදී විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ ඵලදායි සාකච්ඡා අඛණ්ඩව පවත්වාගෙන යාම අපේක්ෂාවයි.



# ඉළුක්ඹිවිට කණිෂ්ඨ විද්‍යාලයේ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියක්







"Clean Sri Lanka" වැඩසටහනට සමගාමීව, දිවයින පුරා පිහිටි පාසල් 1000ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ජාතික වැඩසටහනේ ආරම්භය සනිටුහන් කරමින් ඉකුත් පෙබරවාරි මස 20 වන දින ඉළුක්ඹිවිට, බප/හෝ ඉළුක්ඹිවිට කණිෂ්ඨ විද්‍යාලයේ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියක් ආරම්භ කෙරිණි.



එහිදී, එම විද්‍යාලීය විදුහල්පති වසන්ත උදයසිරි මහතා විසින් පිළිගැනීමේ කථාව පවත්වමින් මෙම ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ වැදගත්කම පිළිබඳව පැහැදිලි කළේය.
ඉන් අනතුරුව, ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ භටපිරිස්හි ශ්‍රම දායකත්වය හා තාක්ෂණික දැනුම භාවිතා කරමින් සිදුකරනු ලබන මෙම ප්‍රතිසංස්කරණ කටයුතුවල ආරම්භය සනිටුහන් කරමින් එම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී එක්විය. බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් යූකේඩීඩීපී උඩුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී එන්පීඑස් පීඑස්සී ප්‍රමුඛ නිලධාරීහු, රාජ්‍ය නිලධාරීන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ පාසල් සිසු සිසුවියන් රැසක් ඊට එක්වූහ.

## මව් රෙජිමේන්තුවෙන් බුහුමන්



යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජීඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ සිය ධුරයෙන් නික්ම යාම නිමිත්තෙන් 2025 පෙබරවාරි මස 08 වන දින අඹේපුස්සෙහි පිහිටි සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී එතුමන් වෙත බුහුමන් පුදනු ලැබීය. එහිදී, රෙජිමේන්තු භටපිරිස් වෙතින් ලද ගෞරවාචාර මධ්‍යයේ එහි සපැමිණි රෙජිමේන්තු අධිපති එම රෙජිමේන්තු රණවිරු ස්මාරකය අභියස දී මියගිය රණවිරුවන් සිහිකිරීමට ද අමතක නොකළේය. පසුව, සියලු නිල තේපැන් සංග්‍රහයකට ද සහභාගී වූ හෙතෙම එම භටපිරිස් සමග සුහද අදහස් හුවමාරුවක ද නිරතවිය. එහිදී, පැවති වැඩසටහන් අවසන 58 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජේකේආර් ජයකොඩි ආර්ඩබ්ලිව්පී යූඑස්පී විසින් නික්ම යන රෙජිමේන්තු අධිපති වෙත විශේෂ සමරු තිළිණයක් ද පිරිනමන ලදී. මෙම අවස්ථාවන්ට එම රෙජිමේන්තු විශ්‍රාමික නිලධාරීන් ඇතුළු නිලධාරී සෙසුනිල විශාල පිරිසක් සහභාගී වූහ.



# නව තනතුරු ලැබූ වගයි

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 66 වන මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ඉකුත් පෙබරවාරි මස 10 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී රාජකාරි භාරගනු ලැබීය. ගජබා රෙජිමේන්තුවේ වත්මන් රෙජිමේන්තු අධිපති ද වන එතුමන් නව තනතුරේ රාජකාරි භාරගැනීමට පෙර යුද හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක ලෙස ද නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන ලෙස ද රාජකාරි කරන ලදී.



මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් පෙබරවාරි මස 14 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 46 වන නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන ලෙස රාජකාරි භාරගනු ලැබීය. ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ වත්මන් බලකාධිපති වන එතුමන් නව තනතුරේ රාජකාරි භාරගැනීමට පෙර බටහිර ආරක්ෂක සේනා ආඥාපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ වැඩබලන සේනාවිධායක ලෙස ද කටයුතු කරන ලදී.



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ 60 වන සේනාවිධායක ලෙස මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී එන්පීඑස් පීඑස්සී ඉකුත් පෙබරවාරි මස 13 වන දින කොස්ගම පිහිටි එම මූලස්ථානයේ දී රාජකාරි භාරගනු ලැබීය. ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ වත්මන් බලකාධිපති වන එතුමන් මෙම ධුරයේ රාජකාරි භාරගැනීමට පෙර අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක සහ මධ්‍යම ආරක්‍ෂක සේනා ආඥාපති ලෙස ද රාජකාරි කරන ලදී.





# විදු මැණියන්ගෙන් උපහාර



කොළඹ ශාන්ත බෙනඩික්ට් විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වන යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩියු පීඑස්සී අයිජී වෙනුවෙන් උපහාර දැක්වීමේ උත්සවයක් ඉකුත් පෙබරවාරි මස 07 වන දින එම විද්‍යාලයේ දී පැවැත්විණ. එදින විද්‍යාලය වෙත සපැමිණි යුද්ධ හමුදාධිපති ගරු අධ්‍යක්ෂ පියතුමා විසින් උණුසුම් ලෙස පිළිගත් අතර, පාසල් තූර්ය වාදක සහ "වෙස් නර්තන" කණ්ඩායම් ද එම අවස්ථාව සඳහා එක්වූහ. එහිදී, පාසල් ශිෂ්‍ය භට කණ්ඩායම විසින් යුද්ධ හමුදාධිපති වෙත ගෞරවනීය උත්තමාචාර පුදකරනු ලැබූහ. අනතුරුව, තමාට සිය තනතුර දක්වා පැමිණීමට විද්‍යාලයෙන් ලද පන්නරය සිහිපත් කරමින් යුද්ධ හමුදාධිපති විසින් විද්‍යාලයේ සිසුන් ආමන්ත්‍රණය කරන්නට ද කටයුතු කරන ලදී. සාර්ථකත්වය ළඟාකරගැනීමේ දී විනය සහ නොපසුබට උත්සාහයේ වටිනාකම මෙන්ම දරාගැනීමේ හැකියාව ද අවධාරණය කළ හෙතෙම අධිෂ්ඨානය සහ නොසැලෙන උත්සාහය තුළින් ජයග්‍රහණ ලබාගැනීමේ වැදගත්කම ද ඉස්මතු කළේය.

මෙම අවස්ථාවේ දී ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජ්ඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියු, ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුද සේවා ලේකම් මේජර් ජෙනරාල් යූඑල්ජේඑස් පෙරේරා ආර්එස්පී යූඑස්පී එන්පීඑස්සී, එයාර් වයිස් මාර්ෂල් ඩීබීවී වීරසිංහ යූඑස්පී, එම්ඩීඑස්, බීඑස්සී (ආරක්ෂක අධ්‍යයනය), එම්අයිඑම් (එස්එල්), පීඑස්සී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයීය රෝහලේ පාලන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එල්ඩබ්ලිව්වීඑස්ආර් වෙත්තසිංහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එස්ඩීඑන්සී ද සිල්වා සහ නියෝජ්‍ය පොලිස්පති එස්එම්වයි සෙනෙවිරත්න යන ආදි සිසුන් වෙත ද විද්‍යාලීය උපහාර දැක්විය. තවද, පාසලේ තාක්ෂණික යටිතල පහසුකම් තවදුරටත් වැඩිදියුණු කරමින්, ඉදිකරන ලද තොරතුරු තාක්ෂණ විද්‍යාගාරය ද යුද්ධ හමුදාධිපති ගේ සුරතින් එහිදී විවෘත කෙරිණ.





# 77 වන නිදහස් දින සැමරුම වෙනුවෙන් පරිත්‍යාග වැඩසටහනක්

77 වන නිදහස් දින සැමරුම වෙනුවෙන් 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්පීඑන්ජී මුතුමාල යූඑස්පී පීඑස්සී ගේ මගපෙන්වීම මත එම සේනාංකයේ භටපිරිස් එකතුව ඉකුත් පෙබරවාරි මස 04 වන දින ශාන්ත තෙරේසා වැඩිහිටි නිවාස පරිශ්‍රය පිරිසිදු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළහ. ඊට සමගාමීව, එම වැඩිහිටි නිවාසයේ නේවාසික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක් ද පිරිනැමූ අතර, ඔවුනගේ ප්‍රයෝජනය සඳහා සනීපාරක්ෂක ද්‍රව්‍ය පරිත්‍යාගයක් ද සිදුකෙරිණ. මෙහි දෙවන අදියර ලෙස, කෝපායි ප්‍රදේශයේ ළමුන් 150 දෙනකු වෙත විශේෂ දිවා භෝජන සංග්‍රහයක් පිරිනැමීම ද සිදුකෙරුණු අතර, එම අවස්ථාවට යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් වයිඒබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් පිරිසක් සහභාගි වූහ.





# මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රතිවිපාක සහ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දේශනයක්







මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රතිවිපාක සහ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දේශනයක් 2025 පෙබරවාරි මස 25 වන දින වන්නි ආරක්ෂක සේනා මූලස්ථානයේ දී පැවැත්විණ. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සහකාර උපදේශක එන්.ජී. ධනුෂ්ක සම්පත් විජේසිංහ මහතා විසින් මෙම දේශනය මෙහෙයවන ලද අතර, මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීමේ ස්වභාවය, මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රතිවිපාක, මත්ද්‍රව්‍ය නිවාරණය සහ ඒ සබැඳි නීතිය ඇතුළු විවිධ මාතෘකා ඔස්සේ එහිදී දැනුම්වත් කෙරිණ. ආරක්ෂක සේනා මූලස්ථානය වන්නි යටතේ රාජකාරි නියුතු සේනාංක බලසේනා හා ඒකකවල විශාල භට පිරිසක් ඊට සහභාගී වූ අතර, තවත් පිරිසක් Zoom තාක්ෂණය ඔස්සේ ද සම්බන්ධ වූහ.





# ගංගාරාම විහාරස්ථානයේ නවම් පෙරහැර මංගල්‍යයට යුද්ධ හමුදාධිපති ද එක්වේ

හුණුපිටිය, ගංගාරාම විහාරස්ථානයේ නවම් පෙරහැර ඉකුත් පෙබරවාරි මස 12 වන දිනට යෙදුණු නවම් පුර පසළොස්වක පොහෝ දින පැවති අතර එම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩියු පීඑස්සී අයිජී ද සහභාගි විය. අඛණ්ඩව 45 වන වරටත් මෙවර පැවැත්වූ පෙරහැර මංගල්‍යය සඳහා ප්‍රධාන ආරාධිතයා ලෙස බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය මහාචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි මහතා සහභාගි විය.

අවසන් පෙරහැර මංගල්‍යයේ සමාරම්භක අවස්ථාව සඳහා හිටපු ජනාධිපතිවරු, අමාත්‍යවරු සහ සම්භාවනීය අමුත්තන් පිරිසක් ද සහභාගි වූහ. ගංගාරාම විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය ආචාර්ය කිරින්දේ අස්සජි හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් මහා සංඝරත්නයේ මඟපෙන්වීම මත මෙවර නවම් පෙරහැර මංගල්‍යය සංවිධානය කෙරිණි.

# යුද්ධ හමුදාධිපති "අභිමංසල - 3" සුවතා නිකේතනයේ නිල සංචාරයක





යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි පසුගිය පෙබරවාරි මස 05 වන දින පාන්ගොල්ලෙහි ස්ථාපිත අභිමංසල - 3 සුවතා නිකේතනයේ නිල සංචාරයක නිරතවූහ. එහිදී, එතුමන් එම පරිශ්‍රයේ ඇති නේවාසික කාමර, රෝහල, ආයුර්වේද රෝහල සහ අභිමන් ශිල්ප පියසෙහි නිරීක්ෂණ චාරිකාවක නිරතවිය. අනතුරුව එම දෙපල එක්ව නේවාසිකව ප්‍රතිකාර ගනු ලබන රණවිරුවන් වෙත ත්‍යාග පාර්සල් ද බෙදාදෙනු ලැබූහ. යුද්ධ හමුදාධිපතිගේ එම සංචාරය සනිටුහන් කරමින් එම සුවතා නිකේතනයේ රණවිරුවන් විසින් නිර්මාණය කරන ලද අත්කම් නිර්මාණයක් සහ සිතුවමක් යුද්ධ හමුදාධිපති සහ සේවා වනිතා ඒකකයේ සභාපතිනිය වෙත පිළිගැන්වීම ද සිදුවිය.

මෙම අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී එන්ඩීඑස් පීඑස්සී, 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්පීඑම් විජේසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, රණසේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඩබ්ලිව්ජීඑස්ආර් විජේදාස ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, අභිමංසල - 3 සුවතා නිකේතනයේ සේනාවිධායක බ්‍රිගේඩියර් ජීආර්එස් ධර්මරත්න යූඑස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසු නිලයන් පිරිසක් සහභාගි වූහ.

# යුද්ධ හමුදාධිපති සුහද හමුවීම් රැසක

## ඊශ්‍රායල තානාපති කාර්යාලයේ ආරක්‍ෂක උපදේශක සමඟ



නවදිල්ලි නුවර, ඊශ්‍රායල තානාපති කාර්යාලයේ ආරක්‍ෂක උපදේශක මෙන්ම ශ්‍රී ලංකාවේ ආරක්‍ෂක උපදේශක Colonel Avihay Zafrany, ඉකුත් පෙබරවාරි මස 18 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොඩ්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩියූ පීඑස්සී අයිජී යුද්ධ හමුදා මූලස්ථානයේදී හමුවිය. එහිදී ද්විපාර්ශ්වික සබඳතා වැඩි දියුණු කිරීම පිළිබඳ ඔවුන් අතර අදහස් හුවමාරු කරගත්හ.

## එක්සත් ජනපද තානාපතිනිය සමඟ

ශ්‍රී ලංකාවේ ඇමරිකා එක්සත් ජනපද තානාපතිනි ජූලි චන්ග් මෙනවිය ඉකුත් පෙබරවාරි මස 19 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී යුද්ධ හමුදාධිපති හමුවූවාය. ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ එක්සත් ජනපද සහකාර ආරක්‍ෂක උපදේශක Mr. Seth A. Nevins සහ විදේශ කටයුතු භාර නිලධාරී Captain Thaddeus Black ද මෙම අවස්ථාවට සහභාගී වූහ. මෙහිදී දෙරට අතර අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය කරගැනීම පිළිබඳව ඔවුන්ගේ අවධානය යොමුවිය.



## ශ්‍රී ලංකාවේ කොරියානු තානාපතිනිය හමුවී

ශ්‍රී ලංකාවේ කොරියානු ජනරජයේ තානාපතිනි Miyon LEE මහත්මිය ඉකුත් පෙබරවාරි මස 03 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී යුද්ධ හමුදාධිපති හමුවිය. මෙම අවස්ථාව සඳහා නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානී Sohngyee JUNG මහත්මිය ද, ශ්‍රී ලංකාව සහ නේපාලය නියෝජනය කරනු ලබන නවදිල්ලියේ කොරියානු ජනරජ තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක Lieutenant Colonel Han Jonghun ද එක්වූහ.



මෙම හමුවේදී, ශ්‍රී ලංකාව සහ කොරියානු ජනරජය අතර ද්විපාර්ශ්වික සබඳතා වැඩි දියුණු කිරීම පිළිබඳව කරුණු සාකච්ඡා කෙරිණ. තවද, දෙරටෙහි සන්නද්ධ හමුදා අතර ආරක්ෂක සහයෝගීතාවය හා පුහුණු වැඩසටහන් ශක්තිමත් කිරීම පිළිබඳව ද අදහස් හුවමාරු කරගත්හ.

# ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියානු ආරක්ෂක උපදේශකතුමිය හමුවී



ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියානු ආරක්ෂක උපදේශක Colonel Amanda Johnston ඉකුත් පෙබරවාරි මස 17 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොඩ්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩියූ පීඑස්සී අයිජී හමුවිය. එහිදී, දෙරටට බලපාන වැදගත් කරුණු රැසක් පිළිබඳ සාකච්ඡා කෙරිණ.

# කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපති සමඟ



ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපති රියර් අද්මිරාල් එච්ජීයූ ධම්මික කුමාර VSV USP psc MMaritimePol BSc (DS) හා යුද්ධ හමුදාධිපති අතර සුහද හමුවක් ඉකුත් පෙබරවාරි මස 25 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී සිදුවිය. මෙහිදී ඉදිරි වර්ෂය තුළ අධ්‍යාපන සැලැස්ම පිළිබඳ වැඩිදුරටත් සාකච්ඡා කෙරිණ.

# රුවන්ඩාවේ දූත පිරිසක් සමඟ

රුවන්ඩාවේ ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ පුහුණුවේ නිරතව සිටින දූත පිරිසක් ඉකුත් පෙබරවාරි මස 11 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවූහ. Colonel Lausanne Nsengimana සහ ජ්‍යෙෂ්ඨ උපදේශක Lieutenant Colonel Jean Baptiste Uwiminsi ප්‍රමුඛ ශිෂ්‍ය නිලධාරීන් පිරිසක් මෙම අවස්ථාව සඳහා සහභාගි වූහ.



එහිදී, ඔවුහු දෙරට අතර පවතින ආරක්ෂක සහ ද්විපාර්ශ්වික සහයෝගීතාවය පිළිබඳව කරුණු සාකච්ඡා කළහ. එම සංචාරය සනිටුහන් කරමින් දෙපාර්ශ්වය අතර සමරු තිළිණ හුවමාරුවක් ද සිදුවිය.

# පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක්

51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්පීඑන්ඒ මුතුමාල ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ මඟපෙන්වීම හා අධීක්ෂණයෙන් යාපනයේ සෙල්වපුරම් සහ යෝගපුරම් ප්‍රදේශයෙහි ආර්ථික අපහසුතා මධ්‍යයේ දිවිගෙවන පවුල්වල දරු දැරියන් වෙනුවෙන් පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් 2025 ජනවාරි මස 14 වන දින 51 වන පාබල සේනාංක CIMIC උද්‍යාන පරිශ්‍රයේ දී පැවැත්විණි.





යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් වයිඒබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මෙම වැඩසටහන සඳහා මේජර් ජෙනරාල් රවී රත්නසිංහම් (විශ්‍රාමික) සිවකුමාර් පොන්නතුරෙයි සහ එතුමන්ගේ භාර්යාව තබෝකරන් බවන් සහ තේනුජන් යන මහත්ම මහත්මීහු සිය මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදෙනු ලැබූහ.



# අඩු ආදායම්ලාභී පවුලක් සඳහා නව නිවසක්



512 වන පාබල බලසේනාවේ සහයෝගීතාවයෙන් යුතුව උඩුවිල් වාලිකාමම් දකුණ ප්‍රදේශයේ පදිංචි අඩුආදායම්ලාභී පවුලක් සඳහා නව නිවසක් ඉදිකරදීමේ උත්සවයක් 2025 ජනවාරි මස 11 වන දින සිදුකෙරිණ. 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්පීඑන්ඒ මුතුමාල යූඑස්පී පීඑස්සී ගේ අධීක්ෂණයෙන් මෙම නිවස ඉදිකෙරුණු අතර, යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් වයිඒබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී එම අවස්ථාවට ප්‍රධානත්වය දැරීය. මේජර් ජෙනරාල් රවී රත්නසිංහම් (විශ්‍රාමික) ගේ සම්බන්ධීකරණයෙන් යුතුව Aid Canada සංවිධානය විසින් මෙම නිවස ඉදිකිරීම සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදුන් අතර, 17 වන ගැමුණු හේවා බලඇණියේ භටපිරිස් ඊට ශ්‍රමදායකත්වය ලබාදුන්හ.

# නැගෙනහිර පළාත් ආණ්ඩුකාර හා රදගුරු තුමන් හමුවී





නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් පතිරවිතාන යූඑස්ඩබ්ලිව්සී පීඑස්සී ඉකුත් ජනවාරි මස 22 වන දින නැගෙනහිර පළාත් ආණ්ඩුකාර මහාචාර්ය ජයන්ත ලාල් රත්නසේකර සහ දිස්ත්‍රික් ලේකම් ඩබ්ලිව්ජීඑම් හේමන්ත කුමාර යන මහත්වරු මෙන්ම නැගෙනහිර පළාත් රදගුරු අතිඋතුම් ක්‍රිස්ටියන් නොයෙල් එමානුවෙල් රදගුරුතුමන් ද හමුවූහ. මෙම අවස්ථාවන් සඳහා 22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඒඑන් රසික කුමාර එන්ඩීසී පීඑස්සී ද එක්විය.

# උතුම් ගුණයට පැතුම් කලඹක්



> ගිනිඅවි අත දරණ රණවිරුවන් තුළ වන මෙවන් ආදර්ශමත් ගුණ යුද හමුදාවට සම්පතකි. අභිමානයකි. වත්මන් සමාජයේ කලාතුරකින් තැනක දී රණවිරුවන් පිළිබඳ ඇසෙන පසුගාමී පුවත් පරයා මෙවන් යහගුණ අප ඉස්මතු කළ යුත්තේ රණවිරුවන් යනු දේශයේ මුර දේවතාවුන්ම වන බැවිනි.

61 වන පාබල සේනාංකයේ කර්නල් ප්‍රධාන මාණ්ඩලික කර්නල් ඩබ්ලිව්එම්ඩීඑච්ආර්කේ වැලිකන්න ආර්ඩබ්ලිව්පී හට ඉකුත් පෙබරවාරි මස 17 වන දින කිසියම් අවශ්‍යතාවක් සඳහා බූස්ස ප්‍රදේශයට යමින් සිටියදී මාර්ගයේ තැනක වැටී තිබූ මුදල් පසුම්බියක් හමුවිය. පසුව ඔහු එය පරීක්ෂා කිරීමේ දී දුටුවේ එහි ATM කාඩ්පත් දෙකක්, බැංකු පාස් පොතක්, ජාතික හැඳුනුම්පතක්, රියදුරු බලපත්‍රයක් සහ රක්ෂණ කාඩ්පතක් ඇතුළු වටිනා ලියකියවිලි තොගයක් සමගින් රුපියල් 39,770.00ක වටිනාකමින් යුත් මුදලක් ඇති බවයි. එහිදී, එම මුදල් පසුම්බිය තමා සන්තකයේ සුරකිව තබාගත් ඔහු වහා එහි අයිතිකරු සොයා ඒ බව දැනුම්දීමට කටයුතු කළේය.

අනතුරුව, සමීර මදුෂංක වන එම අයිතිකරු සොයා ගැනීමට හැකිවූ අතර, ඒ අනුව ඔහුව 61 වන පාබල සේනාංකය වෙත කැඳවා අදාළ මුදල් පසුම්බිය නිවැරදිව ඔහු වෙත භාරදීමට ද කටයුතු කෙරිණ. එහිදී, ඉහත නිලධාරීගේ එම සත්ක්‍රියාව වෙනුවෙන් මුදල් හිමිකරු වෙතින් හිමිවූයේ අප්‍රමාණ ස්තුතියකි.





තවද, එවැනිම වූ සත්ක්‍රියාවක් 54 වන පාබල සේනාංකයෙන් ද වාර්තා විය. ඇය නමින් 2(සේවා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායට අයත් කෝප්‍රල් ගුණසේකර කේපීඑම්එන් වූවාය. ඉකුත් පෙබරවාරි මස 11 වන දින ඇය හට කිසියම් අවශ්‍යතාවකට මන්නාරම නගරයට ගිය මොහොතක අතරමග වැටී තිබූ මුදල් පසුම්බියක් හමුවී ඇත. ඇය එම මුදල් පසුම්බිය පරීක්ෂා කිරීමේදී දුටුවේ එහි රුපියල් 102,220.00 ක මුදලක් ද තවත් වටිනා ලියකියවිලි රැසක් ද ඇති බවයි. ඕ වහා එම මුදල් පසුම්බිය මන්නාරම පොලිස් ස්ථානයට භාරදීමට කටයුතු කරන ලද්දේ මොහොතකට හෝ ප්‍රමාදයකට ඉඩක් නොතබාය.

එහිදී, පොලිස් ස්ථානයේ මැදිහත්වීමෙන් එම පසුම්බියයේ හිමිකරු සොයා ගැනීමට හැකිවූ අතර, ඇය සුන්දරරාජා මේරි සුදර්ශනී නම් වූවාය. අවසානයේ පොලිස් ස්ථානය වෙත කැඳවූ ඇයට එම මුදල් හා අනෙකුත් ලියකියවිලි ඇතුළත් පසුම්බිය නිවැරදිව භාරදීමට කටයුතු කෙරුණේ විරු සෙබළියකගේ උදාර ගුණයට ඇ ගෙන් ලද උතුරායන තුති පැසසුම් මධ්‍යයේය. ඉහත සත්ක්‍රියාව අරභයා කෝප්‍රල් ගුණසේකර 54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ ද නොමඳ ඇගයුමට පාත්‍රවිය.

ගිනිඅවි අත දරණ රණවිරුවන් තුළ වන මෙවන් ආදර්ශමත් ගුණ යුද හමුදාවට සම්පතකි. අභිමානයකි. වත්මන් සමාජයේ කලාතුරකින් තැනක දී රණවිරුවන් පිළිබඳ ඇසෙන පසුගාමී පුවත් පරයා මෙවන් යහගුණ අප ඉස්මතු කළ යුත්තේ රණවිරුවන් යනු දේශයේ මුර දේවතාවුන්ම වන බැවිනි. සමස්ත යුද හමුදාවටම ආඩම්බරයක් එක්කළ කර්නල් ඩබ්ලිව්එම්ඩීඑච්ආර්කේ වැලිකන්න ආර්ඩබ්ලිව්පී සහ කෝප්‍රල් ගුණසේකර කේපීඑම්එන් වෙත "රණවිරුවා" තුළින් අපි ද සුභ පතන්නෙමු.



# CISM

## මාර්ග ධාවනය මෙවරත්



ලෝක හමුදා දින සැමරුම සනිටුහන් කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූලිකත්වයෙන් සංවිධානය කෙරුණු *Conseil International du Sport Militaire* (*CISM*) මාර්ග ධාවනය ඉකුත් පෙබරවාරි මස 18 වන දින පැවැත්විණි. ලොව පුරා සන්නද්ධ හමුදා සාමාජිකයන්ගේ ශාරීරික යෝග්‍යතාවය, පෙර සූදානම සහ ජාත්‍යන්තර මිත්‍රත්වයේ වැදගත්කම ඉස්මතු කිරීමේ අරමුණින් වූ මෙම මාර්ග ධාවනය සඳහා යුද්ධ, නාවික හා ගුවන් හමුදාධිපතිවරු ප්‍රමුඛ ත්‍රිවිධ හමුදා සාමාජිකයෝ 300කට අධික සංඛ්‍යාවක් සහභාගි වූහ.

බත්තරමුල්ල පාර්ලිමේන්තු ක්‍රීඩාංගණ පරිශ්‍රයේදී ආරම්භ වූ මෙම මාර්ග ධාවනය ආසන්න වශයෙන් කිලෝමීටර් 2.6ක දුරක් ආවරණය කරමින් යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රධාන දොරටුවෙන් අවසන් විය.එහි සමාප්තිය සනිටුහන් කරමින් ඊට සහභාගි වූවන්ගේ ක්‍රීඩාශීලීත්වය ඇගයීමට ලක්කරමින් ඔවුන් වෙත සහතිකපත් ද පිරිනැමිණ.





# වන්නි ආරක්ෂක සේනා මූලස්ථානයේ සංචාරයක්



යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී ඉකුත් පෙබරවාරි මස 08 වන දින වන්නි ආරක්ෂක සේනා මූලස්ථානයේ සංචාරයක නිරතවිය. ආඥාපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි යුද්ධ හමුදාධිපති වෙත එම මූලස්ථාන භටපිරිස් ගෞරවාචාර පිරිනැමූහ.



එහිදී, භටපිරිස් ඇමතූ යුද්ධ හමුදාධිපති ආඩම්බර පුරවැසියකු ලෙස කැපවීමෙන් තම ආදර්ශමත් සේවය නිසි අයුරින් සිදුකිරීමට ඔවුන් දිරිමත් කළ අතර, සන්නද්ධ හමුදාවන් තුළ එකමුතුකම, විනය සහ අඛණ්ඩ සංවර්ධනයේ වැදගත්කම ද අවධාරණය කළේය. තවද, ජාතියේ ආරක්ෂකයින් පමණක් නොව සමාජයේ ආදර්ශමත් චරිත ලෙස සෑම නිලධාරියකුගේම සහ සෙසුනිලයකුගේ කාර්යභාරය ද ඉස්මතු කරමින් වගකිවයුතු පුද්ගලයකු ලෙස, රාජකාරියේදී සහ ඉන් පිටතදී ඉහළ සදාචාරාත්මක ප්‍රමිතීන් පවත්වා ගැනීමේ වැදගත්කම පිළිබඳ ද දැනුම්වත් කළේය.



මෙම සංචාරය අතරතුර දී වව්නියාව ඇටඹගස්කඩ ප්‍රදේශයේ පදිංචි එස්.ඩී. සුරේෂ් කුමාර මහතා සහ ඔහුගේ පවුලේ අය වෙනුවෙන් අලුතින් ඉදිකරන ලද නිවසේ යතුර භාරදීමද යුද්ධ හමුදාධිපති ගේ සුරතින් සිදුවිය. මෙම නිවස සුධර්මාරාමය මහා විහාරයේ මූල්‍ය දායකත්වයෙන් සහ වන්නි ආරක්ෂක සේනා ආඥාපති ගේ මගපෙන්වීම යටතේ ඉංජිනේරු සේවා බලකායේ භටපිරිස්වල ශ්‍රම දායකත්වය මත ඉදිකරනු ලැබූහ. සිය සංචාරයේ දී යුද්ධ හමුදාධිපති සුධර්මාරාම මහා විහාරයේ සහ මඩුකන්ද ශ්‍රී දළදා විහාරයේ නායක ස්වාමීන් වහන්සේලා බැහැදැක ආශීර්වාද ලබාගැනීමට ද අමතක නොකළේය.



# එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක හමුව





ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක Mr. Marc-André Franche ඉකුත් පෙබරවාරි මස 14 වන දින යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ සංචාරයක නිරත විය. එහිදී, එම මූලස්ථාන ආඥාපති මේජර් ජෙනරාල් වයිඑම්බීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු පීඑස්සී විසින් එම දූත පිරිස උණුසුම් ලෙස පිළිගනු ලැබීය. මෙම හමුවේදී, ප්‍රදේශයේ සිදුකෙරෙන ප්‍රජා ව්‍යාපෘති, ආරක්ෂක මෙහෙයුම් සහ බලප්‍රදේශයට බලපාන අනෙකුත් ප්‍රධාන ගැටලු සඳහා හමුදාවේ සහභාගීත්වය පිළිබඳව දැනුම්වත් කෙරිණ. මෙම සාකච්ඡාවේදී යාපනය අර්ධද්වීපයේ සාමය සහ සංවර්ධනය වැඩි දියුණු කිරීම සඳහා යුද්ධ හමුදාවේ කැපවීම ද පෙන්වා දුන්නේය.



# දකුණු සුඩානයේ රාජකාරි නිරතව සිටි යුද්ධ හමුදා වෛද්‍ය කණ්ඩායම දිවයිනට



දකුණු සුඩානයේ, බෝර් හි දෙවන මට්ටමේ රෝහලේ සේවයේ නියුතුව සිටි නිලධාරීන් 9 දෙනෙක් සහ සෙසුනිලයන් 42 දෙනෙක්ගෙන් සමන්විත 10 වන යුද්ධ හමුදා වෛද්‍ය බලකා කණ්ඩායම වසරක කාලසීමාවක රාජකාරි නිමාවෙන් පසුව ඉකුත් පෙබරවාරි මස 11 වන දින දිවයිනට පැමිණියහ. මෙම කණ්ඩායමට අයත් තවත් නිලධාරීන් 07 දෙනෙක් සහ සෙසුනිලයන් 05 දෙනෙක් තවදුරටත් එහි සේවයේ නිරතව සිටින අතර ඔවුන් ද නුදුරේදී මෙරටට පැමිණීමට නියමිතය.

දිවයිනට පැමිණි එම පිරිස බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ පරිශ්‍රයේ දී ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒයූඑස් වනසේකර ආර්ඩබ්ලිව්පී යූඑස්පී සහ ගමන් පාලන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් සීඩී වික්‍රමනායක ඩබ්ලිව්වී ආර්එස්පී ඇතුළු නිලධාරීන් විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබූහ. වසරක කාලසීමාවක් පුරාවට දකුණු සුඩානයේ දෙවන මට්ටමේ රෝහලේ සේවයේ නිරතව සිටිමින් රෝගීන් කෙරෙහි වූ එක්සත් ජාතීන්ගේ සෞඛ්‍ය සේවා ප්‍රමිතීන් සහ ගුණාත්මකභාවය පවත්වාගැනීම වෙනුවෙන් සිය දායකත්වය ලබාදෙමින් එම කාර්යභාරය නිසි අයුරින් පවත්වාගැනීම සඳහා එම වෛද්‍ය බලකා කණ්ඩායම කැපවී සිටියහ.

# ගුවන් සංක්‍රමික පුහුණු පාසලේ සංචාරයක




53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑච්එම්එස් වික්‍රමරත්න ආර්එස්පී ඉකුත් ජනවාරි මස 28 වන දින ගුවන් සංක්‍රමික පුහුණු පාසලේ සංචාරයක නිරතවිය. එම පුහුණු පාසලේ වැඩබලන සේනාවිධායක මේජර් එච්එම්ටීඑච් ලක්මාල් ගේ ගෞරවණීය පිළිගැනීම මධ්‍යයේ එහි සපැමිණි සේනාංකාධිපති පුහුණු පාසලේ දැනට සිදුකෙරෙන පාඨමාලා පිළිබඳව හා එහි හටපිරිස් මෙන්ම කාර්ය මණ්ඩලයේ සුබසාධන අවශ්‍යතා පිළිබඳව ද සොයාබැලීය.

# කෘෂි උපකරණ බෙදාදීමේ වැඩසටහනක්




කරප්පුකුට්ටි, වව්නියාවේ ස්ථාපිත 16 බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් ඩබ්ලිව්එච් වික්‍රමසිංහ ආර්එස්පී යූඑස්පී පීඑස්සී එල්එස්සී ගේ මගපෙන්වීම මත එහි හටපිරිස් එකතුව ඉකුත් ජනවාරි මස 29 වන දින අඩු ආදායම්ලාභී පවුල් 50ක් වෙත රුපියල් 40,000.00ක පමණ වටිනාකමකින් යුත් කෘෂි උපකරණ බෙදාදෙනු ලැබූහ. 561 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් බීඩී ප්‍රනාන්දු යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් මෙම මාහැඟි කටයුත්ත සිදු වූ අතර, ඊට හැඳිම් අධිකාරියේ අනුග්‍රාහකත්වය හිමිවිය.

# ශිෂ්‍ය නායක නිල ලාංඡන පැළඳවීමේ උත්සවයක්




කඳාන, ලක්පහන ජාත්‍යන්තර පාසලේ අභිනවයෙන් පත්කරනු ලැබූ ශිෂ්‍ය නායකයින් වෙත නිල ලාංඡන පැළඳවීමේ උත්සවය ඉකුත් පෙබරවාරි මස 14 වන දින එම පාසල් පරිශ්‍රයේදී පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිතයා ලෙස 141 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ආර්ආර් ද එස් ධර්මවික්‍රම ආර්එස්පී සහභාගී විය. මෙම උත්සවයේ දී, නව ශිෂ්‍ය නායකයන් වෙත වගකීමෙන් සහ විශ්වාසයෙන් සිය කාර්යභාරයන් සිදුකිරීම සඳහා දිරිගැන්වීමේ අරමුණින් නායකත්ව මූලධර්ම පිළිබඳව අභිප්‍රේරණ දේශනයක් ද එතුමන් විසින් පවත්වන ලදී. එහිදී, ආදර්ශමත් නායකත්වය සහ කණ්ඩායම් ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සබැඳිව ද වැඩිදුරටත් දැනුවත් කෙරිණි. මෙම අවස්ථාව සඳහා එම පාසලේ විදුහල්පති, ගුරු භවතුන්, දෙමාපියන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

# අළුත්වැඩියා කළ ටාටා ට්‍රක් රථ යුද්ධ හමුදාධිපතිගේ නිරීක්ෂණයට



යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත උඩවලව, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපළෙහි අළුත්වැඩියා කරන ලද ටාටා 709 ට්‍රක් රථ දහයක් ඉකුත් පෙබරවාරි මස 19 වන දින යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී යුද්ධ හමුදාධිපතිගේ නිරීක්ෂණයට බඳුන්විය. මෙහෙයුම් සම්පාදන ක්‍රියාවලිය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා මේ වනවිට යුද්ධ හමුදාව වෙතින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහනට සමගාමීව මෙම කටයුත්ත සිදුවිය. උඩවලව, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපළ යටතේ සේවයේ නියුතු භටපිරිස් විසින් මෙම ට්‍රක් රථ අළුත්වැඩියා කළ අතර, මෙම රථ යුද්ධ හමුදාවේ ප්‍රයෝජනය වෙනුවෙන් යෙදවීමට ප්‍රථම භාවිතය සඳහා සුදුසු බව සහතික කරනු ලැබිය. මෙම අවස්ථාවට යුද්ධ හමුදා උපකරණ මාස්ටර් ජෙනරාල්, යුධෝපකරණ මාස්ටර් ජෙනරාල්, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ ජෙනරාල්, සැපයුම් සහ ප්‍රවාහන අධ්‍යක්ෂ ඇතුළු පිරිසක් සහභාගි වූහ.



## ආබාධිත රණවිරුවන් වෙනුවෙන් වෛද්‍ය කඳවුරක්





රණවිරු සේවා සහ පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය වන ගාල්ලෙහි ස්ථාපිත "සැනසුම" ශ්‍රී ලංකා යුද්ධ හමුදා සෘජුකාරක හා අංගාදේශක කාර්මිකාගාරයේ දී 2025 ජනවාරි මස 25 වන දින වෛද්‍ය කඳවුරක් පැවැත්විණ. දකුණු පළාතේ වෙසෙන රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ සෞඛ්‍ය අවශ්‍යතාවන් සපුරාලීම මෙහි අරමුණයි. එහිදී, විශේෂයෙන් කෘත්‍රිම දෑත් සහ පාද හෝ ශල්‍ය උපකරණ අවශ්‍යතා සහිත රණක්ෂිතයට පත් රණවිරුවන් 300 දෙනකු වෙත එම පරිත්‍යාග සිදුකෙරිණ. තවද, සෞඛ්‍ය උපදේශන, කෘත්‍රිම පාද නඩත්තු කිරීම, මානසික සෞඛ්‍ය උපදේශන සහ අවශ්‍යතාවයන් සහිත පුද්ගලයින් වෙනුවෙන් ආහාර ලබාදීම සබැඳි උපදෙස් ඇතුළු සේවාවන් රැසක් ද එහිදී සපයන ලදී. මෙම වැඩසටහනට සමගාමීව, චර්ම රෝග සහ දන්ත සේවා සඳහා විශේෂඥ සායනයක් ද පැවැත්විණි. රණක්ෂිතයට පත් රණවිරුවන්ට කලක පටන් පැවති අවශ්‍යතා රැසක් මෙමගින් සපුරාගැනීමට හැකිවීම ඔවුනගේ ඉමහත් අස්වැසිල්ලට හේතු විය.




# 58 වන වාර්ෂික යුද්ධ හමුදා මාර්ග ධාවන තරගය

අඛණ්ඩව 58 වන වරටත් සංවිධානය කරන ලද වාර්ෂික යුද්ධ හමුදා මාර්ග ධාවන තරගය ඉකුත් පෙබරවාරි මස 16 වන දින උදෑසන යුද්ධ හමුදා මූලස්ථානය අසළින් ආරම්භ විය. එම අවස්ථාව සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩියූ පීඑස්සී අයිජී ද සහභාගි වූයේය. ශ්‍රී ලංකා යුද්ධ හමුදා මළල ක්‍රීඩා කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් බීජීඑස් ප්‍රනාන්දු පීඑස්සී එච්ඩීඑම්සී ගේ මඟපෙන්වීම මත පැවති මෙම මාර්ග ධාවන තරගය බත්තරමුල්ල සිට පනාගොඩ යුද්ධ හමුදා ජනපදය දක්වා කිලෝමීටර් 22ක දුරකින් සමන්විතය. ඒ සඳහා කාන්තා කෙටි දුර ධාවන ක්‍රීඩිකාවන් 22 දෙනකු ඇතුළු රෙජිමේන්තු 21ක් නියෝජනය කරමින් ක්‍රීඩික ක්‍රීඩිකාවන් 111 දෙනකු සහභාගි වූහ.

එදින උදෑසන 6.00ට ආරම්භ වූ මෙම මැරතන් ධාවන තරගය දියත උයන, බත්තරමුල්ල, මාලඹේ, අතුරුගිරිය සහ හබරකඩ ඔස්සේ පනාගොඩ ගෘහස්ථ ක්‍රීඩාංගණය අසළින් අවසන් කෙරිණි. තරගයේ සමාප්තිය පැවති ස්ථානයට යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී, විධායක ජෙනරාල් සහ ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ කර්නල් සේනාවිධායක මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදා මළල ක්‍රීඩා කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඇතුළු තවත් ජ්‍යෙෂ්ඨ නිලධාරීහු ද එක්වූහ.







තරගයේ පිරිමි සමස්ත ශූරතාවය ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව ද කාන්තා සමස්ත ශූරතාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකාය ද හිමිකර ගත්තේය. එසේම, එහි පිරිමි කාණ්ඩයේ ප්‍රථම ස්ථානය ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ ආධුනික සෙබළ ප්‍රනාන්දු එම්එස්ඒ වද, දෙවන ස්ථානය ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ ලාන්ස් කෝප්‍රල් ගුණසේකර එච්ඩීඑස්ඩී වද තෙවන ස්ථානය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් කාරියවසම් කේජීවීඩී වද හිමිවූහ. කාන්තා කාණ්ඩයේ ප්‍රථම ස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ ලාන්ස් කෝප්‍රල් හේරත් එච්එම්සීඑස් ද දෙවන ස්ථානය ශ්‍රී ලංකා සංඥා බලකායේ ලාන්ස් කෝප්‍රල් නිදර්ශනී ඩබ්ලිව්ඒඑම්එන් ද තෙවන ස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ ලාන්ස් කෝප්‍රල් බණ්ඩාර ඒඑස්එන් ද දිනාගත්හ.

# 3 බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සංචාරයක





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මාණ්ඩලික ප්‍රධාන සහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ 2025 ජනවාරි මස 31 වන දින 3 බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සංචාරයක නිරත විය. ඒකක අණදෙන නිලධාරී මේජර් එන්ජේ සමරනායක ආර්එස්පී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි මාණ්ඩලික ප්‍රධාන වෙත එහිදී හටපිරිස් වෙතින් හිමිවූයේ ගෞරවනීය පිළිගැනුමකි. එහිදී, එතුමන් එම හටපිරිස් අමතමින් යුද්ධ හමුදාවේ අනාගත අවශ්‍යතාවයට සරිලන ආකාරයෙන් තම වෘත්තීය තුළ හැසිරීම හා ආකල්ප වර්ධනය කරගැනීම පිළිබඳ අවධාරණය කළේය. අනතුරුව, මාණ්ඩලික ප්‍රධාන පිදුරුතලාගල ස්ථාපිත එම ඒකක හටපිරිස් හමු වී ඔවුන් සමඟ සුහද කතාබහකට ද එක්විය.

# නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති සංචාර රැසක





නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් පතිරවිතාන යූඑස්ඩබ්ලිව්සී පීඑස්සී 2025 ජනවාරි මස 31 වන දින අම්පාර, 24 වන පාබල සේනාංක මූලස්ථානයේ සංචාරයක නිරත විය. එහිදී, එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්සීඑල් ගලප්පත්ති ආර්එස්පී යූඑස්පී ඇතුළු සියලු නිලධාරීහු විසින් ආඥාපති උණුසුම් ලෙස පිළිගනු ලැබූහ. එසේම, යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූලව එතුමන් වෙත එහි හටපිරිස් වෙතින් ද ගෞරවාචාර හිමිවූහ. ආඥාපති විසින් එහිදී එම සේනාංකය යටතේ රාජකාරි කරනු ලබන හට පිරිස් ඇමතීමට ද කටයුතු කළ අතර, අනතුරුව එම සේනාංකයේ අධීක්ෂණය යටතේ ඉදිකෙරෙමින් පවතින දීඝවාපිය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ ප්‍රගතිය සොයාබැලීමට ද එක්විය.

තවද, නැගෙනහිර ආඥාපති ඉකුත් පෙබරවාරි මස 01 වන දින පූනානි හි පිහිටි 23 වන පාබල සේනාංක මූලස්ථානයේ ද සංචාරය කළේය. එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ප්‍රියන්ත කාරියවසම් ගේ පිළිගැනුම් මධ්‍යයේ සපැමිණි ආඥාපති එම හටපිරිස් ඇමතීමට ද කටයුතු කළ අතර, ඔවුනගේ රාජකාරී ස්වභාවය, සුබසාධන අවශ්‍යතා ආදිය ද සොයාබැලීය.

# එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථානයේ සේවයේ නියුතු ශ්‍රී ලංකා හමුදා භටපිරිස් ඇගයේ





ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථානය (UNIFIL) යටතේ සේවයේ නියුතු 15 වන ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායමේ සේවය ඇගයීම වෙනුවෙන් වූ පදක්කම් ප්‍රදානෝත්සවය 2025 පෙබරවාරි මස 11 වන දින ලෙබනනය, නකුරා ප්‍රදේශයේ ස්ථාපිත එම මූලස්ථානයේදී පැවැත්විණි.



මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකායේ නියෝජ්‍ය අණදෙන නිලධාරි **Major General C.B Dhakal** සහභාගි විය. එමෙන්ම, ලෙබනනයේ ශ්‍රී ලංකා තානාපති කේඑස් ජයවීර මහතා, ලෙබනන් සන්නද්ධ හමුදාවන්හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථානයේ නිලධාරීන් පිරිසක්ද, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කරමින් මේජර් ජෙනරාල් යූකේඩීඩීපී උඩුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී සහ බ්‍රිගේඩියර් එස්ජ් හෙට්ටිගේ ආර්එස්පී පීඑස්සී යන නිලධාරීහු ද ඊට සහභාගි වූහ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිස එහිදී අතුරු බලකා නියෝජ්‍ය අණදෙන නිලධාරී ද හමුවූහ. අනතුරුව ඔවුහු ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායම ද හමුවී එම කණ්ඩායමේ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් ඩීකේඩී විතානගේ ආර්එස්පී ඇතුළු පිරිස සමග සුහද කතාබහක ද නිරතවූහ. පසුව එහි සාමසාධක රාජකාරීන්හි නිරතව සිටියදී ඇති වූ අනතුරක් හේතුවෙන් තුවාල ලැබූ යුද්ධ හමුදා සාමාජිකයන් දෙදෙනාගේ සුවදුක් විමසීමට ද ශ්‍රී ලංකා දූත පිරිස අමතක නොකළේය.



# ඉස්ලාම් වැසියන්ට සහයෝගයක්





උපවාස සමය සඳහා සූදානම් වන මුස්ලිම් වැසියන්ට සහයෝගය දැක්වීමේ අරමුණින් ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) වෙතින් ඉකුත් පෙබරවාරි මස 24 වන දින හපුතලේ, දියතලාව සහ කහගොල්ල යන ප්‍රදේශයන්හි පිහිටි මුස්ලිම් පල්ලි වෙත රටඉඳි බෙදාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. දියතලාව ප්‍රදේශයේ වෙසෙන දානපතියන් විසින් පරිත්‍යාග කරනු ලැබූ මෙම රටඉඳි සෑම පල්ලියක් වෙතම බෙදාදෙන ලදී. මෙම අවස්ථාවට ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීහු කිහිපදෙනෙක් සහභාගි වූහ.

# සංචාරයක මතක සටහන්






21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්එස්සිකේ වනසිංහ ආර්එස්පී යූඑස්පී ඉකුත් ජනවාරි මස 28 වන දින 212 වන පාබල බලසේනාව යටතේ පාලනය වන 7 (සේවා) ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ සහ 4 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ නිල සංචාරයක නිරතවිය. එම ඒකක වෙත සපැමිණි සේනාංකාධිපති වෙත භටපිරිස් විසින් සම්ප්‍රදායානුකූල සම්මාන මුරයකින් ගෞරවාචාරය පුදකිරීමෙන් අනතුරුව ඒකක අණදෙන නිලධාරීන් ප්‍රමුඛ සියලු නිලයින් විසින් එතුමන් උණුසුම් අයුරින් පිළිගන්නා ලදී. ඉන් අනතුරුව, 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති විසින් එම භටපිරිස් අමතන්නටද අමතක නොකළේය.

# උපායශීලී කුසලතා වර්ධනයට වැඩසටහනක්





ආරක්ෂක සේනා වන්නි ආඥාපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජනවාරි මස 18 වන දින සිට 21 වන දින දක්වා සිතියම් අභ්‍යාස වැඩසටහනක් පවත්වන ලදී. වන්නි ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ ස්ථාපිත පාබල සේනාංක, පාබල බලසේනා සහ ඒකකයන්හි රාජකාරී නියුතු නිලධාරීන්ගේ මෙහෙයුම් සූදානම සහ උපායශීලී සැලසුම් කුසලතා වැඩිදියුණු කිරීමේ අරමුණින් මෙම වැඩසටහන සිදුකරනු ලැබීය. එහිදී ඔවුන්ගේ න්‍යායාත්මක දැනුම, අවබෝධය සහ භාවිතය වැඩිදියුණු කිරීම කෙරෙහි ද අවධානය යොමුකෙරිණ.

# ජන සුවසෙතට රණවිරු ප්‍රජාසත්කාර



232 වන පාබල බලසේනාවට අයත් හටපිරිස් ඉකුත් පෙබරවාරි මස 04 දින කෝලවාඩි ගම්මානයෙහි ජනතාවට දිවා ආහාරය සැපයීමේ මාහැඟි සත්කාරයකට දායක වූහ.

242 වන පාබල බලසේනාවට අයත් හටපිරිස් ඉකුත් පෙබරවාරි මස 04 දින තිරුක්කෝවිල්හි ළමා නිවාසයක් වෙත පාසල් උපකරණ සහ දහවල් ආහාරය පිරිනැමීමේ සත්කාරයට දායක වූහ.



241 වන පාබල බලසේනාවට අයත් හටපිරිස් 2025 පෙබරවාරි මස 04 දින අක්කරෙයිපත්තු කාන්තා ළමා නිවාසයක් වෙනුවෙන් පාසල් උපකරණ සහ දිවා ආහාරය පිරිනැමීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළහ.



243 වන පාබල බලසේනාවට අයත් හටපිරිස් එකතුව ඉකුත් පෙබරවාරි මස 04 දින අරුපාහි කාන්තා ළමා නිවාසයක් වෙත ත්‍යාග භාණ්ඩ සහ දහවල් ආහාරය පිරිනැමීමේ මාහැඟි කටයුත්තකට දායක වූහ.



233 වන පාබල බලසේනාව යටතේ ස්ථානගත 7 වන ගැමුණු හේවා බලඇණියේ හටපිරිස් එකතුව 2025 පෙබරවාරි මස 04 වන දින කතිරවෙලි තිලකාවති ළමා නිවාසයට වෙත දිවා ආහාර වේලක් ලබා දුන්හ.





නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයේ හටපිරිස් එකතුව පසුගිය පෙබරවාරි මස 04 වන දිනට යෙදුනු නිදහස් දිනයට සමගාමීව පොලොන්නරු මහසෙන් ළමා හා වැඩිහිටි නිවාසය වෙත පාසල් උපකරණ පරිත්‍යාගයක් ද දහවල් ආහාරය පිරිනැමීමේ කටයුත්තක් ද සිදුකළහ.

3 ශ්‍රී ලංකා යුධෝපකරණ බලකායේ අණදෙන නිලධාරී ඇතුළු එම ඒකක හටපිරිස් විසින් පානීය ජල ව්‍යාපෘතියක් පසුගියදා එම ප්‍රදේශවාසීන් වෙත පවරා දෙන ලදී. මංගල පීරිස් මහතා ගේ මූල්‍ය දායකත්වයෙන් මෙම ව්‍යාපෘතිය සිදුකළ අතර, හටකාර්ය සම්පාදක අණසක (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්එස්එන් විජේකෝන් එන්ඩිසී ඒඒටීඕ මෙම අවස්ථාවට ප්‍රධානත්වය දැරීය.





221 වන පාබල බලසේනා මූලස්ථානයේ රාජකාරි නියුතු සියලුදෙනාගේ පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම වෙනුවෙන් ඉදිකරනු ලැබූ ජල පිරිපහදු යන්ත්‍රයක් එම බලසේනාවේ කාර්ය නියුක්ත බලසේනාධිපති කර්නල් ඊඩබ්ලිව්ආර්එස්බී ඇහැලේපොල යූඑස්පී යූඑස්ඒසීජීඑස්සී ගේ සුරතින් 2025 පෙබරවාරි මස 12 වන දින විවෘත කෙරිණ.

# රණවිරු අභිප්‍රේරණය වෙනුවෙන් දේශන මාලාවක්


55 වන පාබල සේනාංකයේ දී


ඉරණමඩු 1 බලකායේ දී


22 වන පාබල සේනාංකයේදී

යුද්ධ හමුදා ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂගේ උපදෙස් හා මගපෙන්වීම මත රණවිරු අභිප්‍රේරණය වෙනුවෙන් සංවිධානය කෙරෙන දේශන මාලාවේ තවත් අදියර කිහිපයක් ඉකුත් පෙබරවාරි මස අවසන් සති දෙක පුරාවට දිවයිනේ ප්‍රදේශ කිහිපයක යුද්ධ හමුදා අංශ ආයතන රැසක දී පැවැත්විණ. ඒ යටතේ ත්‍රිකුණාමලය 22 වන පාබල සේනාංකය හා හකාස අණසක පුහුණු පාසල, ඉරණමඩු 1 බලකාය, මුරුක්කණ්ඩි කෘෂිකර්ම හා පශු සම්පත් පුහුණු පාසල, කිලිනොච්චිය 55 වන පාබල සේනාංකය යන ස්ථානවල දී එම දේශන පැවැත්විණ.

එහිදී, යුදබිමේ මතක හා අත්දැකීම් ඇසුරින් රණවිරුවන්ගේ ඉවසීම, දරාගැනීම, කැපකිරීම් මෙන්ම 30 වසරක යුද්ධයේ සන්ධිස්ථාන පිළිබඳ නව පරපුර දැනුම්වත් කිරීමත් යුද අත්දැකීම් සහිතවූවන් තුළ අභිමානයක් ඇතිකරලීමත් පිණිස වූ "යුද සාහිත්‍යය තුළින් රණවිරු අභිප්‍රේරණය" දේශනය ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් සිදුකරන ලදී. තවද, හමුදා සාමාජිකයින්ගේ සමාජ මාධ්‍ය භාවිතය, ආර්ථික කළමනාකරණය, නීතිවිරෝධී ක්‍රියාවලට සම්බන්ධවීම ආදී කරුණු අලලා "අභිමානවත් සොල්දාදුවා" යන මැයෙන් වූ දේශනය ජනමාධ්‍ය සහ මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු මේජර් එම්අයි මරික්කාර් විසින් සිදුකරන ලදී.

**යුද්ධය අවසන්ව 16 වසක් ගෙවෙන වර්තමානයේ ඒ පිළිබඳ බොහෝ මතක හමුදා සේවයේ නිරත අයවළුන් අතින් මෙන්ම සිවිල් සමාජයේ වැඩි දෙනෙකු අතින් ගිලිහී හමාරය. සමස්තයක් ලෙස මෙම පාර්ශ්ව දෙකෙහිම අලුත් පරම්පරාව ඒ පිළිබඳ දන්නේම නැති තරම්ය. සැබැවින්ම යුද්ධය යනු යළි යළි කතා නොකළ යුතු, හාරා නොබැලිය යුතු නීරස මාතෘකාවකි. නමුත් යුද්ධය එසේ වුවද, ඊට සෘජුව හා වක්‍රව මැදිව තම වටිනා ජීවිත අහිමි කරගත් අබාධිත, තුවාල ලැබූ නොඑසේ නම්, අවසන් විජයග්‍රහණය තෙක් සක්‍රියව දායක වූ පිරිස සිදුකළ අසීමිත කැපකිරීම හා පරිත්‍යාගය පිළිබඳ අපට කතා නොකර සිටිය නොහැක. මන්දයත් අදටද ඔබ, අප නිදහසේ පය ගසන්නේ එදවස ඔවුන් නිදොස් කොට නිදහස් කරදුන් මෙබිමේම වන හෙයිනි.**


ත්‍රිකුණාමලය හටකාර්ය සම්පාදන පුහුණු පාසලේදී

# අංගම්පොර පුහුණු වැඩසටහනක්







59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ මගපෙන්වීම මත එම සේනාංකය වෙතින් සංවිධානය කළ අංගම්පොර පුහුණු වැඩසටහනක් ඉකුත් පෙබරවාරි මස 15 සිට 28 වන දින දක්වා 6 බළඇණිය ගැමුණු හේවා බලකා මූලස්ථානයේ දී පැවැත්විණ. යුද්ධ හමුදා සාමාජිකයෝ 90 දෙනෙක්ගේ සහභාගීත්වයෙන් පැවති මෙම පුහුණු වැඩසටහන මගින් භටපිරිස්හි සටන් කුසලතා වැඩිදියුණු කිරීම අරමුණයි. යුද්ධ හමුදා අංගම්පොර කණ්ඩායමේ දක්ෂ උපදේශකයින් 10 දෙනකුගේ ප්‍රධානත්වයෙන් මෙම පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබූහ.

# රණවිරු කඩදාසි ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය නිරීක්ෂණය කරමින්






ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය යටතේ පාන්ගොල්ල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන කඩදාසි ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියේ නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳව සොයාබැලීම සඳහා 2025 පෙබරවාරි මස 06 වන දින එම ඒකක සභාපතිනි ස්වේන්දිනී දිසානායක මහත්මිය නිරීක්ෂණ චාරිකාවක නිරත වූවාය. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී ද ඊට එක්විය.



එහිදී, රණවිරු කඩදාසි ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය යටතේ සිදුකරනු ලබන විවිධ නිෂ්පාදනයන්හි නිෂ්පාදන ක්‍රියාවලිය සජීවීව නිරීක්ෂණය කළ එම දෙපල එහි අභිවෘද්ධිය උදෙසා අවැසි ඉදිරි කටයුතු පිළිබඳ සොයා බැලූහ. එමෙන්ම, එම ව්‍යාපෘතිය යටතේ රාජකාරී නියුතු සෙබළ, සෙබළියන්ගේ නේවාසික පහසුකම් ද නිරීක්ෂණය කළ ඔවුන් විසින් එහි සාමාජිකයින්ගේ පරිහරණය සඳහා පෙරනිමි ගොඩනැගිල්ලක් ඉදිකරදීමට අවැසි උපදෙස් ද ලබාදෙන ලදී.

# විරු කැකුළු දූ දරුවන්ගේ කලා මංගල්‍යය





මින්නේරිය විරු කැකුළු පෙර පාසලේ වර්ෂ අවසාන විවිධ ප්‍රසංගය එහි කළමනාකාරීත්වය භාර යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සාමාජිකා නිර්මලී විජේකෝන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජනවාරි මස 24 වන දින පැවැත්විණ. කාලතුවක්කු හමුදා පුහුණු පාසල් ශ්‍රවණාගාරයේ පැවති මෙම විවිධ ප්‍රසංගය සඳහා හටකාර්ය සම්පාදක අණසක (නැගෙනහිර) ආඥාපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්පීඑම්එස්එන් විජේකෝන් එන්ඩීසී ඒඊටීම් ඇතුළු නිලධාරීන්, ගුරුවරු සහ දෙමාපියෝ රැසක් ද සහභාගී වූහ.

# නව ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යයන කාමරය දූ දරුවන්ගේ අයිතියට

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වෙන්ද්‍රිනි දිසානායක මහත්මියගේ මගපෙන්වීමෙන් පනාගොඩ, විරු කැකුළු පෙරපාසලේ දීර්ඝකාලීන අවශ්‍යතාවයක්ව පැවති ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යයන කාමරය අභිනවයෙන් ඉදිකර ඉකුත් පෙබරවාරි මස 17 වන දින විවෘත කෙරිණ. සේවා වනිතා සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරුණු එම කටයුත්තේදී අභිනවයෙන් ඉදිකළ ඉංග්‍රීසි මාධ්‍ය පන්ති කාමරය සඳහා සංකේතාත්මකව ළමුන් ලියාපදිංචි කිරීම ද සිදුවිය. එහිදී එම දරු දැරියන් වෙත කෙටි ආහාර වේලක්ද පිරිනැමුණි. පෙරපාසල සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ පහසුකම් තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා අවැසි කටයුතු පිළිබඳවද සභාපතිනිය එහිදී සොයාබැලුවාය.

තවද, විවිධ අවශ්‍යතාවයන් සඳහා දුර බැහැර ප්‍රදේශවලින් පැමිණෙන රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් වෙනුවෙන් නිවාඩු නිකේතනයක් ඉදිකිරීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙත පරිත්‍යාග කරන ලද පනාගොඩ, රොමියල් මාවතේ පිහිටි නිවස සහ  පනාගොඩ, රූපලාවන්‍යාගාරය නිරීක්ෂණය කිරීම සඳහා ද එතුමිය සහභාගි වූවාය. එම ස්ථානවල සිදුකළ යුතු වැඩිදියුණු කිරීම් සබැඳිව ද එතුමිය විසින් උපදෙස් ලබාදෙන ලදී. මෙම අවස්ථාවට එම විරුකැකුළු පෙරපාසල භාර ජ්‍යෙෂ්ඨ සාමාජිකා සුරංගි අමරපාල මහත්මිය, පෙරපාසල් ගුරු භවතුන් සහ දෙමාපියෝ රැසක් ද එක්වූහ.





# විරු දිවියට සේවාවනිතාවෙන් අත්වැලක්





පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි දර්ශණි යහම්පත් මහත්මියගේ අදහසක් මත එම රෙජිමේන්තුවේ සක්‍රීය සේවයේ නියුතු රණවිරුවන්ගේ ආර්ථික තත්වය ඉහළ නැංවීමේ අරමුණින් ඔවුන් වෙනුවෙන් ස්වයං රැකියා හඳුන්වාදීමේ වැඩසටහනක් ආරම්භ කර ඇත. ඊට සමගාමීව පාබල හමුදා සාමාජිකයින් වෙත කෙසෙල් පැළ බෙදාදීමක් හා එම කෙසෙල් පැළ රෝපණය කිරීම, නඩත්තු කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් හෝමාගම පිහිටි පැළෑටි වෛරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලයේ උපදේශකත්වයෙන් ඉකුත් ජනවාරි මස 30 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී පැවැත්විණ. මෙම අවස්ථාවට සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය ප්‍රධානත්වය දැරුවාය.

# බෙල්ලන්විල රජ මහා විහාරස්ථානයේ පුණ්‍ය කටයුත්තක්




ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කරනු ලැබූ බෝධිපූජා පිංකමක් ඉකුත් ජනවාරි මස 29 වන දින බෙල්ලන්විල රජ මහා විහාරස්ථානයේ දී පැවැත්විණ. ගැමුණු හේවා බලකා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීජේකේ විමලරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ආචාර්ය දිල්රුක්ෂි විමලරත්න මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට එම බලකා සේවා වනිතා ශාඛාවේ හිටපු සභාපතිනියන් සහ සාමාජිකාවන් ද, නිලධාරීහු සහ සෙසුනිලයින් රැසක් ද සහභාගී වූහ.

# විරුවකුට සවියක් - කතුනට දැනුමක්




යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහා සභා රැස්වීම ඉකුත් ජනවාරි මස 25 වන දින එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉරේෂා ප්‍රනාන්දු මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එහිදී, සෙ/100231 ලාන්ස් කෝප්‍රල් අධිකාරි එස්පීකේපී යන කොනොනි හට ආධාර වශයෙන් රුපියල් 50,000.00 ක මූල්‍ය පරිත්‍යාගයක් සිදුකෙරිණ. තවද, ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ යන නිලධාරී විසින් "යුද සාහිත්‍ය තුළින් රණවිරු බිරින්දෑවරුන් අභිප්‍රේරණය" යන මැයෙන් සිදුකළ හරවත් දේශනයක් ද එම වැඩසටහනට ඇතුළත් විය.

# නිවාස සිහිනය සැබෑ කරමින්




අධ්‍යක්ෂක ජෙනරාල් මූල්‍ය කළමනාකරණ හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒඑම්කේජීපීඑස්කේ අබේසිංහ ගේ මගපෙන්වීම යටතේ එම බලකායට අයත් එෆ්/14157 සිවිල් සේවක ඩීජීඑච් උදාන මහතාගේ අර්ධ වශයෙන් නිමකර තිබූ නිවස නැවත පිළිසකර කර ඔහු වෙත භාරදීම ඉකුත් ජනවාරි මස 31 වන දින සිදුකෙරිණ. පොදුසේවා බලකා සේවා වනිතා ශාඛා සභාපතිනි තුෂාරි අබේසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාව සඳහා එම ශාඛා සාමාජිකාවෝ ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# සේවා වනිතාවෙන් මාහැඟි සත්කාරයක්





7 ශ්‍රී ලංකා පොලිස් හේවා බලකායේ අනුග්‍රාහකත්වයෙන් ඉකුත් ජනවාරි මස 23 වන දින කුරුණෑගල, පාන්ගොල්ල අභිමංසල 111 සුවසහන මධ්‍යස්ථානයේ නේවාසික රණවිරුවන් වෙනුවෙන් දිවා ආහාර පිරිනැමීමේ කටයුත්තක් සිදුකෙරිණ. තවද, ඔවුන් වෙත අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබාදීමට ද, ඔවුන්ගේ රසාස්වාදය වෙනුවෙන් සංගීතමය වැඩසටහනක් ද එහිදී පැවැත්විණ. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉරේෂා පෙරේරා මහත්මිය ඇතුළු එහි සාමාජිකාවෝ පිරිසක් සහභාගී වූහ.

# රෙජිමේන්තු සේවා වනිතා නව සභාපතියන්



මහේෂා ආරියසේන මහත්මිය යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස පත්ව ඇත. ඉකුත් පෙබරවාරි මස 10 වන දින එම තනතුරෙහි කටයුතු අරඹමින් කැකිරාව, දඹුලුහල්මිල්ලෑවේ පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී එතුමිය සිය සාමාජිකාවෝ සමඟින් ඉදිරි සුබසාධන වැඩකටයුතු පිළිබඳ සාකච්ඡාවක ද නිරතවූහ.



වින්දා ප්‍රේමරත්න මහත්මිය ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස පත්ව ඇත. එම තනතුරෙහි කටයුතු අරඹමින් සිය සාමාජිකාවෝ සමඟින් එතුමිය ඉකුත් පෙබරවාරි මස 11 වන දින පනාගොඩ පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී ඉදිරි වැඩකටයුතු පිළිබඳ සාකච්ඡාවක ද නිරතවූහ.



ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස ඉඳුනිල් ජයකොඩි මහත්මිය පත්ව ඇත. එහිදී, එතුමිය තනතුරෙහි කටයුතු අරඹමින් ඉකුත් පෙබරවාරි මස 11 වන දින අඹේපුස්ස සිංහ සේවා වනිතා ශාඛා කාර්යාලයේ දී එම සේවා වනිතා සාමාජිකාවෝ සමඟ සාකච්ඡාවක නිරත වූහ.



ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස අයේෂා ලියනගේ මහත්මිය පත්ව ඇත. ඉකුත් ජනවාරි මස 25 වන දින පනාගොඩ පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී එතුමිය තම කටයුතු ඇරඹූ අවස්ථාවට එම සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ රැසක් ද සහභාගී වූහ.

# නිවාස සිහිනයක් සැබෑ කරමින්





ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළු සේවා වනිතා ශාඛාව සහ 4 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුවේ හටපිරිස් එක්ව එම බලමුළුවේ රාජකාරියෙහි නියුතු සාමාන්‍ය සෙබළ කුමාරසිංහ කේජේඩී යන අයගේ අර්ධ වශයෙන් ඉදිකරන ලද නිවසේ ඉතිරි වැඩ නිමකොට ඉකුත් පෙබරවාරි මස 09 වන දින එම පවුලේ සාමාජිකයින් වෙත භාරදෙනු ලැබූහ. ආරක්‍ෂක සේනා නැගෙනහිර ආඥාපති හා ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් පීආර් පතිරවිතාන යූඑස්ඒඩබ්ලිව්සී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සිදුකළ මෙම සත්කාරයට එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි සුමංගලී පතිරවිතාන මහත්මිය ද සහභාගි වූහ. දානපතියන්ගේ මූල්‍යමය දායකත්වයෙන් සිදුකළ මෙම ව්‍යාපෘතියට 4 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුවේ හටපිරිස් ශ්‍රම දායකත්වය ලබාදුන්හ. තවද, එම සේවා වනිතා ශාඛාව වෙතින් එම පවුලේ සාමාජියන් වෙත අත්‍යවශ්‍ය ගෘහ භාණ්ඩ ද පිරිනැමිණ. මෙම අවස්ථාවට එම රෙජිමේන්තුවේ නිලධාරීහු සහ සෙසුනිලයන් සහභාගී වූහ.

# රණවිරු ප්‍රණාම - 2025





සන්නද්ධ බුද්ධි බලකායට අයත් මියගිය රණවිරුවන්ගේ පවුල් 56ක් සඳහා වව්චර්පත් ප්‍රදානය කිරීමේ උත්සවයක් ඉකුත් ජනවාරි මස 25 වන දින බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි හංසිකා මහලේඛම් මහත්මියගේ ප්‍රධානත්වයෙන් කරණ්දෙනියේ පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී පැවැත්විණ. සන්නද්ධ බුද්ධි බලකායේ 32 වන සංවත්සරයට සමගාමීව සිදුකළ එම කටයුත්තේදී රුපියල් 7500.00 බැගින් වූ කීල්ස් වව්චර්පත් ප්‍රදානය කෙරිණ. එම අවස්ථාවට සේවා වනිතා සාමාජිකාවෝ රැසක් එක්ව සිටියහ.

# සිවිල් සේවක මහතකු වෙනුවෙන් නව නිවසක්





4 ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය යටතේ සේවය කරන සිවිල් කාර්ය මණ්ඩල සාමාජිකයකු වන ආර්පීඩී රාජපක්ෂ මහතාට නව නිවසක් ප්‍රදානය කිරීමේ වැඩසටහන ඉකුත් ජනවාරි මස 30 වන දින යුද්ධ හමුදා සේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒකේ රාජපක්‍ෂ ආර්එස්පී සහ එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනී චන්ද්‍රි රාජපක්ෂ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහි ඉදිකිරීම් කටයුතු 4 යුද්ධ හමුදා සේවා බලකා අණදෙන නිලධාරී මේජර් එච්බීඑම්ඩබ්එස්ඒබී මහගෙදර එල්එස්සී ගේ අධීක්‍ෂණයෙන් එම බලකායේ සහ 3 ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ හටපිරිස් එකතුව සිදුකරනු ලැබීය. මේ සඳහා රුපියල් 586,295.00 ක මූල්‍ය දායකත්වය නිර්මල ජයරත්න මහත්මා සහ ප්‍රියංගා අමරසිරි මහත්මිය විසින් ලබාදෙනු ලැබූහ.

# සොබා සිතුවිලි



## අතීත මතකයන් ආවර්ජනය...

තල් අරණේ ජීවිතයට
පුංචි දරුවකු ලෙසින්
හැදී වැඩුණු බිම
රුදුරු මතකයන් සමග
සමුගෙන ගියා මීට වසර
සොළොසකට පෙර...

එදා මේ භූමියේ ළදරුවකු
නවකයෙකි යුද බිමට
අතීත ආවර්ජනය සිදුවන විට මේ බිම
සිහිනයක් සේ දැනෙයි අද දකිනවිට

එදා පිළිසකර කර හැදූ මාවත්
මතකයට නැගෙනවිට
සිතට ආඩම්බරයක් දැනේ
නොදැනුවත්වම...

අද ඇවිද යම් වැඩිහිටියකුව
ඒ මාවතේ නිරතුරුව
දිරි දෙන්න හැකිවීම ඒ බිම තුළම සිට
දයාබර විරු කැලට
සත්තමයි ආඩම්බරයි සිහිකරන විට ඒ අතීතය...

සෙ/242018
බනි 1 කේවම්වස්සේ කරුණාරත්න යූවස්පී
1 කාඹුරෙ ශ්‍රීලංඉ

## වැළලුණු මතක...

එක් වූ තැන් මතක
හැරදා දුව ආවද
නොමියුණු ඒ මතක
රාත්‍රිය පහන්වන තුරු
දිවා රෑ බලාපොරොත්තුව අද්දර
ජීවිතය යදී...
ඉතින් කුමක් නම්
මා කරම්ද?
මා හැරදා ඔහු තුටින් නම්
කුමට මා ලතව ඉකිබිඳිම්ද?
ඉඳින් ආදරය කරන්නට
මසිතට බලකෙරූ මා
දැන් කෙසේ නම් වෛර කරම්ද?

කපිතාන් කේව්වම් ලක්මාලි
රෙම ශ්‍රීලයුපොදුසේබ
ජනමාධ්‍ය හා මව්මෙඅම

## පාසල් ප්‍රේමය...



හංගගෙන පොත් අස්සෙ රතු රෝස පෙති මලක්
නුඹ ගෙනත් දුන්න මට තවම මතකයි අදත්
ඩෙස් බංකු හැඩ කරපු අපේ ආදර කවක්
මතක් වෙද්දිත් හිතේ සතුට සම මහමෙරක්

පිටු ගණන් පිරෙන්නට සෙනෙහෙ කොල නුඹ දීපු
තවම තියෙනව ගෙදර මම පරිස්සම් කරපු
ඔය දෑස දැකගන්න වරු ගණන් කල් ඇරපු
සුන්දරයි ඒ කාලෙ හීන නම් අපි දැකපු

මග හැරුණ පෙම් හීන තක්සලාවෙන් එද්දි
එකතු වුනි මතකයට හිත් රිදුම් ඇති වෙද්දි
අහම්බෙන් මගතොටක මූණටම හමුවෙද්දි
හිතුණෙ හරි හැඩයි නුඹ එදාමෙන් හිනැහෙද්දි

සාසෙ හේරත් එම්වම්පීපීකේ
3(සෙව) ශ්‍රීලයුකාපබ

## පිය සෙනෙහස...

දෑසින් බොහෝ කියන
හිසින් බොහෝ බර උසුලන
හදවතින් ආදරය කරන
සිහිනෙන් දරුවන් සිඹින
නිහඬ දිය උල්පතකි
කිසිදා නොසිඳෙන

ලා/කෝ සිරිවර්ධන එස්වල්ව්
8 ගැහේබ

## හඳහන්...

මතක් කර කර ලස්සනම තැන්
කොච්චරක් නම් හිනැහුනිද මං
ගෙවුණු තත්පර අපිට හොරැහින්
කෙරුවෙ ඇයි අද අපි අතරමං

නුඹට වාගෙම මටත් තිබුණා
හෙටක් ගැන ලොකු හීනයක්
ඒ හීනෙ උඹ එක්ක දැක්කම
හිතන්නත් බැරි ලස්සනක්

අහසෙ පාවෙන තාරකාවල
ලියවිලා තිබු හුගක් තැන්
උඹව අරගෙන මගෙන් ගිය හැටි
තාම මතකයි රත්තරන්

ලා/කෝ මල්වත්තගේ එම්වයිපීවන්පීකේ
3(සෙව) ශ්‍රීලයුකාපබ





# CLEAN SRI LANKA

SOCIALLY . ENVIRONMENTALLY . ETHICALLY

### පිරිසිදු ශ්‍රී ලංකාව: හරිත අනාගතයක් සඳහා දැක්මක් "Keep Singapore Clean" මගින් ආභාෂය ලබා ඇත.




▪ කපිතාන්
එච්පීජී
හවන්ති
1 ශ්‍රීලලකාබ


සෞඛ්‍ය සම්පන්න සහ තිරසාර අනාගතයක් සඳහා පිරිසිදු හා හරිත පරිසරයක් අත්‍යවශ්‍ය වේ. වර්තමානය වනවිට ශ්‍රී ලංකාව පිරිසිදුකමේ සහ පරිසර සංරක්ෂණයේ වැදගත්කම හඳුනාගෙන ඇති අතර, එමගින් රට පිරිසිදු කිරීම අරමුණු කරගත් මුලපිරීම්වලට මග පාදයි. දශක ගණනාවකට පෙර "Keep Singapore Clean" ව්‍යාපෘතිය දියත් කළ සිංගප්පූරුවෙන් එවැනි ආශ්වාදජනක උදාහරණ බොහොමයක් දක්නට ලැබේ. සිංගප්පූරුවේ සාර්ථකත්වය ඉගෙන ගනිමින්, ශ්‍රී ලංකාවට පිරිසිදු හා සෞඛ්‍ය සම්පන්න ජාතියක් නිර්මාණය කිරීම සඳහා සමාන උපාය මාර්ග අනුගමනය කළ හැකිය.

"Keep Sɰngapore Clean" හි ඓතිහාසික පසුබිම

"Keep Singapore Clean" ව්‍යාපාරය 1968 දී එවකට අගමැති ලී ක්වාන් යූ විසින් දියත් කරන ලදී. සිංගප්පූරුව බරපතල අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලු, දූෂණය සහ අපිරිසිදු ජීවන තත්වයන්ට මුහුණ දුන්නේය. රජය දැඩි නීති, මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් සහ කාර්යක්ෂම අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධති හඳුන්වා දුන්නේය. වසර ගණනාවක් පුරා, මෙම උත්සාහයන් සිංගප්පූරුව ලෝකයේ පිරිසිදුම රටවල්වලින් එකක් බවට පරිවර්තනය කළේය.

මෙම ව්‍යාපාරයේ සාර්ථකත්වය පදනම් වූයේ:

**දැඩි රෙගුලාසි:** කසළ දැමීම සහ පරිසර දූෂණය සඳහා දඩ මුදල්.

මහජන දැනුවත්භාවය: පිරිසිදුකම සහ පුද්ගලික වගකීම පිළිබඳව පුරවැසියන් දැනුවත් කිරීම.

කාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණය: විධිමත් ප්‍රතිචක්‍රීකරණය සහ බැහැර කිරීමේ පද්ධති.

**ප්‍රජා සහභාගීත්වය:** පිරිසිදුකම පවත්වා ගැනීම ගැන ආත්ම තෘප්තියක් ඇති වීමට පුරවැසියන් දිරිමත් කිරීම.

"Clean Sri Lanka" සංකල්පය

සිංගප්පූරුවේ සාර්ථකත්වයෙන් ආභාෂය ලැබූ "Clean Sri Lanka" යනු ශ්‍රී ලංකාව පිරිසිදු හා තිරසාර රටක් බවට පත් කිරීම අරමුණු කරගත් සංකල්පයකි. එහි අන්තර්ගත ස්වභාවික සුන්දරත්වය සමගින්, ශ්‍රී ලංකාවට ආසියාවේ පිරිසිදුම ජාතීන්ගෙන් එකක් වීමට හැකියාව ඇත. නමුත්, නුසුදුසු අපද්‍රව්‍ය බැහැර කිරීම, දූෂණය සහ මහජන දැනුම්වත්භාවය නොමැතිකම වැනි අභියෝගවලට විසඳුම් සෙවිය යුතුය.

### පිරිසිදු ශ්‍රී ලංකාවක් සඳහා ප්‍රධාන උපාය මාර්ග

1. ශක්තිමත් පාරිසරික නීති පද්ධතියක් ඇති කිරීම සහ එය බලාත්මක කිරීම.

- කසළ දැමීම, නීති විරෝධී ලෙස බැහැර කිරීම සහ දූෂණය සඳහා නව ක්‍රමවේද හඳුන්වා දීම.
- නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල අපද්‍රව්‍ය කළමනාකරණ නීති නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.

2. මහජන දැනුම්වත්භාවය සහ අධ්‍යාපනය

- පිරිසිදුකමේ වැදගත්කම ඉගැන්වීම සඳහා පාසල් සහ ප්‍රජා වැඩසටහන් දියත් කිරීම.
- පවිත්‍රතා ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා සමාජ මාධ්‍ය, රූපවාහිනිය සහ පුවත්පත් භාවිතා කිරීම.

3. කාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති

- අපද්‍රව්‍ය වෙන් කිරීම ප්‍රවර්ධනය කිරීම (ප්‍රතිචක්‍රීකරණය කළ හැකි, කාබනික සහ ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය වෙන් කිරීම).
- රට පුරා කසළ එකතු කිරීමේ සහ ප්‍රතිචක්‍රීකරණ පහසුකම් වැඩි දියුණු කිරීම.

4. ප්‍රජා සහභාගීත්වය දිරිමත් කිරීම

- පාසල්, සේවා ස්ථාන සහ අසල්වැසි ප්‍රදේශවල සමූහ පිරිසිදු කිරීමේ ව්‍යාපාර සංවිධානය කිරීම.
- පොදු ස්ථාන පිරිසිදුව තබා ගැනීම සඳහා වගකීම භාර ගැනීමට පුරවැසියන් පෙළඹවීම.

5. තිරසාර නාගරික සැලසුම්කරණය

- ප්‍රතිචක්‍රීකරණ බඳුන්, කොම්පෝස්ට් කරන ප්‍රදේශ සහ අපද්‍රව්‍ය පිරිපහදු මධ්‍යස්ථාන වැනි පරිසර හිතකාමී යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ප්ලාස්ටික් භාවිතය අඩු කර ජෛව හායනයට (Biodegradable) ලක්විය හැකි විකල්ප ප්‍රවර්ධනය කිරීම.

6. සංචාරක ව්‍යාපාරය සහ පිරිසිදුකම

පාරිසරික සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කර සංචාරක ආකර්ෂණයන් පිරිසිදුව පවතින රටක් බව සහතික කිරීම.

වෙරළබඩ ප්‍රදේශ දූෂණයෙන් ආරක්ෂා කිරීම සඳහා "පිරිසිදු වෙරළ" මුලපිරීමක් ක්‍රියාත්මක කිරීම.

**අභියෝග සහ ඉදිරි ගමන්මඟ**

"Clean Sri Lanka" ව්‍යාපෘතිය තුළදී අභියෝග කිහිපයක් විසඳිය යුතුය:

අපද්‍රව්‍ය බැහැර කිරීමේදී මහජන විනයක් නොමැතිකම.

සමහර කලාපවල ප්‍රමාණවත් අපද්‍රව්‍ය කළමනාකරණ යටිතල පහසුකම් නොමැතිකම.


කලාන්තරයක් පුරාවට පැවත එන මිනිසුන්ගේ නොගැලපෙන ආකල්ප

මෙම අභියෝගයන් ජය ගැනීම සඳහා රජය, පෞද්ගලික අංශය සහ පුරවැසියන් එක්ව කටයුතු කළ යුතුය. සිංගප්පූරුවේ අත්දැකීම් වලින් ඉගෙන ගනිමින්, නීති ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය අධ්‍යාපනය සහ කාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණය ඒකාබද්ධ කිරීමෙන් ශ්‍රී ලංකාවට දිගුකාලීන සාර්ථකත්වයක් අත්කර ගත හැකිය.

පිරිසිදු හා හරිත ශ්‍රී ලංකාවක් පිළිබඳ සිහිනය සාක්ෂාත් කර ගැනීමට නම් සිංගප්පූරුවේ " Keep Singapore Clean" මාර්ගෝපදේශයන් ලබාගනිමින් ශ්‍රී ලංකාවට අනාගත පරම්පරාවන් සඳහා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් නිර්මාණය කළ හැකිය. පිරිසිදුකම රජයේ වගකීමක් පමණක් නොවේ. එය සෑම පුරවැසියකුගේම යුතුකමකි. දැනුම්වත්භාවය, විනය සහ සාමූහික උත්සාහය තුළින්, ශ්‍රී ලංකාවට දකුණු ආසියාවේ පිරිසිදුකම සඳහා ආදර්ශමත් ජාතියක් බවට පරිවර්තනය විය හැකිය.







හෙළයන්ගේ වීරත්වය ලොවට
පසක් කරනා බොහෝ සිදුවීම්
ලක් ඉතිහාසය පුරාවටම
දැකගත හැකිය. විවිධ
කාලවලදී ලක්දිවට එල්ල වූ
අනේකවිධ ආක්‍රමණයන්ට
එරෙහිව සාර්ථකව සටන් වැදූ,
එකී සියලු අවස්ථාවන්හිදී
ආක්‍රමණිකයන් සම්පූර්ණයෙන්
පරදවා මාතෘ භූමියෙන්
පලවා හැරීමට ඔවුනු සමත්
වූහ. එපමණක් ද නොව,
දේශපාලනික ස්ථාවරත්වය,
අභිමානය වෙනුවෙන් අන්
දේශයන්හි සීමා අතික්‍රමණය
කරමින් හෙළයන් පෑ
වීරත්වය, සටන්කාමීත්වය,
ප්‍රෞඪත්වය ලොවට මොනවට
පසක් විය.

කාලයේ වැලිතලාවෙන් වැසීගිය

# හෙළයින්ගේ වීරත්වය

## 2 කොටස




▪ රාධිකා සීවලී

*Ambassador of Education (Spelizes in Translation) Sworn Translator, language Facilitator, Justice of Peace (WI)*


ගජබාහු රජු (ක්‍රි.ව.1වන සියවස - අනුරාධපුර යුගය ) නම් අභීත සේනාධිපති නීල මහා යෝධයා සහ රාජකීය සේනාව සමඟ චෝල දේශය ආක්‍රමණය කිරීම තුළින් පූර්වයෙහි ආදිත්‍ය කරිකාලන් නමැති චෝල කුමරුන් විසින් තම රටින් පැහැරගෙන ගිය දොළොස්දහසක් වූ සිරකරුවන් වෙනුවට ඉන් දෙගුණයක් ලක්දිවට ගෙන ඒම ඉතිහාසයේ  වර්ණනා කර ඇත. මෙම වික්‍රමාන්විත ක්‍රියාන්විතයේ ඓතිහාසිකත්වය පිළිබඳ ආනුභූතික සාක්ෂි සපයන දෙමළ මහා කාව්‍යයන් වන "සිලප්පදිකාරම්" හා මණිමේඛලෙ යන විදේශ ග්‍රන්ථයන් හිදී ද ලංකාවේ "කයවාහු" (බොහෝ දුරට මේ සිදුවන්නට ඇත්තේ සිංහල ජ අක්ෂර වෙනුවට නිශ්චිත අක්ෂර රූපයක් ද්‍රාවිඩ වර්ණ මාලාවන්හි නොමැතිවීම නිසාය) නමැති රජු චේර දේශයේ පත්තිනි පූජා උත්සවයකට සහභාගී වීම පිළිබඳව සඳහන් වීම තුළින් මේ කරුණේ සත්‍යතාවය තවදුරටත් තහවුරු වේ.

දෙවෙනි සේන රජු "කුන්ථක" යන සෙන්පති යටතේ සේනාවක් ගෙන පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණයේ දී සිංහල සේනාවේ ප්‍රහාරය හමුවේ පරාජයට පත්වන ශ්‍රී මාර ශ්‍රී වල්ලභ සියදිවි හානිකර ගැනීමටත්, පාණ්ඩ්‍ය රජු ලෙස වරගුණවර්මන් අභිෂේක කිරීමට සහ පළවෙනි සේන රජුන්ගේ පාලන කාලසීමාවේදී ලක්දිවෙන් පැහැරගත් වස්තූන් ලංකාවට ගෙන ඒමත්, කාශ්‍යප රජුගේ යටතේ "සක්ක" නමැති සෙන්පති යටතේ සේනාවක් චෝල දේශය ආක්‍රමණය කිරීමත්, උදය රජු විසින් "විදුරංග" නම් සේනාධිපති මගින් චෝල දේශය ආක්‍රමණය කිරීමත්, එම වීර කතාවලියටම ඇතුළත් කළ හැකිය.

චෝලයින්ගෙන් රට මුදවාගත් පළමුවන විජයබාහු රජු.

"හැකි නම් සේනාවන්ගෙන් තොරව මුහුද මැදදී බාහුබල ද්වන්ද්ව සටනකට එන ලෙස තොපගේ රජුට අභියෝග කරන බව කියව. නොඑසේනම්, සේනා වාහන සහිතව තොපගේ හෝ අප රටේ කැමති තැනක සටනට සූදානම් වන ලෙස දන්වව්. තොපගේ රජුට මෙයින් තමා අභිමත ක්‍රමයක් තෝරාගෙන දන්වන ලෙස කියව්" යැයි නිර්භීතව නරසිංහයකු සේ චෝලයින් හට අභියෝග කළේය.

පළමුවෙනි මහා පරාක්‍රමබාහු රජු අලවංසිතු රජුගේ පාලනයට නතු අරමණ දේශය (වර්තමාන මියන්මාර

දේශය) ආක්‍රමණය කිරීම හා පරාක්‍රම පාණ්ඩ්‍ය හට උපකාර කරනු වස් චෝළ පාණ්ඩ්‍ය යන දේශයන් ආක්‍රමණය කිරීම නිශ්ශංකමල්ල රජු රාමේශ්වරම් ආක්‍රමණය කිරීම හයවෙනි පරාක්‍රමබාහු විජයනගර් අධිරාජ්‍යයේ තොටුපොළක් ආක්‍රමණය කිරීම හා වෙළඳ ගනුදෙනුවක් මුල් කරගෙන දකුණු ඉන්දියාවේ අදිවිරරාම පටුන ආක්‍රමණය කිරීම යනාදී විදේශ ආක්‍රමණ තුළින් එදා ලක්දිව වැසි හෙළයින්ගේ වීරත්වයම ප්‍රකට විය.

අපි මේ ලිපිය තුළින් මෙහිලා හෙළයන් සතුව වෘත්තීමය වශයෙන් සංවිධානය වූ නිත්‍ය හමුදාවක් තිබුණු වග මනාව ස්ඵුට වේ.

මෙහිලා ඉතිහාසඥයින්ගේ අවධානය යොමුවන සුවිශේෂී ආක්‍රමණයක් වේ. එය ඉහත සඳහන් කළ පළමුවෙනි පරාක්‍රමබාහු රජුගේ ආඥාවට අනුව ලංකාපුරදේව නම් සෙන්පති යටතේ දකුණු ඉන්දියාව ආක්‍රමණය කිරීම වේ. මේ ආක්‍රමණය පිළිබඳව දෙරටේ මූලාග්‍ර පරස්පර වීම ලක්රජුගේ නාමයෙන් විදේශයක නගරයක් නම්කිරීම විදේශයකදී ලක්දිව කාසි නිශ්පාදනය කිරීම එක් සතුරකුට සීමා නොවී පාණ්ඩ්‍ය චෝළ හා චේර රට යනාදී සතුරන් ගණනාවක් හෙළයන් විසින් පරාජයට පත්කිරීම යනාදී කරුණු මෙම ආක්‍රමණයේ සුවිශේෂී කරුණු වේ. අප මේ ලිපි මාලාව තුළින් ලක්දිවේ නාමය බබළවූ ඒ ආක්‍රමණයන් පිළිබඳව සාකච්ඡා කරමු

දකුණු ඉන්දිය චේර චෝළ පාණ්ඩ්‍යයන් අතුරෙහි නිරතුරුව සිදුවූ බල පොරයෙහි චෝළ පරාන්තක රජු (ක්‍රි : ව 9 සියවසේ දී) යටතේ චෝළ දේශය අධිරාජ්‍යයක් වීමට මුල පිරූ අතර එය රාජ රාජ චෝළ හා රාජේන්ද්‍ර චෝළ යන පියපුතු දෙපළ යටතේ (985-1014) අධිරාජ්‍යයක් දක්වා ව්‍යාප්ත කෙරුණි. එම චෝළ අධිරාජ්‍යය ක්‍රි:ව 12 සියවස වන විටත් කෙමෙන් කෙමෙන් බිඳවැටීමට පටන්ගෙන තිබුණි.

මේ සන්දර්භය තුළ ක්‍රි:ව 1170 - 71 කාලවකවානුවේ දී දකුණු දඹදිව මදුරාව අගනුවර කරගත් සැලකිය යුතු භූමි ප්‍රමාණයක් එකල පාණ්ඩ්‍යයන් සතුවිය. එනමුත්, එකල එහි සිහසුන උදෙසා පාණ්ඩ්‍ය වංශික සහෝදර දෙපළක් අතර තියුණු බල අරගලයක් නිර්මාණය වෙමින් පැවතිණ. සිහසුන හිමි පරාක්‍රම පාණ්ඩ්‍යට විරුද්ධව ඔහුගේ සොහොයුරු කුලසේකර පාණ්ඩ්‍ය මදුරා නුවර ආක්‍රමණය කරලීමට මහා සේනා සමග සැරසුණේය. පාණ්ඩ්‍ය රටේ බලය තමන් සතු වූ නමුත්, කුලසේකර පාණ්ඩ්‍යගේ සේනාව බලවත් බැවින් එම ආක්‍රමණයෙන් කොයි මොහොතක හෝ තම බලය අහිමි වේයැයි බියෙන් සලිත වූ පරාක්‍රම පාණ්ඩ්‍ය කුමරු තම අත්‍යන්ත මිත්‍ර වූ ලක්දිව පාලක ත්‍රිසිංහලධීස්වර මහා පරාක්‍රමබාහු රජුගෙන් උපකාර පැතුවේය.

පැරකුම්බා රජු පරාක්‍රම පාණ්ඩ්‍ය කුමරු හට උපකාර කිරීමට පෙළඹුනේය. ඒ අනුව ලංකාපුර නම් සෙනෙවි තමා යටතේ හමුදාවන් සූදානම් කොට මහාතිත්ථ වරායෙන් නැව්නැගීම පිණිස රැස්ව සිටියේය. එවේලෙහි ලංකාවට දකුණු ඉන්දියාවෙන් පුවතක් ලැබුණි. එනම්, "පරාක්‍රම පාණ්ඩ්‍යයන් සටනින් අන්ත පරාජයට පත් විය. කුලසේකරයන් විසින් පරාක්‍රම පාණ්ඩ්‍යයන් ඇතුලු ඔහුගේ පවුලේ අයවළුන් අත්අඩංගුවට ගෙන ඝාතනය කොට, මධුරාවේ සිහසුන තමන් සතු කර ගත්තේය" යනුවෙන් එහි සඳහන් විය. තම රැකවරණය පැතූ අසරණ රජු. තමන්ගේ උපකාර ලැබීමට ද පෙර මියයාම පරාක්‍රමබාහු රජතුමාගේ සන්තානය තුළ මහත් කම්පනයක් ඇති කළේය. එයට නිසි පිළිතුරු දීමට සිතූ රජු, කුලසේකරයින් සිහසුනෙන් නෙරපා පරාක්‍රම පාණ්ඩ්‍යගේ දරුවකු හෝ හිතමිත්‍රයකුට හෝ රාජ්‍ය ලබාදීම අරමුණ කොට තම සේනාවට මධුරාවට යෑමට අණකළේය.

## ලංකාපුර ප්‍රමුඛ සේනාව

ලංකාපුර යනු ලංකාධිනාථ හෙවත් ලංකානාථ කිත්ති යන සෙන්පතියාගේ පුතෙකි. මොහු ලංකාපුර කිත්ති යන නාමයක් තිබුණ බැව් විශ්වාස කෙරේ. දකුණු ඉන්දිය සෙල්ලිපිවල දණ්ඩනායක ලංකාපුරි යනුවෙන් හඳුන්වා ඇති ඔහුට මේ ආක්‍රමණය උදෙසා ගෝකණ්ණ, කේසධාතු කිත්ති, කේසධාතු ලෝක, ලංකාගිරි සොර, ලංකාපුර දේව හා ජගත්විජය ආදී ප්‍රධාන සෙන්පතිවරු සහභාගී වූ බව සටහන් වේ.

**ගෝකණ්ණ** - සෙන්පති ලංකාපුර යටතේ සේවය කළ සේනාපතියෙකි

**කේසධාතු කිත්ති** - මොහු හොඳම සේනාපතියන් දෙදෙනාගෙන් එක් අයෙකි

**කේසධාතු ලෝක** - සෙන්පති ලංකාපුර යටතේ මොහු අණදෙන නිලධාරියා ලෙස සේවය කළ අතර, හොඳම සේනාපතියන් දෙදෙනාගෙන් එක් අයෙකි

**ලංකාපුර දේව** - දමිළාධිකාරි රක්ඛ යටතේ හම්බන්තොට ප්‍රදේශයේ සේවය කළ මොහු ලංකාපුර යටතේ මෙම සටනේ සේනාංකයක් මෙහෙය විය

**ලංකාගිරි සොර** - සෙන්පතියෙකි

**ජගත්විජය** - දකුණු ඉන්දිය සෙල්ලිපිවල නම් සඳහන් අනෙකුත් සේනාපති වනුයේ ජගත්විජය යි. මෙම ආක්‍රමණයේදී සෙන්පති ලංකාපුර යටතේ සේවය කළ මොහු නියෝජ්‍ය අණදෙන නිලධාරියා ය. දණ්ඩනායක ජයද්රථ හෙවත් ජයත්‍රය ලෙස චෝළ සෙල්ලිපිවල මොහු හඳුන්වා ඇත.

මෙය සිදුවූ කාලවකවානුව පළමුවන පරාක්‍රමබාහු රජුගේ 14 වනි රාජ වර්ෂය වූ 1169 වර්ෂයේදී බවට කරුණු වැඩි වශයෙන් තිබේ. මෙය සැබැවින්ම පරාක්‍රමබාහු රජුගේ රාජත්වයට වසර 83 කට පෙර එනම් 1070 කාලයේදී චෝලයෝ ලක්දිවට එරෙහිව සිදුකල ආක්‍රමණයට ප්‍රතිපිළිතුර දීමකැයි කිව හැක. කුලසේකර පාණ්ඩ්‍ය කුමරු චෝලයින්ගේ උදවු ඉල්ලා සිටි අතර පරාක්‍රම පාණ්ඩ්‍ය රජු ලක්දිව රජුගෙන් උදවු ඉල්ලා සිටියේය. මේ යුද්ධය චෝල හා සිංහල රාජ්‍ය අතර පැවැති පැරණි අරගලයේම තවත් දිගුවක් බවට නොබෝ කලකින් පෙරලුනේය.

ලංකාපුර තම සේනාව සමග මහාතිත්ථයෙන් නැව් නැග්ගේ ය. දවසක් ඇතුළත මුහුදෙන් එගොඩවී නැව්වලින් කුඩා ඔරුවලට නැග පාණ්ඩ්‍ය සේනාවන්ගේ සේනාවන් වෙත විරෝධාරව පහර දී එම දේශයේ තලපිල්හි ගොඩබැස. දුර සිටම සතුරු සේනා නිරීක්ෂණය කොට තම නැව් ගැඹුරු මුහුදේ නවත්වා සේනාව යැවීම සඳහා ඔරු යොදාගත් බව සඳහන් වේ. මෙම පුවතට අනුව අනතුරක දී හෝ එවැනි අවස්ථාවකදී හෝ ප්‍රයෝජනයට ගැනීම සඳහා ජීවිතාරක්ෂක ඔරු නැව්වල සිය ගණනින් රඳවා තිබූ බව හැඟවේ. සද්ධර්මරත්නාකරයෙහි "ජය විරිදුලා සිටිත නව ලක්ෂ පසානුදහසක් නැවැනි මහ සෙනග" යනුවෙන් සඳහන් වීම තුළින් මෙය අවබෝධ කළ හැකිය. ක්‍රිෂ්ණසාමි අයියන්ගාර් පවසන පරිදි තලපිල් යනු වත්මන් පුලියඩිසාලේ (රාමේස්වරම්) වේ. අනතුරුව රට අභ්‍යන්තරයට සෙන්පති ලංකාපුර තම සේනාව සමග ගමන් කිරීමට පටන්ගත්තේය.




මේජර් ධම්මික කාංචන
නිලධාරි අණදෙන
බී කණ්ඩායම
3(සෙච) විහාරෙ

තලපිල් සිට සැතපුම් 08ක දුරින් පිහිටි කුණ්ඩුගල් ප්‍රදේශයට පැමිණි ඔහු එහි බලකොටුවක් තැනවීය. එම බලකොටුව දඬගලින් කළ පවුරු 3කින් ද දොරටු 12කින් හා මධ්‍යයේ චතුශ්ශාලාවකින් ද සමන්විත වූ බව සඳහන් වේ. ඒ අතරතුර, කුලසේකර හමුදාවන්ගේ බලවත් ප්‍රහාර බලකොටුව වෙත එල්ල වුවත් ඒ සියල්ල සාර්ථක ලෙස මැඩපවත්වමින් එම ප්‍රදේශ යටත් කරගැනීමට සමත්විය. එපමණකින් නොනැවතුණු හෙතෙම එම ප්‍රදේශය තම රජුන්ගේ නාමයෙන් එනම් පරාක්‍රම පුරය ලෙසින් හැඳින්වූයේය. මේ සටනේදීත් මීලඟ සටන්වලදීත් පාණ්ඩ්‍යයන්ගේ අශ්වාරෝහක සේනාව කැපී පෙනුණහ.

"දමිළයන් විසින් පූර්වයෙහි බිඳින ලද ලක්දිවු හි සියලු සෑ උන් ලවාම කරවිය යුතු බැව් පරක්‍රමබාහු රජුගේ නියෝගය විය. ඒ අනුව මෙතෙක් පැවති සටන්වලදී ජීවග්‍රහයෙන් අල්ලා ගන්නා ලද ද්‍රවිඩයින් බොහෝ දෙනෙක් සිරකරුවන් ලෙස ලංකාවට ගෙනෙන ලැබූ අතර ඔවුන් විසින් රුවන්වැලිසෑයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලදී. (සරත් ජයවර්ධන 2023 - පිටු අංක 116) රුවන්වැලි සෑ කැණීම්වලදී මුරගලක් අභියස හමුවූ හමුවූ ශිලා ලේඛණයක "ජගදොප්පකණ්ඩන් පෙරුම්පල්ලි" ලෙස සඳහන් වීම මෙම ප්‍රකාශය තවදුරටත් තහවුරු කරනු ලබයි. (පද්මනාදන් සී, 2013) පෙර දවස චෝලයන් විසින් වනසා දැමූ අනුරාධපුරයේ මහා ස්තූපය ප්‍රතිසංස්කරණ කර්තව්‍යයෙහි ඔවුන් යොදවනු ලැබූහ. පොළොන්නරුව පෞරාණික නගරයේ නටබුන් වී ගිය දෙමළ මහා සෑයද මේ ව්‍යාපෘතියට කදිම උදාහරණයකි. එය ද්‍රවිඩ දේශයෙන් ගෙන්වන ලද මිනිසුන් යොදා ගනිමින් දකුණු ඉන්දියාවට පෙනෙන උසකින් තැනවීම අරමුණ කොට ගත් බව වංශ කතාවලින් හෙළිවෙයි.

මතු සම්බන්ධයි.

# බෝයර්වරුන්ගේ ස්මරණ හා බැඳුණ

# බැරක්ක නගරයේ පුරාවෘත්තයන් බිඳක්

දියතලාව හඳුන්වන නම් කිපයක් මා දන්නා තරමින් ඇත. අතීතයේදී පැරන්නෝ දියතලාව දියඋන්නාව වශයෙන් හැඳින්වූහ. තම මවුරට හා සමාන දේශගුණ තත්ත්වය හේතුවෙන් බ්‍රිතාන්‍යයන් හට එය Happy Valley (සතුටු නිම්නය) වූ අතර, බෝයර් සිරකරුවන්ගෙන් ජනාවාස වූ විට බැරක්ක නගරය විය. අදටත් බෝයර්වරුන්ගේ අතීත මතකයන් අනුස්මරණය කරමින් නගරයේ ඇතැම් පෙදෙස් බෝයර් පාර බෝයර් පිල්ල වැනි ස්ථාන වශයෙන් ව්‍යවහාරයේ පවතී. එසේම, බෝයර්වරුන් නැවත සිය රට බලා ගිය පසු ජනශූන්‍ය වූ විට එය Ghost City (අවතාර නගරය) වී හමුදා සංක්‍රමණයන් සමඟ Garrision town හා Diyathalawa garrison යනුවෙන් ද ඇතැමුන් හඳුන්වනු ලැබීය. දැනට හමුදා කඳවුරු රැසක එකතුවක් බැවින් Diyathalawa cantonment යනුවෙන් ද ව්‍යවහාර වේ. මෙහිදී, Garrision යන්න ප්‍රංශ වචනයකින් පැවත එන හමුදා ඛණ්ඩ ස්ථානගත වූ ස්ථානය යන අරුත දේ. එසේම, ඇතැම් ලේඛණයන්හි මෙම පෙදෙස Waterd valley (ජලය පිරුන නිම්නය) වශයෙන් ද හඳුන්වා ඇති බව ද දක්නට ඇත.

දියතලාව අතීතයේ කිසිදු යුදමය වශයෙන් වැදගත් ස්ථානයක් වශයෙන් භාවිතා කර ඇති බවට සාධක නොමැත. නමුත්, දියතලාවට ආසන්න බ්‍රිතාන්‍ය හමුදා ස්ථානගත කිරීමක් වශයෙන් ඌව පරණගම පිහිටි මැක්ඩොනල්ඩ් බලකොටුව සැලකිය හැක. එසේම, පෘතුගීසීන් විසින් හල්දුම්මුල්ල ප්‍රදේශයේ බලකොටුවක් පවත්වා ගෙන ගිය බවට මූලාශ්‍ර පවතී. මෙයට අමතරව වෙලන්හින්න ප්‍රදේශයේ ද බලකොටුවක නශ්ටාවශේෂ දක්නට ඇති අතර, ප්‍රදේශවාසීන්ගේ විශ්වාශය මෙය ලන්දේසි බලකොටුවක් බවයි. එසේම, මෙය හල්දුම්මුල්ල බලකොටුවට අනුපූරකව නිරීක්ෂණ කටයුතු සඳහා යොදා ගෙන ඇති බව සිතීමට හැක.

බ්‍රිතාන්‍ය හමුදා අණුඛණ්ඩයක් 1885 වසරේ දියතලාවේ ස්ථානගත වී ඇති බවත්, එම ස්ථානය එම්ප්‍රදෝරු කඳවුර බවට සඳහන්ව ඇත. එවකට එම්ප්‍රදෝරු කඳවුර නමින් හැඳින්වූයේ දැනට රොන්ඩවුස් සරඹ භූමියට මුහුණලා පිහිටි කඳවුරයි. එය බ්‍රිතාන්‍ය යුගයේ දී බැරුක්ක මූලස්ථානය (Garrision head quarters) යනුවෙන් ද හැඳින්විණි. දියතලාව ජනාවාස වීම පිළිබඳව මුල්ම තොරතුරු ඇත්තේ මෙතෝදිස්ත පූජකයකු වන සැමුවෙල් ලැන්ග්ඩන් 1879 දී යටත් විජිත රජයෙන් ඉඩමක් බදු පදනම මත ඉල්ලුම්කර ලබාගෙන අලි අනාථාගාරයක් සහ කාර්මික පාසලක් ආරම්භ කිරීමත් සමඟය. ඔවුන් මෙම සුන්දර ප්‍රදේශය Happy Vally (සතුටු නිම්නය) වශයෙන් නම් කරන ලදී. පසුව හා මිෂන් නිවසක් රෝහලක් හා දේවස්ථානයක් පිහිට වූ අතර, ක්‍රමයෙන් තේ වගාව ව්‍යාප්තවීමත් සමඟ ප්‍රදේශ ජනාවාස වීම ආරම්භ වන ලදී. ඒ අවට තිබූ අනෙක් එකම ගොඩනැගිල්ල Club House විය. එසේම, චැපල් දේවස්ථානය වත්මන් පෝලෝ ක්‍රීඩා පිටිය අසල පිහිටා තිබුණි.

දියතලාව ස්ථිර වශයෙන් හමුදා මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාත්මක වීමට අවශ්‍ය මූලික අඩිතාලම වැටෙනුයේ බෝයර් යුද්ධයේ සිරකරුවන් රඳවා තැබීමේ කඳවුරක් වශයෙන් පවත්වා ගෙන යාමට එවකට යටත් විජිත පාලනයේ මෙරට ප්‍රධානියා වූ වෙස්ට් රිජ්වේ ආණ්ඩුකාරයා ගත් තීරණයත් සමඟය. බෝයර් සිරකරුවන් යනු දකුණු අප්‍රිකාවේ ට්‍රාන්ස්වාල් ප්‍රදේශයේ පදිංචිව සිටි ලන්දේසි සම්භවයකින් පැවත එන ජනවර්ගයකි. මේ සඳහා ශ්‍රී ලංකාවේ උදාහරණය නම් කොළඹ කේන්ද්‍රියව ජීවත් වූ ලන්දේසීන්ගෙන් පැවත එන බර්ගර් ජාතිකයින්ය. බෝයර් යන්න ඕලන්ද භාෂාවෙන් බිඳී ආ ගොවියා යන අර්ථය දෙන වචනයකි. බෝයර්වරුන් 1899 සිට 1901 දක්වා 1 හා 2 බෝයර් යුද්ධ යනුවෙන් බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය සමඟ යුද්ධ 02ක් සිදුකර ඇත. මෙම යුද්ධය සඳහා ශ්‍රී ලංකාවෙන් ද හමුදා කණ්ඩායමක් සහභාගී වී ඇති අතර, ඔවුන් උසස් අන්දමින් සේවය කළ බවට බ්‍රිතාන්‍ය අණදෙන නිලධාරී විසින් ලිපියක් ලබා දී ඇත. ඉන්දීය නිදහස් සටනේ ප්‍රමුඛයකු වන මහත්මා ගාන්ධි එවකට දකුණු අප්‍රිකාවේ වාසය කර ඇති අතර, ඔහු ද ගිලන්මැසි හමුදාවක් සංවිධානය කර බ්‍රිතාන්‍ය හමුදාවට සහය පළකර ඇත. මේ හේතුවෙන් ඔහුට බ්‍රිතාන්‍යයන් විසින් පදක්කමක් පිරිනමා ඇත.

යුද සිරකරුවන් පැමිණීමේ තොරතුරු ලැබීමත් සමඟ 1900 අප්‍රේල් මස දී දියතලාව නොහොත් එවකට සතුටු නිම්නය ජනාවාස කිරීමට පුරෝගාමී වූ මොතොදිස්ත සභාවට හා ලෝන්ඩන්වරුන්ට දියතලාවෙන් ඉවත් වී යන ලෙස දැනුම්දීමක් කරන ලදී. දියතලාව සම්පූර්ණ යුද කඳවුරක් වශයෙන් ගොඩ නැංවීමට අවැසි මූලික ඉදිකිරීම් භාරදුන්නේ එවකට PWD වශයෙන් රජයේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවටයි. මාස 03 ඇතුලත ඉදිකිරීම් නිම වූ අදටත් පවතින කඳවුරු සංකීර්ණයේ උපත සිදු වූයේ ඒ ආකාරයෙන්ය. කඳවුරු ඉදිකිරීම් භාරව සිට ඇත්තේ කර්නල් ජීජී ජයවර්ධන වේ.

කඳවුරේ ආරක්ෂාවට දැඩි ආරක්ෂක විධිවිධාන සහිතව ශ්‍රී ලංකා පාබල හමුදාව යටතේ රාජකාරී නිරතව සිටි 28 වන ජන්ජාබ් රෙජිමේන්තුව වෙත භාරදී ඇත. ලුතිතන් කර්නල් ඒසීඑප් වින්සන්ට් කඳවුරේ අණදෙන නිලධාරී වශයෙන් ආණ්ඩුකාරයා වශයෙන් පත් කරන ලදී. පලමු සිරකරු කණ්ඩායම 1900 අප්‍රේල් 09 වන දින මොහාක් නමැති නෞකාවෙන් කොළඹට පැමිණ දියතලාව දක්වා දුම්රිය මගින් ප්‍රවාහනය කර ඇත.

කඳවුර තුළ කියවීම් ශාලාවක් පවත්වා ගෙන ආ අතර, එහි ලන්දේසි පොත්පත් සඟරා රාශියක් තිබී ඇත. එසේ සංගීත කණ්ඩායමක් හොඳ මට්ටමේ ක්‍රිකට් කණ්ඩායමක් තිබී ඇත. සිරකරුවන් බොක්සින් ක්‍රීඩාවේ යෙදීමට මනාපයක් දක්වා ඇති අතර, අමතර ආදායමක් ලබා ගැනීම සඳහා කඳවුර තුළ සුළු වෙළදාම් කටයුතු කිරීමට ද අවසර ලබාදී ඇත. එක් රැඳවුම්කරුවකු බේකරියක් පවත්වා ගෙන ගිය අතර, ලන්දේසි ක්‍රමයට සෑදූ කේක් වර්ග ඉතා ජනප්‍රිය වී ඇත. බෝයර් හමුදාවේ ජෙනරාල්වරුන් සහ උසස් නිලධාරීන් කිහිපදෙනකු ද සිට ඇති අතර, ඒ අතරින් ජෙනරාල් ජවුබට් හා ජෙනරාල් ඔලිවර් හට සිරකරුවන් මෙන්ම බ්‍රිතාන්‍ය ජාතිකයන් පවා ගෞරව සම්ප්‍රයුක්ත සැලකීම් කර ඇත. ඔවුන්ට වෙනම ආහාර ගැනීමට හා කඳවුරෙන් බැහැරට ගොස් ඇවිදීමට පවා අවස්ථාව ලබාදී ඇත.

සිරකරුවන් නැවත මව්රට බලා යාමෙන් පසු දියතලාව යුද හමුදා පුහුණුවීම් මෙන්ම බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදා නිවාඩු අතරමැදි කඳවුරක් ලෙස භාවිතා කර ඇත. ස්වේච්ඡා පාසලේ පුහුණුවීම් ආරම්භ කළ අතර, 1923 දී කඳවුරෙන් කොටසක් මැනුම් දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන ලදී. 2 වන ලෝක යුද්ධයේ දී ජර්මන් හා ඉතාලි ජපන් සිරකරුවන් මෙන්ම ජාත්‍යන්තර සීමා නීති කඩ කළ නාවිකයින් රඳවා ගැනීමට ද දියතලාව යොදවා ගෙන ඇත. දැනට 1 ගැහේබ කඳවුර තිබෙන ස්ථානය මුලදී HMS Uva නමින් බ්‍රිතාන්‍ය නාවික කඳවුරක් පවත්වා ගෙන ආ අතර, (HMS කෙටි යෙදුම Her/His Majatic Ship යන්න වේ) පසුව මෙහි නාවික හමුදා රෝහලක් ලෙස පවත්වා ගෙන ගිය අතර, නම HMS rangala යනුවෙන් වෙනස් කරන ලදී. නිදහසින් පසු ශ්‍රී ලංකා නාවික හමුදාව පිහිටුවීමේ දී මෙය ඔවුන් විසින් භාර ගන්නා ලද අතර, පසුව 1 ගැහේබ වෙත භාරදෙන ලදී.

පුහුණු වීම් සඳහා සිලෝන් මවුන්ටඩ් රයිෆල් බලකාය පැමිණීයේ අශ්වයින් සමඟ වන අතර, පුහුණුවීම්වල දී අශ්වයින් පිට යාම ඉතා ජනප්‍රියවී ඇත. මෙම අශ්වයින් ගාල් කරන ස්ථානය දැනට ගුවන් හමුදා කඳවුර පිහිටා ඇති ප්‍රදේශය වන අතර, එම ප්‍රදේශය හඳුන්වනුයේ stable hill වශයෙනි. සිංහල වචනානුසාරයෙන් සැදැල කන්ද යනුවෙන් පැවසිය හැක. පුහුණුවට පැමිණි අය හට දඩයමේ යාම සඳහා අවසර ලබා දී තිබූ අතර, කඳුරුගමුව හා අලුත්වෙල වල්ඌරු දඩයම සඳහා ප්‍රසිද්ධ විය. අලි දඩයම සඳහා හෝර්ටන්තැන්න හා පුනාගල ප්‍රදේශයට ගිය බව සඳහන් වේ. මේ ප්‍රදේශවල තවමත් වල්ඌරන් විශාල වශයෙන් සිටින අතර, මා දියතලාවේ රාජකාරී කරන විට විවිධ අවස්ථාවන්හිදී නගරයෙන් පිටත වාහනවලින් ගමන් කිරීමේදී දැක ඇත.

දියතලාව ගැන කථා කිරීමේදී බොහෝ විට සිහිවනුයේ නරියා කන්දයි (Fox hill). 1913 වර්ෂයේදී HMS FOX නමැති රාජකීය නාවික හමුදාවට අයත් නෞකාවක් ත්‍රිකුණාමල වරායේ අලුත්වැඩියා සඳහා නැංගුරම් ලෑ අතර එහි සිටි නාවිකයින් කපිතාන්වරයා සමඟ නිවාඩුව ගත කිරීම සඳහා දියතලාවට පැමිණියේය. එම නෞකාවේ සුරතලකු වශයෙන් නරියකු සිටි බව පැවසෙන අතර, ඔවුන්ගේ චාරිකාව සිහිපත් කිරීම සඳහා කන්ද මත නරි රුව සකස් කළ බව පැවසේ. මෙය නරියා කන්ද වශයෙන් හැඳින්වීමට පෙර Black rock හෙවත් කළුගල් කන්ද වශයෙන් හඳුන්වා ඇත. Fox hill යාබද කඳුගැට ලෙස Crest Hill Gibraltar Hill Hosp Hill Thistle Hill One three Hill Stable Hill Engineers Hill Paperpox HillGolf Hill යනුවෙන් කිහිපයකි.

රාජකීය නාවික හමුදාවේ නිලධාරීන් නිතර නිතර දියතලාවට පැමිණි අතර වත්මන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය ප්‍රයෝජනයට ගන්නා පැරණි ගොඩනැගිලි විශේෂයෙන් Quarter Hill ප්‍රදේශයේ රාජකීය නාවික කාන්තා සේවයේ (WRNS - Women ' Royel service) ප්‍රයෝජනය සඳහා සකස් කර තිබිණි. එසේම, ඒ සමයේ දකුණු ආසියා කලාපයේ අණදෙන නිලධාරී වූ ලෝඩ් මවුන්ට් බැටන් සාමිවරයා ද දියතලාව විවේක ස්ථානයක් වශයෙන් ප්‍රියකර ඇත.

දියතලාවට අලංකාරයක් ගෙන එන හලංගොඩ ජලාශය ඉදිකර ඇත්තේ 1 ගැහේබ නිර්මාත්‍ය බ්‍රිගේඩියර් ජේඑෆ් හලංගොඩ (විශ්‍රාමික) විසිනි. දියතලාව නගරයේ ආර්මි නේවි ස්ටෝර්ස් ආරම්භ වී ඇත්තේ 1880

වර්ෂයේය. කඳවුරේ කරණවෑම්හල වශයෙන් භාවිතා කළ කැම්ප් සැලූන් 1900 වර්ෂයේ ආරම්භ කර දැනට වසා දමා ඇත. නමුත්, එය ද ශතවර්ෂයකට උරුමකම් කියන පැරණි තේජස දරමින් සිටී. වර්තමාන තැපැල් කාර්යාලය මුලින් හැඳින්වූයේ රෝස් කොටේජ් ලෙසයි. එය ද පැරණි නිවාඩු නිකේතනයකි. දියතලාව රිගල් සිනමා හල එකල ප්‍රසිද්ධ වූයේ එවකට හොඳ මට්ටමේ බටහිර චිත්‍රපටි ප්‍රදර්ශනය කරන සිනමා හලක් ලෙසයි. එය 1942 වර්ෂයේ විවෘත කර ඇත. එවකට කඳවුරට ජලය සැපයූ විශාල මට්ටමේ ජලටැංකි 02ක් රිගල් සිනමා හල අසල භූගතව ඉදිකර ඇත. දැනට නව ඉදිකිරීම් නිසා එය දක්නට නොමැත. එසේම, බෝයර් සිරකරුවන් හට ස්නානය කිරීම සඳහා සකස් කළ ස්ථානයක් බෝයර් පිල්ල යනුවෙන් මැණික් කන්ද ආසන්නයේ පවතින බවට ලද තොරතුරක් මත මා එය සොයා ගිය ද අවස්ථාවේ ඉතා කණගාටුදායක ලෙස එම ස්ථානයේ කොන්ක්‍රීට් දමා නිවාස ඉදිකර ඇති බව දක්නට ලැබිණි. එසේම, මිනින්දෝරු දෙපාර්තමේන්තුවට යාබදව තිබෙන බෝයර් සොහොනද නිසි නඩත්තුවක් සිදුකරන බව පෙනෙන්නට නැත.

ඇඩිෂන් බංගලාව හා ආකේඩියා බංගලා දෙක යුරෝපීයයන් විසින් සිදුකරන ද අතිවිශිෂ්ට නිර්මාණ වේ. ශ්‍රී ලංකාවේ ප්‍රකට ලේඛකයකු වූ ඩබ්ලිව්ජ් ද සිල්වා මහතා තම ලේඛන කටයුතු සඳහා දියතලාව යොදා ගෙන ඇති අතර, ඔහුගේ නිවස, "දනුක්" නමින් කඳුරුගමුව ප්‍රදේශයේ ඇත. එසේම, මියුසියස් විදුහලේ නිර්මාතෘවරිය වන ජර්මන් ජාතික මාරි මියුසියස් හිගින්ස් මැතිණිය ද දියතලාව විහාරකැලේ ප්‍රදේශයේ නිවසක වාසය කර ඇති බව ප්‍රදේශවාසීන් පවසයි. එම නිවස විහාරකැලේ ප්‍රදේශයේ පිහිටා ඇති අතර, එය අද මියුසියස් කොටේජ් යනුවෙන් හැඳින්වේ.

දියතලාවේ පිහිටි පැරණි යුද ස්මාරක පිළිබඳව සොයා බැලුවහොත් ඓතිහාසික වශයෙන් වැදගත් වනුයේ ස්වේච්ඡා පුහුණු පාසලේ පිහිටා ඇති ස්මාරකය බව මාගේ අදහසයි. යුද ස්මාරකයේ සටහන් ඇති වැදගත් පාඨය වනුයේ “PRO-PATRIA MORI” (සාර්ථක මරණයක් සඳහා) වශයෙනි. 1 වන ලෝක යුද්ධයේ දී දිවිපිදූ රණවිරුවන් 78 දෙනකු අනුස්මරණය කරනු වස් මෙම යුද



ස්මාරකය වන “Greater Love හා Hath No Man Than This That A Man Lay Down His Life For His Friend”ලෙසින් සටහන් කර ඇත. එහි සිංහල අර්ථය යමකු තමාගේ මිතුරන් උදෙසා දිවිපිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවකුට නැත යන්නයි. මෙම ස්මාරකය මෙන්ම බෝයර් සුසාන භූමිය නැරඹීමට විදේශීය ඥාති මිත්‍රාදීන් පැමිණීම තවමත් සිදුවේ.

මුල් කාලයේ දියතලාවේ යුද්ධ හමුදාධිපති සඳහා වෙන්වූ නිවාඩු බංගලාවක් නොවීය. දැනට තිබෙන තිස්ල් හවුස් ලෙස හැඳින්වෙන බංගලාව තිස්ල් හිල් මත ඉදිකෙරුණේ දෙවන යුද්ධ හමුදාධිපති මේජර් ජෙනරාල් ප්‍රැන්සිස් රීඩ් ගේ ධුර කාලයේදීය. එතුමාගේ මැතිණිය ගෘහ නිර්මාණ ශිල්පයේ ප්‍රවීණතාවයක් දැක්වූ බැවින් සියලු සැලසුම් ඇය විසින් සිදුකළ බව සඳහන් වේ. එම කඳුවැටිය තුළ HMS thistle වනුවෙන් බ්‍රිතාන්‍ය නාවිකයින් විසින් සෑදූ ලාංඡනයක් දක්නට ඇත. HMS thistle යනු බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාව සතුව තිබූ සබ්මැරීනයක් වූ අතර, එය 1940 දී නෝර්වේ අසල මුහුදේහි ජර්මානු සබ්මැරීන් ප්‍රහාරයකට ලක්වී විනාශ වී ඇති බැවින් එය සිහිපත් වීම පිණිස මෙම ලාංඡනය නිර්මාණය කළ බවට අනුමාන කළ හැක.

අතීතයේදී දියතලාවට වෙනම රෝහලක් නොතිබූ අතර, දැනට ආර්මි ඇන්ඩ් නේවි ස්ටෝර්ස් පිහිටා ඇති ස්ථානයෙන් පහල ඇති සෙසුනිල විවාහක නිවාස වශයෙන් භාවිතා කරන ගොඩනැගිලි රෝහලක් වශයෙන් පවත්වා ගෙන ගොස් ඇත. දැනට දියතලාව මහරෝහල පිහිටා ඇති ස්ථානය එවකට රාජකීය ගුවන් හමුදා මූලස්ථානයේ කඳවුරක් වශයෙන් භාවිතා කළ අතර, එය හැඳින්වූයේ මැක්රොබට් කඳවුර නමින් වන අතර, එය දෙවනි ලෝක යුද්ධ සමයේ දකුණු ආසියා බ්‍රිතාන්‍ය අණදෙන නිලධාරී මවුන්ට් බැටන් සාමිවරයාගේ රහස්‍ය ලේඛණ ගබඩා කර තිබූ ලේඛණගාරයක් වශයෙන් පවත්වා ගෙන ගොස් ඇත. දැනට ආයුර්වේද රෝහල් භූමිය 1956 සිට 1970 දක්වා Public Service Recration Club (PSRC club) වශයෙන් පවත්වා ගෙන ගොස් ඇති අතර, එය දියතලාව විධායක ඉංජිනේරු යටතේ පාලනය විය. එහි සාමාජිකයින් වූයේ උසස් රජයේ නිලධාරීන්ය. මැක්රෝබට් කඳවුර දියතලාව රෝහල වෙත පවරා ගැනීමෙන් පසු එහි සිටි නිලධාරීන් සඳහා මෙම භූමියේ ගොඩනැගිලිවල ටික කාලයක් නවාතැන් ලබාදී පසුව ගුවන් හමුදා කඳවුරේ ස්ථිර නිවාස ඉදිකරදී ඇත. සමාජශාලාවේ බීමහල භාරව කටයුතු කළ මහතා තවමත් ජීවත්ව සිටින අතර ඔහු හමුවීමට මා හට අවස්ථාව ලැබුනි.

හමුදා සාමාජිකයින් වශයෙන් අප සැම හට දියතලාව වෙත ආත්මීය බැඳීමක් ඇත. මා හට එය විශේෂයෙන් ඇත්තේ අවුරුදු 18ක නව යොවනයකු වශයෙන් ආධුනික පුහුණුවට ස්වේච්ඡා පුහුණු පාසල වෙත මීට වසර 32කට පෙර පැමිණීම නිසයි. ආධුනික සෙබලකු වශයෙන් මා පලමුවරට පා සරඹ පුහුණුව සඳහා පා තැබූ රොන්ඩවුස් සරඹ පිටිය ජේන මානයේ කාර්යාලයක ඊට වසර ගණනකට පසු මේජර් නිලයට උසස්වීම් ලැබ රාජකාරී කිරීමට ලැබීම සිහිනයක් බඳු මෙන්ම මා හට ඉතා හැඟුම්බර අවස්ථාවක් වූ බව කිව යුතුය. මා මුලින් දුටු දියතලාවට සිදුව ඇති විනාශය පිළිබඳව ඊටත් වඩා හැඟම්බරය. ස්වභාව සෞන්දර්ය විසින් විචිත්‍රව ගෙත්තම් කරන ලද සිතුවමක් බඳු මෙම රම්‍ය නගරය කොන්ක්‍රීට් වනාන්තරයක් බවට පත්කිරීමට වගකිය යුතු අයවලුන් කවුරුන්ද යන්න ප්‍රශ්නාර්ථයකි. දියතලාව පිළිබඳව වඩාත් ඓතිහාසික පසුබිමකින් වෘත්තිය ප්‍රවේශයකින් ගවේශණය කිරීමට කාලය එළඹ ඇති බව මාගේ පුද්ගලික අදහසයි. මෙහි පෞරාණික හා පුරාවිද්‍යාත්මක වටිනාකම් ගවේශණය කොට ඒවා ආරක්‍ෂා කර අනාගත පරම්පරාවට භාරදීම අපගේ යුතුකමකි. දිගින් දිගටම සිදුවී ඇති පරිසර විනාශය දියතලාවේ සුන්දරත්වය මා මුලින් දුටුවාට වඩා 75%ක් විනාශ වී ඇති බව වගකීමෙන් පවසමි. දැවැන්ත පරිසර හානියක් බවට පත් වී ඇති පයිනස් වගාව පිළිබඳව සෘජු තීරණයක් ගත යුතුව ඇත. එසේ නොමැති වුවහොත් දියතලාව අනාගතයේ හරිත ජීවයක් රහිත නගරයක් වනු ඇත.

**කෙඩෙට් පාඨමාලා කාලයේ ඉපැරණි සුන්දර මතක අවුස්සන "කැඩ්ඩන්ගෙ කතා" මෙවර කලාපයේ පටන් මේ පිටුවේ දිගහැරේ. නිත්‍ය ස්වේච්ඡා පිරිමි කාන්තා මේ සෑම කෙඩෙට් පාඨමාලාවකදීම ඔබ අත්විඳි නොඑසේනම් ඔබගේ දෑස් ඉදිරිපිට ආසන්නම සගයා අත්විඳි රසබර තොරතුරු අපවෙත ලියා එවන්න. මේ පිටුව ඒ වෙනුවෙනුයි.**



# කැඩ්ඩන්ගේ කතා

*මෙය 2015 වසරේ නිත්‍ය පාඨමාලා අංක 80 (Intake 80) ට සම්බන්ධ සිදුවීමකි.*

## මිස් ෆයර්...

එම පාඨමාලාවේ අවසන් කාලය කිට්ටු වෙද්දී තමයි ජංගල් එක තියෙන්නෙ. ඔන්න ඉතින් හා හා පුරා කියලා ජංගල් එක්සර්සයිස් එක කරන්න මාදුරුඔය SF එකට ගියා. වෙහෙසකර පුහුණුවක අවසානයේ දවසක් හවස ආමරියට වෙපන් භාරදෙන්න අපි කට්ටියම ගියේ "යන්තන් අද දවසත් ඉවරයි" කියලා හිතාගෙන. නමුත්, එහෙම සැහැසුම් සුසුම් හෙලනවාත් සමගම එකපාරට "ඩෝං" ගාලා සද්දයක් ආමරිය ඇතුළෙන් ඇහුනා. ඒත් එක්කම වටේ හිටපු අය මීයට පිම්බාක් මෙන් තුෂ්ණිම්භූතව බලා හිටියා. ඒත් එක්කම ආමරිය ඇතුළෙන් "ස්ටාෆ්.... මුකුත් අවුලක් උනේ නෑ... සද්දේ එහෙම ලොකුවට ඇහුණෙ නෑ..." ආයි කියනවා " හරි ස්ටාෆ් ඒක හරි" කියා අපේ පාඨමාලා සගයකු ආමරිය භාර කොණ්ඩනියෙකු ඉදිරියේ නොවදිනා වැඳුම් වඳින්නට විය.

නමුත් සිදුවූයේ අනෙකකි. එක්වරම වෙඩි හඬ ඇසීම හේතුවෙන් පාඨමාලා භාර නිලධාරියා හනිකට අප සිටි ආමරිය අසලින් මතුවූයේ නොසිතූ අයුරිනි. එසැණින් සිදුවන්නට නියමිත ව්‍යසනයේ තරම සියල්ලන් හට හොඳින් අවබෝධ විය. පාඨමාලා භාර නිලධාරියා ආමරිය වෙත ඇතුළු වූ සැණින් අතට අසු වූ ඒමින් පිකට් එකකින් පෙර කී මිස් ෆයර් වූ අප සගයා හට නොඅඩුව සංග්‍රහ කරන්නට විය. එහි තරම කොතෙක්ද යත් "සාජන් මේ ඒමින් පිකට් එක මේ පොඩ්ඩට ඇද වෙලානේ... මෙහෙමම කෙලින් කරලා ගමු..." යැයි පැවසූ පාඨමාලා භාර නිලධාරියා පැත්තට ඇදවුනු ඒමින් පිකට් එක යථා තත්ත්වයට පත්කිරීම සිදුකරන ලද්දේද මිස් ෆයර් සිදුකළ අප සගයාගෙන් වාඩුව ගනිමිනි.



*මෙය 1992 වසරේ ස්වේච්ඡා පාඨමාලා අංක 17 (Vol Intake 17) ට සම්බන්ධ සිදුවීමකි.*


## අතුරුදන් අලුවා පාර්සලය...

ඒ 1992 වසරේ අග භාගයේ දවසක්. එදින ඉරිදා දිනයක්. හෙටින් ඇරඹීමට නියමිත "Grave Digger" අභ්‍යාසය සඳහා කෙඩෙට් නිලධාරීන් සූදානම්ව සිටියා. එය ඉතා දුෂ්කර වුවක බවත්, සුළු අත්වැරැද්දට පවා උපරිම ලෙස දඬුවම් හිමිවන බවත් එවකට ඇකඩමියේ සිටි ජ්‍යෙෂ්ඨයින්ගෙන් දැනගත්තා. "හෙට උඹලට හොඳ කුනක් කන්න වෙනවා" ඔවුන් නිරන්තරව අපිව භීතියට පත්කළා. කොහොම හරි ඒ වෙනුවෙන් කටයුතු සූදානම් වෙද්දී මගේ යාබද ඇඳේ සිටින කෙඩෙට් මිතුරාගේ නිවසින් කිහිප දෙනෙක් ඔහුව බැලීමට ඇකඩමියට පැමිණ තිබුණා. නමුත්, එවකට පාඨමාලාවේ ආරම්භක අවදිය වූ බැවින් ඔහුට එම ඥාතීන් මුණගැසීමට අවස්ථාව දුන්නේ නැහැ. ඒ පිළිබඳව ඔහු සිටියේ ඉමහත් කනගාටුවෙන්. කොහොම නමුත් නිවසේ සිට රැගෙනවිත් තිබූ අලුවා පාර්සලයක් නම් ඔහුට ලැබී තිබුණා.

පෙට්ටියක පරෙස්සමට අසුරා තිබූ එම අලුවා පාර්සලය අප සිටි හට නිවාසයේ 30 දෙනාටම කෑලි දෙක තුන බැගින් උවත් කෑමට ප්‍රමාණවත්. නමුත්, මා මිතුරා එහි සිටි සෑම අයෙකුටම එක් අලුවා කෑල්ල බැගින් පමණක් බෙදාදුන්නා. අනතුරුව ඉන් විශාල ප්‍රමාණයක් එහි ඉතිරි වූ අතර, ඔහු ඒ සියල්ල කාටත් නොපෙනෙන්නට සඟවා තබාගත්තා. ඒ අතර වැඩිපුර කෑම වෙනුවෙන්ම උනන්දු වෙන කෙඩෙට් මිතුරන් කිහිපදෙනෙක් නිරන්තරව ඔහු වෙත පැමිණ අමතර අලුවා ඉල්ලා සිටියදී ඔහු පවසා සිටියේ අලුවා අවසන් බවයි. නමුත්, ඒ වනවිට ද ඔහු සතුව නැවත වතාවක් එහි සියලු දෙනාටම බෙදන්නට තරම් අලුවා ඇති බව දැනගත් කිහිපදෙනෙක් නිරන්තරව ඔහුගේ අලුවා පාර්සලය දෙස ඇස ගසාගෙන සිටින බව ඔහු දැන සිටියේ නැහැ.

මෙලෙස පසුදින සවස අප "Grave Digger" අභ්‍යාසය සඳහා නරියාකන්ද ප්‍රදේශයේ වූ ස්ථානයක් වෙත පිටත්වුණා. එදින තරමක වැහිබර ගතියක්ද තිබුණා. අභ්‍යාසය ඇරඹි රාත්‍රිය වෙද්දී ජ්‍යෙෂ්ඨයින් පවසා තිබූ පරිදිම යුද අගල් කැපීමේ කටයුතු ආදී දුෂ්කර අවස්ථා රැසක් එහි වුවා. මැදියම වෙද්දී එම යුද අගල් නිසි පරිදි සවිමත්ව නොවීම හේතුවෙන් සෑම කෙඩෙට් නිලධාරියෙකුටම අඩු වැඩි වශයෙන් දඬුවම් හිමිවුනා. එහි වූ වතුර වලකින් දිය නාගෙන වෙව්ල වෙව්ලා පිනුම් ගසන බොහෝ දෙනෙක් අතර අලුවා පාර්සලය අයිති මා මිතුරාද සිටියා.

කෙසේ හෝ උපරිම ලෙස හෙම්බත්ව සිටි මාගේ අලුවා මිතුරා ලද ඇසිල්ලකින් කාටත් හොරා සැඟවී පැක් එක දිග හරින්නට වූයේ හට නිවාසයේ සිට රැගෙන ආ අලුවා පාර්සලය ඒ අලුයම් යාමයේ සෙස්සන්ට නොපෙනෙන්නට රිසිසේ භුක්ති විඳින්නටයි. අහෝ පුදුමයකි. එක්වරම ඔහු පැක් එක පොළොවේ ගසා එහි වූ යුද අගලට බැස ගත්තේ කිසිවකුගේ දැනුම්දීමකින් තොරවය. පසුව සොයා බැලීමේදී දැනගත්තේ ඔහුගේ අලුවා පාර්සලය කවුරුන් හෝ විසින් සොරාගෙන ගොස් එය බහා තිබූ හිස් කවරය පමණක් එහි ඉතිරි කොට ඇති බවකි.



# අවි ගැටුණු යුද බිමෙහි සෙබළුන්ගේ නොදුටු පැති

# රෝස සුවඳ සහ ගිනිඅවි අතර සෙබළ ජීවිත








ලුතිනන් කර්නල්
සුජිත්
චමින්ද
එදිරිසිංහ


**මෙරට 30 වසරක් පුරා පැවති යුද්ධයේ කියූ කතාවලට වඩා නොකියූ කතා බොහෝය. පෙනුණු දේවලට වඩා නොපෙනුණු දෑ බොහෝය. ඒ ඇතැම් ඒවා රසබරය. තවත් ඒවා දුක්බරය. සමහර ඒවා පුදුම සහගතය. දුලබය.**

යුද බිම යනු දුෂ්කර නිරන්තර අවධානම රැඳි බිහිසුණු තැනක් බව සැවොම දනිති. එහෙත්, යුද හටයකු පමණක් දන්නා ඔවුන්ට පමණක්ම ආවේණික ක්‍රියාකාරකම් සමුදායක් ද ඒ අතර පවතී. ඒවා බොහොමයක් සමාජයට නිවාරණය නොවී එම පරිසරයේම වැලලී ගොසිනි. ඊට මුහුණ දුන් අද්දැකීම් සහිත පිරිස් ද ක්‍රමානුකූලව විශ්‍රාම යමින් වියපත් වෙමින් නිහඬව මිහිදන් වෙමින් තිබේ. එකී සියල්ල එදවසට පමණක් වලංගු වූ හමුදාමය තොරතුරු වුවද ඒ හරහා නව හමුදා පරපුරට ද සිවිල් සමාජයට ද ගතහැකි ආදර්ශ බොහෝය. එනිසාම යුද බිමේ හැටි සොබා දැනගන්නටත් රණවිරුවන්ගේ එම අප්‍රකට භූමිකාව පිළිබඳව හඳුනාගන්නටත් ඉඩ සැලසීම කාලෝචිත යැයි හැඟේ. බෝම්බ, වෙඩි පත්තු නොවුණු තැන්වල ද යුද්ධය පැවතිණ. තිල ඇඳුමට වැසුණු මිනිසුන් තුළ වූ ලතෙන් ගුණ, අව්‍යාජ බව, නිර්භීතකම, ඉවසීම දරාගැනීම කෙතරම් ද යන්න පිළිබිඹු කරමින් මෙවර "යුද සමයේ සැඟවුණු කතාවක්" තුළින් ඔබ වෙත ගෙන එනුයේ 1990 දශකයේ මුල් භාගයට සම්බන්ධ ක්‍රියාන්විත බිම අප්‍රකට රසබර කතා ගොන්නකි.

සැබැවින්ම මෙරට පැවති යුද්මය පරිසරය යනු වෙනම සංස්කෘතියක් සහිත තැනකි. එහිදී, රණවිරුවන් කන බොන ආකාරය, අඳින පළඳින ආකාරය, තැනකින් තැනකට ගමන් කරන ආකාරය ආදී සෑම දෙයක්ම සිදුවූයේ වෙනස්ම පිළිවෙලකටය. අප රටෙහි පැවති යුද්ධය තුළ ප්‍රධාන පාර්ශ්ව හතරකි. එනම්, යුද්ධයට

සෘජුවම සම්බන්ධ වූ පාර්ශ්ව දෙක ද ඊට අතරමැදිවූ පාර්ශ්වය ද එහි පීඩාවන් අත්විඳි සතාසීපාවා, ගහකොළ සහිත පරිසරයයි. ගිනිඅවි හරහා මතුවන අවදානම ද ස්වභාවික පරිසරයේ දැඩි හිරුඑළිය, අධික පැවිල්ල දූවිලි වැලි පිරුණු කර්කශ මහ පොළොව ද එහි ඇති දුෂ්කරතාව මොනවට පැහැදිලි කරවයි. සමස්ථයක් ලෙස ගතහොත් යුද බිමෙහි ජීවත්වීමම යුද්ධයකි. ඒ ගැන දන්නේ එම පරිසරයෙහි පය ගැසූ අයම පමණි.




යුද්ධය පැවති සමයේ රණවිරුවන් නැගෙනහිර කලාපයේ සහ උතුරේ රාජකාරී කරන ලද්දේ වෙනස්ම ආකාරයකටය. විශේෂයෙන්ම උතුරු ප්‍රදේශයේ ආරක්ෂක හමුදා රැඳී සිටියේ ඉදිරි ආරක්ෂක වළල්ලකය. එහිදී හමුදාවට වෙනම ප්‍රදේශයක් හා ත්‍රස්තවාදීන්ට වෙනම ප්‍රදේශයක් ලෙස වෙන්වී තිබිණ. නැගෙනහිර පළාතේ එම තත්ත්වය සපුරා වෙනස් විය. මඩකලපුවල ත්‍රිකුණාමලය හා පොළොන්නරුවට අයත් නැගෙනහිර පළාත තුළ උතුරේ මෙන් ඉදිරි ආරක්ෂක වළල්ලක් නොපැවති අතර, එහි පිහිටියේ හුදෙකලා වූ කඳවුරුය. ප්‍රධාන කඳවුරු සේම තැන තැන පිහිටි අනුබණ්ඩ (කුඩා කඳවුරු) රාශියක් ද එහි විය.

යුදබිමෙහි ස්ථාපිත කඳවුරු තුළ රාත්‍රිය පුරාවට සෑම අයකුම පාහේ නිදිවර්ජිතව ගතකිරීම එකල සාමාන්‍ය තත්ත්වයකි. එය අසාවට සිදුකළ දෙයක් නොවූ අතර, පැවති ක්‍රියාන්විත වටපිටාව තුළ නිරන්තරව සූදානමින් පසුවිය යුතු වූ නිසා එය අනිවාර්ය අවශ්‍යතාවක් විය. ත්‍රස්තවාදීන්ගේ ඇල්ම බැල්ම නිරතුරු එල්ලවූ දැඩි අවදානම් තැන්වල කිසිවකුටත් කඳවුරක් තුළ සුවපහසු නින්දක් නොවීය. එසේ සුවපහසු නින්දක් ලැබීමට නම් නිවාඩුවක්ම යා යුතුමය. නමුත්, යුදබිම සිට නිවාඩුවක් ලබාගැනීම ද ලෙහෙසි පහසු කටයුත්තක් නොවීය. ක්‍රියාන්විත බිමෙහි රැඳී අවදානමේ තරම හා හටපිරිස් හිඟතාවය මත නිවාඩු සීමාවීම කොතෙකුත් සිදුවිය. ඒ අනුව ඇතැම්විට කෙනකුට නිවාඩුවක් ලබාගැනීම සඳහා මාස තුන හතරක් හෝ ඊට වැඩිකලක් ගතවන අවස්ථා කොතෙකුත් ඇත. එහි ඇති තවත් අවාසනාවන්තම

තත්ත්වයන් වනුයේ ඇතැම් සෙබළුන් පදිංචිව සිටියේද එම ක්‍රියාන්විත භූමිවලමය. උදාහරණයක් ලෙස කිලිනොච්චියේ හෝ යාපනයේ සේවයේ නිරත ඇතැමුන්ගේ පදිංචි නිවාස පිහිටියේ අම්පාර, කැබිතිගොල්ලෑව, මහඔය, ජයන්තියාය, ත්‍රිකුණාමලය ආදී ත්‍රස්ත තර්ජනයන්ට ලක්ව තිබූ ගම්වලය. රාජකාරියෙන් මිදී නිවාඩු ලැබ එම නිවෙස්වලට යන සෙබළුන් එදින සවස 6 පසුවුවහොත් එම ප්‍රදේශවලට යා ගත නොහැක. ත්‍රස්ත තර්ජන හේතුවෙන් රාත්‍රී කාලයේ එම ප්‍රදේශවල වාහන ධාවනය තහනම් වීම ඊට හේතුවයි. එවන් අවස්ථාවල ඔවුනට එහි මාර්ග බාධකයකම රාත්‍රිය ගතකොට යළි නිවසට යාමට සිදුවනුයේ පසුදින පහන් වී එම මාර්ගවල ආරක්ෂාව සහතික කිරීමෙන් පසුවය. කෙසේ හෝ එසේ ඔවුන් නිවසට ගිය ද එහිදීද මායිම් ගම්මානවලට ත්‍රස්තවාදී තර්ජන එල්ල වීම හේතුවෙන් ඔවුනට සිදුවනුයේ තම පවුලේ සාමාජිකයින් ද සමඟ රාත්‍රිය කැළෑ රොදවල් අස්සේ ගතකිරීමටය.

## අඳුරේ රාත්‍රිය ගෙවීම

යුද භූමියෙහි ඇති කඳවුරුවල ඇඳිරි වැටෙද්දී දැනෙණුයේ පාළු මූසල බවකි. විශේෂයෙන්ම දහවල තිස්සේ එහි ඇසුණු කතාබස්, සිනා හඬවල් මැකී ගොසිනි. එම අනුබණ්ඩවල සුළු හටපිරිසක් සිටීම හේතුවෙන් රාත්‍රී කාලයේ කඳවුර වටා ඇති ආරක්ෂක වළල්ලේ ද කඳවුරට පිටත රාජකාරී සඳහා ද එම පිරිස බෙදීගිය පසු කඳවුර තුළ වෙනත් අවශ්‍යතාවයකට සෙබළෙක් සොයාගත නොහැකි තරම්ය. පැවති හටපිරිස් හිඟතාවය මත කඳවුරේ ඉවුම් පිහුම් කරන සෙබළුන්ට පවා එකල රාත්‍රියේ මුර රාජකාරියක් පැවරෙනුයේ ක්‍රියාන්විත පරිසරයෙහි අවිවේකී බව කොතරම් දැයි කියාපාමිනි.

## ලිපි ගනුදෙනු

එවක යුදබිම තුළ අද මෙන් අන්තර්ජාල පහසුකම් හෝ ඊ-මේල් කෙටි පණිවිඩ සේවාවක් නොවීය. අවම වශයෙන් දුරකථන පහසුකමක් හෝ තිබුණේ කලාතුරකින් ප්‍රධාන කඳවුරකට පමණි. එනිසාම එහි තොරතුරු හුවමාරුවට පැවති එකම ක්‍රමවේදය වූයේ ලිපි හා විදුලි පණිවිඩය *(Telegram)*. උතුරේ ගොඩබිමෙන් සම්බන්ධව නොතිබූ හුදෙකලාව පැවති කඳවුරුවලට ලිපි ලැබුණේ ගුවන් මගිනි. නිවාඩු යාමට ඊමට ආහාර, අවි ආයුධ, පතුරොම්, බෙහෙත් රැගෙන ඒම ද, තුවාලකරුවන් රෝහල් කරා රැගෙන යැවීම ආදී සෑම කටයුත්තක්ම එලෙස ගුවන් මගින් සිදුකෙරෙද්දී පෝර උරවල බහාලූ ලියුම් මලු ද එමගින් හුවමාරු කෙරිණ. ගොඩබිම් සම්බන්ධතා තිබූ කඳවුරුවල විශේෂයෙන්ම නැගෙනහිර පළාතේ පිහිටි යුද හමුදා අනුකණ්ඩවලට ලිපි ලැබුණේ ඒ ආසන්න තැපැල්හල් මගිනි. 1990 දශකයේ මුල් භාගයේ මා රාජකාරී කරන ලද මඩකලපුව පූනානි අවට කඳවුරුවලට ලිපි සැපයුණේ වැලිකන්දේ පිහිටි තැපැල් කාර්යාලයෙනි.

අවිය තරමටම යුද බිමෙහි ලිපි ද සෙබළාට සමීපය. ''ඔඩිකොලොන්'' හෝ ''සෙන්ට්'' ගල්වා සුවඳ කොට ''රෝස මල්'' ''හදවත් හැඩැති, ස්ටිකර් අලවා එවන එවන් ලිපි සමග පෙම්වතියගේ ඡායාරූපයක් ද එම ලිපිවල වැරදුණේ නැත. එකල අද මෙන් ඩිජිටල් තාක්‍ෂණයක් නොපැවති හෙයින් ස්ටුඩියෝවකින්ම ලබාගෙන එයින්ම මුද්‍රණය කරගත් ඡායාරූප භාවිතා විය. සෙබළුන්ගේ හට නිවාස තුළ (කඳවුරේ නවාතැන් ගන්නා ස්ථාන) එකිනෙකා නමට වෙන්වුණ ට්‍රන්කා පෙට්ටියක්, නොඑසේනම් ලී වලින් තැනූ කුඩා පෙට්ටියක් එකල වැරදුනේ නැත. ඇතැම් සෙබළු මෝටාර්, RPG හෝ කාලතුවක්කු උණ්ඩ බහාලූ පෙට්ටි ද මේ සඳහා යොදා ගැනීම සුලබ විය. තම තමන්ගේ පුද්ගලික බඩුභාන්ඩ සියල්ල තැන්පත් කොට එය පැවතියේ නිරන්තරව අගුලු දමාය. එහි ඇතුළත පෙට්ටියේ බිරිඳගේ හෝ දරුවන්ගේ ඡායාරූපයක් අලවන්නට ද බොහෝ දෙනකු කටයුතු කරන ලද අතර, එය ඔවුනගේ නිවස හා සමවිය. එහි යතුරු කැරැල්ල ද වැඩි ආරක්ෂාවට ඇතැම් සෙබළු තම නිල ඇඳුමේ සාක්කුවකම පරිස්සමින් තබාගන්නට ද වගබලා ගත්තේය.

## පත්තර කියවීම


පොත් කියවීම කෙසේ වෙතත් යුද බිම තුළ එකල පත්තර කියවීම නම් සුලබව සිදුකෙරුණි. විශේෂයෙන්ම එවක මා රාජකාරි කළ මඩකලපු ප්‍රදේශයේ ප්‍රධාන මාර්ගය අද්දර කඳවුරුවලට නොමිලේම පුවත්පත් ලැබෙන අපූරු ක්‍රමයක්ද පුරුදු වී තිබිණ. එනම්, උදෑසන සිට පොලොන්නරුවේ සිට මඩකලපුවට යන සෑම ලොරියකින්ම පාහේ සිංහල පුවත්පත් රැගෙන විත් ඒවා අතරමග ඇති හමුදා කඳවුරුවලට බෙදාදීමය. ඒ අනුව දිනමිණ, සිළුමිණ, සිදේවි, බිරිඳ, සඳරේණු, කුමරි, සමුදුර ආදී පත්තර ඒ අතර සුබල විය. ප්‍රධාන මාර්ගය අසල පිහිට සෑම හමුදා කඳවුරකම මාර්ග බාධකයක් තිබූ අතර, සෑම උදෑසනකදීම එහි රැඳී සිටින සෙබළුන් පුවත්පත් එකතු කිරීම පුරුද්දක් කොටගෙන තිබිණි. ඇතැම්විට එකම වර්ගයේ පුවත්පත් කිහිපයක් ලැබුණු අවස්ථාවල ඒවා යාබද කඳවුරු හා හුවමාරු කරගැනීමටද කටයුතු කෙරිණ. කෙසේ වුවද, සිදේවි හා බිරිඳ පුවත්පත්වලට නම් සෙබළුන් අතර පැවතියේ අධික ඉල්ලුමකි. එවැනි පුවත්පත් එක් කඳවුරකට කිහිපයක් ලැබුණ ද ක්ෂණිකව ඒවා අතුරුදහන් වන සෙයක් ද පෙනෙන්නට තිබිණි.

**පොත් කියවීම කෙසේ වෙතත් යුද බිම තුළ එකල පත්තර කියවීම නම් සුලබව සිදුකෙරුණි. ඒ අනුව දිනමිණ, සිදේවි, බිරිඳ, සඳරේණු, කුමරි, සමුදුර ආදී පත්තර ඒ අතර සුබල විය. ප්‍රධාන මාර්ගය අසල පිහිට සෑම හමුදා කඳවුරකම මාර්ග බාදකයක් තිබූ අතර, සෑම උදෑසනකදීම එහි රැඳී සිටින සෙබළුන් පුවත්පත් එකතු කිරීම පුරුද්දක් කොටගෙන තිබිණි. ඇතැම්විට එකම වර්ගයේ පුවත්පත් කිහිපයක් ලැබුණු අවස්ථාවල ඒවා යාබද කඳවුරු හා හුවමාරු කරගැනීමට ද කටයුතු කෙරිණ. කෙසේ වුවද, සිදේවි හා බිරිඳ පුවත්පත්වලට නම් සෙබළුන් අතර පැවතියේ අධික ඉල්ලුමකි. එවැනි පුවත්පත් එක් කඳවුරකට කිහිපයක් ලැබුන ද ක්ෂණිකව ඒවා අතුරුදහන් වන සෙයක් ද පෙනෙන්නට තිබිණි.**

## මාර්ග බාදක

යුද්ධය පැවති සමයේ තිබූ මාර්ග බාදක අදමෙන් නොවීය. ඒවා ස්ථිර ලෙස මහා පරිමාණයෙන් ඉදිකළ ඒවා විය. එහිදී, වාහන සේම එහි ගමන්ගත් පුද්ගලයින් ද එකල තියුණු පරීක්ෂාවකට භාජනය වූයේය. එය මතුපිටින් සිදුකෙරුණු පරීක්ෂාවක් නොවූ අතර, පුද්ගල සිරුරු පරීක්ෂාවද ගමන්මළු පරීක්ෂාව ද, රථවාහන පරීක්ෂාව ද එකලෙසම සිදුකෙරුණි. එහිදී, කාන්තාවන් වෙනම ද පිරිමින් වෙනමද පරීක්ෂාවට භාජනය වූ අතර, විශේෂයෙන්ම ඒ සඳහා ඔවුන් ගමන්ගත් වාහනවලින් බිමට බැස්සවීමට කටයුතු නොකරන ලද්දේ ගර්භණී මව්වරුන් හා ඇවිදගත නොහැකි තරමේ වයස්ගත වූ හෝ ආබාධ සහිත වූවන් පමණි. ඒ හැරෙන්නට පැවති ආරක්‍ෂක තත්ත්වය හේතුවෙන් එවක පරිසරයේ කිසිවකුටත් මාර්ග බාධකයක දී ගමන් ගන්නා වාහනයෙන් බිමට නොබැස එහි රැඳී සිටීමට කිසිදු අවකාශයක් හිමි නොවීය.

නවත් කොටසක් අප්‍රේල් කලාපයෙන්



## සොබාදහම ඔබට තුති...

ඔබ මවන ලෝකය මනස්කාන්ත
සුන්දර නිමාවකි...
ඔබ මට දුන් දායාදයන් අපමණය
එහෙත් ඔබ එතෙක් මෙතෙක්
මට දුන් අපූර්වතම නිමැවුම
ජෙනිෆර්... මගේ සහකාරිය
සසර පුරා මා හා සරන්නට
හැම භවයේදීම මුණ ගස්සන
ඇය මට දුන් ඔබට තුති...
ඔබේ සෙනෙහසින් මාදු බව
මලක් සේ සුවඳින් මත්කර
මට දුන් පහසින් මා ලද සුවය
නිමක් නැති සසර පුරා
ඇය මා ලඟින් තබනු ඇත
සොබාදහම ඔබට තුති
තනි කරන්නට බැහැ කිසිදින
ඔබ මට දුන් දායාදය
මා නැතිදා මලක් සේ සුරකින්න
සොබාදහම ඔබට තුති...

අජන්ත හේරත්
අයවැය හා මූපඅම - යුහමු

## මවක් වී ගිය නුඹට...

මාවත දිගේ ගිය හැටි මතකද?
ඔය දෑත් අල්ලාගෙන
ඔය උරහිස මත හිස තියාන
වරු ගණන් දුක කීවා මතකද?
නොපෙනී යන නුඹ දෙස
බලා හිඳිමි මම අද
කඳුළු සමඟ ඉතිරි වූ
සුසුම ළඟ....

කෝප්‍රල් හපුතන්ත්‍රී එල්පී
7 ශ්‍රීලංසිරෙ

## ප්‍රාර්ථනා...

සින්දුර් කටාවේ ප්‍රාර්ථනා විමට
මට නොහැකිය
එසේ වීමට අවශ්‍යත් නැත
නමුත්,
ඒ ආදරයට ආදරයෙන්
ආදරය කරමි....
ඔබත් මමත් අතර නොව
ඔහුත් මාත් අතර පමණයි
එවන් ආදර කථාවක්
ගොඩනැගිය හැක්කේ
අවසරයි....
නුඹෙන් වෙන්ව යන්නට
සදාකාලයටම..

ලාකෝ විමලදාස ඊපීවස්කේ
7 ශ්‍රීලංසිරෙ

## අභිමන සිහිකරමි...

හෙළා රුහිරය
මව් දෙරණ මත
පුදා දිවි
නිවහල් දැය
ප්‍රථම කොට
තම ළබැඳියන්
හිතාදරයන් හට
සදා කඳුළක්ම
ඉතිරි කොට
නික්මුනා වුව
නුඹයි දැයේ
අභිමන සිහිකරමි
ගරු කරමි
නැගෙන හිරු
බැසෙන හිරු
ගගන තලයේ
දිලෙන කළ

මේජර් මහේෂ් ජයසුන්දර
විපාරෙ

## නිසල විල...

නොගැඹුරු දිය රළ නංවමින්
හඬනගා...
නිහඬ දියට උපහාස කළද
මතකයේ තිබිය යුතුයි
නිසල විල සැමවිටම
ගැඹුරු බව...

කෝප්‍රල් පින්ශාරිකා ඩබ්ලිවප්පී
11 ශ්‍රීලංසංබ

## හිරු දැක...

නුපුරුදු වුවත් ඔබ හා බැඳි සෙනෙහෙ ලයේ
නොමැකෙන මතක යළි මතකෙට නොගනු ප්‍රියේ
හිරු දැක පිපෙන මානෙල් බිඟු වදෙහි පිරේ
කොඳමල් සුවඳ මිස බිඟු හට රොනට නොවේ

කපිතාන් භවන්ති
ශ්‍රීලයුකාබ

## නුඹ මගේ...

අයිතියක් කියන්නෑ
මගේම දැයි අහන්නෑ
ඔය හිතට ගුලි වෙන්න
දෙපාරක් හිතන්නෑ
ආදරෙයි නොකීවත්
දැන් ඉතින් දුකක් නෑ
නුඹට දුන් ආදරේ
කාටවත් දෙන්නේ නෑ

සඳුන් සෙනෙවිරත්න



## හදවත...

සුසුම් සලන හන්තානක
කඳුළු ගලන මද්දහනක
එක සුදු පැහැ මලක් වෙලා
නුඹ පිපුනිද මගේ ලොවට

ඈ ගියාළු මං දාලා
සුසුම් කඳුළු රන්දාලා
හැර යන කඳුළද සුසුමද
යන්න එපා මං දාලා

ලාකෝ සේනානායක එස්වම්එස්වන්
14 ශ්‍රීලංසිරෙ



# මුල්ලේරියාව සටනේ කොරොතොට ආරච්චිල භූමිකාව...

කෝට්ටේ රජකම් කළ විජයබාහු රජුගේ අත්තනෝමතික පෘතුගීසි ලැදි, ක්‍රියාකලාපය හේතුවෙන් 1521 දී එම රාජ්‍ය කොටස් තුනකට කැඩීයාම නොවැළැක්විය හැකිවිය. ඒ අනුව කෝට්ටේ, සීතාවක, රයිගම වශයෙන් බෙදී ගොස් ඒවා උප රාජ්‍ය වශයෙන් පාලනයට නතු විය. කොලොම්තොට සිටි පෘතුගීසීන්ට මෙම වාතාවරණය අවාසිසහගත කරුණක් ලෙස බලපෑ හේතුව වන්නේ, සමස්ත බලය පෙර පරිදි කෝට්ටේ රාජධානියට පමණක් කේන්ද්‍ර වී තිබුණා නම්, ඔවුන්ට පහසුවෙන් එහි රාජ්‍ය බලය ලබාගැනීමට හැකියාව තිබුණි. එසේම, පසුව කෝට්ටේ පාලනය කළ විජයබා පුත්, පරාක්‍රමබාහු විශේෂ පෘතුගීසීන්ට පක්ෂපාතීත්වය දැක්වුවද, සීතාවක උප රාජ්‍යයේ රජකම් කළ ඔහුගේ සොහොයුරු මායාදුන්නේ දැඩි පෘතුගීසි විරෝධියකු විය. සැබවින්ම, එකල කන්ද උඩරට රාජ්‍යය පෘතුගීසි ආක්‍රමණයෙන් යම්තාක් දුරට බේරුනා නම්, ඒ සීතාවක රාජධානිය යටතේ තැලණි ගම් මිටියාවත, පෘතුගීසි විරෝධී පවුරක් ලෙස භූමියෙහි නැගී සිටීම හේතුවෙනි.

මායාදුන්න රජුගේ පුත් ටිකිරි කුමරු කුඩා කල සිටම පෘතුගීසි විරෝධී රණශූරයකු වූ අතර නිර්භීත භාවයේත්, යුද තාක්ෂණයේත් සේනා සංවිධානයේත්, අතිදක්ෂයකු වීම පෘතුගීසීන්ට එල්ල වූ තවත් මාරක බාධකයකි. රණශූරත්වයේ කෙළ පැමිණි, පසුකාලීනව සීතාවක රාජසිංහ නම් වූ ටිකිරි කුමරු පෘතුගීසීන්ට එරෙහිව ඉතාමත්ම ප්‍රායෝගික හා විධිමත් ලෙස තම සේනා සංවිධානය කළේය. එතෙක් පෘතුගීසීන්ගේ කාලතුවක්කු හා දරුණු වෙඩි බලයට මුහුණ දීමට තිබූ දුන්න, ඊතලය, හෙල්ල වැනි පාරම්පරික මෙන්ම ප්‍රාථමික අවි ආයුධ අත්හැර, ප්‍රබල නවීන යුද ශක්තිය කෙරෙහි ඔහුගේ ඇස යොමු වන්නට විය. රාජසිංහ රජු යුද උපක්‍රම කාරියෙහිදී ඉතා සූක්ෂම විය. ඔහු සිය කටයුතුවල දී රාජ්‍යයේ සේනාපති වූ වික්‍රමසිංහ මුදලිවත් වඩා, මීළඟ හමුදාපති ධූරය අපේක්ෂා කරන, ඒකනායක මුදලි තම කාර්යයන් සඳහා බෙහෙවින් යොදවා ගත්තේය.

කොළඹින් හෝ කෝට්ටේ වාසල වෙතින් සීතාවක රාජ්‍ය ආක්‍රමණයට පෘතුගීසි සේනා පැමිණිය යුතු මාර්ගය වැටී තිබුණේ කොලොන්නාව, මුල්ලේරියාව, අඹතලේ, හේවාගම,

**මුල්ලේරියාව බලකොටුවට පහරදීමට රාජසිංහ රජු තම සේනාවේ කොටසක්, තමා යටතේ තබාගෙන, තවත් කොටස් දෙකක් වික්‍රමසිංහ හා ඒකනායක මුදලිවරුන් යටතට පත් කළේය. තමාගේ දෙපසින් රැඳවූ මෙම සේනාංක දෙක සමඟ රාජසිංහ රජු, පෘතුගීසි බලකොටුව වෙත මැදින් කඩාගෙන ගොස් ඉදුරාම එයට පහර දුන් බව ඉතිහාසයේ සඳහන් වේ. එය මෙරට ඉතිහාසයේ නරපතියකු සටන්බිමේ ප්‍රායෝගිකව ඉදිරිපසින් සතුරා සමඟ මුහුණට මුහුණ සටන් කළ දුර්ලභ අවස්ථාවක් හෝ එකම අවස්ථාව විය හැකි බව පෙනේ.**

කඩුවෙල හංවැල්ල (ගුරු බැවුල) ආදී ප්‍රදේශ ඔස්සේ බැවින් මෙම ප්‍රදේශවල නිරතුරුව සටන් පැවැති බව ඓතිහාසික සාධක කියාපායි. සීතාවක හමුදාව විශාල හමුදාවක් මෙන්ම විධිමත් හමුදාවක් බවට පත්කරන ලද්දේ මායාදුන්නේ රජු නොව ඔහුගේ පුත් රාජසිංහයන් විසිනි. තවද, දුර්වල රයිගම් පුර පාලනයත්, එහි රජුගේ හදිසි අභාවයෙන් පසු එයද තම රාජ්‍යයට ඈඳා ගැනීමට තරම් සීතාවක රජු දක්ෂ විය. එය කෝට්ටේ රාජධානියට එල්ල කළ තවත් මරු පහරකි. සීතාවක රාජසිංහ රජු ඉන්දියාවේ පංජාබ් ප්‍රාන්තයෙන් යුද විශේෂඥයින්, ඉංජිනේරුවන්, යුද ශිල්පීන් මෙරටට ගෙන්වා තම හමුදාවට විධිමත් පුහුණුවක් ලබාදී, සිය බලකොටු තවදුරටත් ශක්තිමත් කළේය. ඔවුන් විසින් නිර්මාණිත කාලතුවක්කු පෘතුගීසීන්ගේ කාලතුවක්කු වලටත් වඩා උසස් බලයකින් යුක්ත වූ බව "කූතෝ" වැනි පෘතුගීසී ලේඛකයන් පවා පසුකාලීනව ලියා ඇත. මූලිකව රාජසිංහ රජුගේ හමුදාව කොටස් දෙකකින් සමන්විත වූ බව පෙනේ. එනම්, ඔහුගේ ප්‍රධාන සේනාපතීන් ලෙස වික්‍රමසිංහ හා ඒකනායක මුදලිවරුන් යටතේ වූ ස්ථිර හමුදාව සහ අතට අසුවෙන විවිධාකාර ඕනෑම ආයුධයක් රැගෙන සටන් පෙරමුණට යන ගම්වැසි හමුදාවය. රාජ්‍ය තුළ අතිදක්ෂ අංගම්පොර සටන් ශිල්පීහු නොඅඩුව සිටියේ මෙම ගම්වැසි හමුදාවන්ගේය.


කඩුවෙල, කොරොතොට කන්ද, බැලුම්ගල මෙන්ම ඒ ආශ්‍රිත ගම් ප්‍රදේශය සංග්‍රාම උපාය මාර්ග වශයෙන් වැදගත් ස්ථානයක් ගත් බව සීතාවක රජු හඳුනාගත්තේය. ඔහුගේ යුද උපක්‍රමශීලී ඥානයෙන්, කෝට්ටේ වාසලට මෙන්ම පරංගි බලයට සමීප මෙම ප්‍රදේශය, ප්‍රායෝගිකව යොදාගත්තේ සටන් පුහුණු මධ්‍යස්ථානයක් ලෙසටය. තවද, එම කඳු මුදුනත යොදාගෙන නිරීක්ෂණ මධ්‍යස්ථානයක් හා බුද්ධි තොරතුරු රැස්කිරීමේ උපායශීලී මධ්‍යස්ථානයක් ලෙස යොදාගන්නට ඇති බව පෙනේ. කඳු මුදුනත ස්වභාවිකව පිහිටි බැලුම් ගල, කොලොම්තොට තෙක් නිරීක්ෂණය කළ හැකි, ප්‍රබල නිරීක්ෂණ මධ්‍යස්ථානයකි. විශේෂයෙන් කෝට්ටේ රාජධානියෙන් එල්ල වන තර්ජනවලට පවුරක් ලෙස, මෙම ප්‍රදේශයේ පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම මෙන්ම, කෝට්ටේ වාසලට හා කොලොම්තොට පෘතුගීසීන්ට සමීප ප්‍රදේශ බැවින්, සතුරාගේ තොරතුරු රැස්කර ගත හැකි සුවිශේෂී ස්ථානයක් ලෙස යොදා ගැනීමටත් රජුගේ අපේක්ෂාව වන්නට ඇත.

කොරොතොට ආරච්චිල නමින් හැඳින්වූ අංගම්පොර සටන් ශිල්පියාගේ, සටන්කරුවෝ සීතාවක රාජසිංහ රජ සමයේ එහි විශේෂ කාර්යභාරයක් ඉටුකළ පිරිසකි. මෙම නිර්භීත සටන්කරුවාගේ මඟපෙන්වීම යටතේ එදා මුල්ලේරියාව කඳවුරට පහරදුන් දරුණු සංග්‍රාමයේ දී, ඔවුන් ඉමහත් කාර්යභාරයක් ඉටුකළ බව ඓතිහාසික ග්‍රන්ථයක් වූ "රාජාවලියේ" පවා සඳහන් වෙයි. ටිකිරි කුමරුගේ දස දහසක් පමණ වූ ස්ථිර හමුදාව මෙන්ම ගම්වැසි අංගම්පොර සටන්කාමීහු, මුල්ලේරියා බලකොටුවට ප්‍රහාර එල්ල කිරීමේ දී, ඉදිරිපෙළ රැඳවුම් මධ්‍යස්ථානය ලෙස කඩුවෙල දේවාල භූමිය ආශ්‍රිත උස් භූමි ප්‍රදේශය යොදාගෙන ඇති බව සඳහන් වේ.

මුල්ලේරියාව බලකොටුවට පහරදීමට රාජසිංහ රජු තම සේනාවේ කොටසක්, තමා යටතේ තබාගෙන, තවත් කොටස් දෙකක් වික්‍රමසිංහ හා ඒකනායක මුදලිවරුන් යටතට පත් කළේය. තමාගේ දෙපසින් රැඳවූ මෙම සේනාංක දෙක සමග රාජසිංහ රජු, පෘතුගීසි බලකොටුව වෙත මැදින් කඩාගෙන ගොස් ඉදුරාම එයට පහර දුන් බව ඉතිහාසයේ සඳහන් වේ. එය මෙරට ඉතිහාසයේ නරපතියකු සටන්බිමේ ප්‍රායෝගිකව ඉදිරිපසින් සතුරා සමග මුහුණට මුහුණ සටන් කළ දුර්ලභ අවස්ථාවක් හෝ එකම අවස්ථාව විය හැකි බව පෙනේ. සීතාවක රජුගේ බලමුළුවල ප්‍රහාරය දැඩිවත්ම පසුපසින් පහරදී පැන යන පෘතුගීසි හමුදා සෙබළ විනාශ කිරීමේ සුවිශේෂී කාර්ය පවරා තිබුණේ කොරොතොට ආරච්චි ප්‍රමුඛ සටන් ශිල්පීහු වෙතය. කොරොතොට ආරච්චිලගේ අංගම් සටන්කරුවෝ මෙම කාර්යය අතිදක්ෂ අයුරින් ඉටුකළ බවත්, එහිදී එම ආරච්චිලගේ සංග්‍රාමයේ නිර්භීත භාවය කැපී පෙනුණු බවත්, ඓතිහාසික පුරාවෘත්ත ලියා ඇති [illegible] තවදුරටත් සඳහන් වේ.

මුල්ලේරියා සටනේදී පෘතුගීසීන් අන්ත පරාජයක් අත්වින්දා සේම මහා ජීවිත හානියක් සිදුකර ගත් බවත්, එහිදී විශාල පිරිසක් ඝාතනය වී ඇත්තේ පසුපසින් පහරදුන් කොරොතොට ආරච්චි ප්‍රමුඛ සටන්කරුවෝ අතින් බවත් සඳහන් වේ. කෙසේ වෙතත්, පසුකාලීනව රාජසිංහ රජුගේ බලය දුර්වල වීමත්, සමගම ඔහු විසින් නගා සිටවූ සංග්‍රාම විධි, සටන් පුහුණු මධ්‍යස්ථාන මෙන්ම එකී සටන් පරපුරවල් අභාවයට ගොස් ඇති බව සිතිය හැකිය.

එකල කොරොතොට පමණක් නොව සිය රාජ්‍ය තුළ විවිධ ප්‍රදේශවල මෙම ගම්වැසි හමුදා නගාසිටුවා, සටන් පුහුණු කිරීම තුළින්, පෙනී යන්නේ රණශූර රාජසිංහ රජුගේ මහා යුද සංවිධාන ශක්තිය හා සංග්‍රාමික නායකත්වයයි. රජුගේ අභාවයත් සමගම පෘතුගීසි බලය යළිත් තහවුරු වීමක් සිදු වූ බව පෙනේ. පෘතුගීසීන්ගෙන් පසු මෙරට ආක්‍රමණිකයන් වූ ලන්දේසී හෝ ඉංග්‍රීසි පාලන කාලවලදී, මෙම කොරොතොට ආශ්‍රිත සටන් පරපුර පිළිබඳ ඓතිහාසික තොරතුරු වාර්තා නොවීමෙන් පෙනී යන්නේ, එකී සටන් මධ්‍යස්ථාන මෙන්ම සටන් පරපුර කාලානුරූපව අභාවයට පත්වී ඇති බවයි. එනම්, සීතාවක රාජසිංහ නම් වූ රණශූරයාගෙන් පසු බිහි වූ රාජ්‍ය නායකත්වය, මෙම සේනා සංවිධාන කාර්යයේ දී වැඩි ප්‍රමුඛතාවයක් නොදුන්නා සේම, එම කාර්යය සංවිධානයේ දී දුර්වල වී ඇති බවයි. තවද, මෙම රණශූර රජුගේ කාලසීමාවෙන් අනතුරුව හේවාගම් කෝරලයේ මෙකී සටන් පරපුරවල් පිළිබඳව අනෙකුත් රාජ්‍ය පාලනයන් වැඩි අවධානයක් යොමුකර නොමැති බව පෙනේ. එබැවින් ඓතිහාසික වශයෙන් විධිමත් ලෙස තහවුරු කරගත හැකි, කොරොතොට ආරච්චිල සටන් පරපුරේ වර්තමාන සාක්ෂි සොයා ගැනීමට නොහැකි වී ඇත.



■ කර්නල්
එම්පීපී පෙරේරා (විශ්‍රාමික)



# Online සූදු මාරයා




උපපනි
ඒබීඅයි
ලක්ෂිත


සූදු නැත්නම් විනෝදයට හා මුදලට ඔට්ටු ඇල්ලීම අද ඊයේ ආරම්භ වූ දෙයක් නොව ලෝකයේ විවිධ රටවල විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ අතීතයේ සිට ක්‍රියාත්මක වන්නකි. ලෝක ඉතිහාසය දෙස විපරම් කර බැලීමේදී විවිධ පාලකයන් සිය විනෝදය උදෙසා ඔට්ටු ඇල්ලීම හා ඊට සම්බන්ධ අභියෝගයන් සහිත තරඟ පැවැත්වීම සුලභව සිදුකර ඇත. ලොව බිහි වූ ශ්‍රේෂ්ඨ ගණයේ පාලකයන්, අධිරාජ්‍යවරුන් පවා ඇබ්බැහි මට්ටමක සිට මෙකී ක්‍රියාවන්හි නිරත වූ බවට ද අපට ඉතිහාසයෙන් සාක්ෂි සහිතව පෙන්වා දිය හැකිය.

කාර්මිකරණයත් සමග ක්ෂේත්‍රයන්හි ඇතිවූ පිබිදීමත් සමගම "මුදලට සූදු ඇල්ලීම" වඩ වඩාත් ලොව පුරා පැතිරියාම ශීඝ්‍ර විය. විශේෂයෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයේ මූලික කරගෙන විවිධ ඔට්ටු ඇල්ලීම වඩාත් ප්‍රචලිත විය. මිනිසුන් සම්බන්ධ වී සිදුකරන ක්‍රීඩාවලට පමණක් නොව සතුන් පවා විවිධාකාරයෙන් යොදා ගනිමින් සූදුවල නිරත වීම කැපීපෙනෙන ලෙස වර්ධනය වීම තුළ ඒ හරහා සිය වෘත්තීය කරගත් පිරිසක් බිහි වීම සිදුවිය. අද වනවිට වඩාත් ඛේදනීය තත්වයක් වී ඇත්තේ ශ්‍රී ලංකාව වැනි වර්ධනය වෙමින් පවතින රටවල් තුළ ජනප්‍රිය යැයි සැළකෙන ප්‍රධාන ක්‍රීඩාවන් සූදුකරුවන්ගේ ග්‍රහණයට නතු වීමත් සමගය. විශේෂයෙන්ම ලෝකයේ වඩාත් ජනප්‍රියම ක්‍රීඩාවක් වන ක්‍රිකට් ක්‍රීඩාවේ ක්‍රීඩකයන් පවා සූදු කරුවන්ගේ රූකඩ බවට පත් වී ඇති ආකාරය පසුගිය කාලය පුරා අපිට ඇසන්නට දක්නට ලැබුණු ප්‍රසිද්ධ කරුණක්ය. මෙහිදී, ඔබගේ අවධානය යොමු කරන්නේ නූතන තාක්ෂණයේ උපරිම තලයක් වන මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ සිදුවන සූදු ක්‍රීඩාවන් පිළිබඳවය.

මාර්ගගත ක්‍රමය අප රට තුළ ප්‍රබලව ප්‍රචලිත වුයේ පසුගිය කාලයේ අප මුහුණදුන් ආර්ථික හා සමාජීය ලෙස මතු වූ තත්වයන් සමගය. කොරෝනා වසංගතයත් සමග කුඩා තරුණ මහළු භේදයකින් තොරව ස්මාර්ට් ජංගම දුරකතන සමග සමීප වීම හා නිකරුණේ කාලය ගතකිරීමට ඉඩ සැලසීම තුළ විවිධාකාර දුරාචාර විශාල ප්‍රමාණයක් අපට අසන්නට දකින්නට ලැබිණ. ඒත් සමගම විශේෂයෙන්ම "ඔන්ලයින් මුදල් ඉපයීම" පදනම් කරගෙන ජාවාරම්කරුවන්ගේ වැඩි ඉස්මතු වීමක් අද වනවිටත් වර්ධනය වෙමින් පැවතීම ඛේදනීය කාරණාවක්ය. මෙවැනි ව්‍යාපාර ලොව පුරා ප්‍රසිද්ධ මෙන්ම විවිධ රටවල්වල ඇතිව ක්‍රියාත්මක වන මහා පරිමාණ ව්‍යාපාර පවට පත්ව ඇති අතර, එහිදී APP ලෙස බිහි වන මුදලට ඔට්ටු ඇල්ලීමේ පහසුකම සපයා දෙන මෘදුකාංග භාවිතය මෑත වසර කිහිපය තුළ ලංකාවේ විශාල ලෙස ප්‍රචලිත වී ඇත. පාසල් යන දරුවාගේ සිට විශ්‍රාම සුවයෙන් කල් ගෙවන වැඩිහිටියා දක්වා බොහෝ පුද්ගලයින් සිය ප්‍රධාන ඉලක්කයක් බවට මෙම APP හරහා සිදුකරන සූදු ඇල්ලීම පත්කර ගෙන ඇත.

එම APP වලට අනවශ්‍ය ලෙස ඇබ්බැහි වූ පසු සිදුවන්නේ කුමක්ද යන ප්‍රශ්නයට නිවරදි පිළිතුරක් තෝරා බේරාගැනීමට නොහැකි වූ තත්වය තුළ උද්ගත වන්නේ විශාල පරිහානියකි. ඇතැම් විට එම APP සූදු ක්‍රීඩාවල මුල්කාලීනව ලබන වාසි හා ලාභ නිසා තම සියල්ල ඔට්ටු මුදල් බවට හැරවීම නිසකවම සිදු වන්නකි අනතුරුව සිය ධනය දේපල ආදිය පමණක් නොව තම ජීවිතය පවා ඔන්ලයින් සූදු මාරයාට භාරදීමට සිදු වනු ඇත. එවැනි අවස්ථා මෑත කාලීනව වැඩි වශයෙන් අපට අසන්නට දකින්නට ලැබිණ.

එහිදී, සිය තරාතිරම්, රැකියා පසුබිම හා ජීවන තත්ත්වයන් ගැන පවා නොසිතමින් මෙම APP හරහා සිදුවන ඔට්ටු ඇල්ලීම සිදුකර අනතුරුව විශාල ලෙස ණය වී සියදිවි නසා ගැනීම් දක්වා මෙම සූදුව මාරාන්තික වනු ඇත. ඒ අනුව මෙරට වැඩි ප්‍රමාණයක් රාජ්‍ය සේවකයින් මෙම APP භාවිතය අර්ධ කාලීනව රැකියාවක් බවට පත් කරගෙන මුදල් ඉපයීමට යොමු වී ඇති අතර, රැකියා විරහිත ඇතැම් තරුණ ප්‍රජාව මෙය පූර්ණකාලීන වෘත්තිය බවට පත්කරගෙන තිබීම කණගාටුවට කාරණයකි. එමෙන්ම ඒ හරහා බරපතල සමාජ පරිහානික් ද සිදුවනු ඇත.

එහෙත්, මෙවැනි APP භාවිතය ලොව ප්‍රධාන පෙළේ රටවල පවා ප්‍රසිද්ධියේ භාවිතා වන්නේ කෙසේද යනු ප්‍රශ්නය ඔබ අපට නිතනිතින්ම පැනනැගේ. ප්‍රසිද්ධ ක්‍රීඩා හරහා මෙන්ම විශේෂාංග වැඩසටහන් තුළ සිය ප්‍රචාරනය සිදු කරන මෙම APP තුළ නිරත වෙමින් එය සිය ප්‍රධාන වෘත්තිය බවට පත්කර ගෙන සිටින පුද්ගලයින් ද ඕනෑ තරම්ය. ඔවුන් දෙස හොඳින් අවධානය යොමුකර බලන්නකුට පෙනෙන ප්‍රධානම කරුණක් වන්නේ ඔවුන් නිවැරදි අධ්‍යනයකින් හා

නිවැරදි ක්‍රමවේදයන් ඔස්සේ එම යෙදවුම් භාවිතා කරන ආකාරයය. එහෙත්, මුදලට කෑදර ස්වයං විනයක් නොමැතිව අනවශ්‍ය ලෙස ඇබ්බැහිවීම තුළ වන්නේ අකාලයේ සිය ජීවිත ගමන පරිහානියට පත්කරගැනීම නොවේද.

වර්තමානයේ බොහෝ රැකියාවල උපයන මුදල අප සෑහීමට පත්වන තත්වයක් නොමැති බව සැබෑය. එහෙත්, එයට පිළියම මෙවැනි ඔට්ටු ඇල්ලීම් වැනි කෙටි කාලීන මැජික් ක්‍රමයක් නොවේ. නීත්‍යානුකූල අර්ධකාලීන රැකියා අවස්ථා ඕනෑ තරම් වර්තමානයේ සොයා ගත හැකිය. එමෙන්ම, කෘෂිකාර්මික නිශ්පාදන ආදී අර්ධකාලීනව රැකියා අවස්ථා නිර්මාණය කර ගැනීමට අප උත්සහ විය යුතුය. අත් දෙක බැඳ පසක තබාගෙන කෙටි ක්‍රම මඟින් මුදල් ඉපයීමට යාම තුළ අවසානයේ අපට හිමි වන්නේ සමාජයේ සිටින මාරදූතයින් වැනි වංචාකාරයින්ගේ (Online) මඟඩිවලට රැවැටී මානසික සතුට පවා නැතිකර ගනිමින් තමා සතු සියල්ල හමාර කරගැනීම නොවේද?

මොහොතකට සිතන්න... ඔබ තුළ පවතින දක්ෂතා, කුසලතා ප්‍රයෝජනයට ගනිමින් ආර්ථිකය ගොඩ නඟාගැනීම විනා කෙටිකාලීන ක්‍රමවේද හරහා විශේෂයෙන්ම අප මේ කතා කරන online app සූදු ක්‍රීඩා හරහා උපයන මුදල දීර්ඝකාලීනව යොදාගත නොහැකි සරලවම මැජික් මුදල් මවා පාන මාරයාට පවා අත වනමින් දැලී පිහියෙන් කිරි කෑමක් වැනිය. දැනටමත් ඔබ එවැනි සූදු ක්‍රීඩාවල නියැලෙන පුද්ගලයකු නම් තවමත් ඔබ පරක්කු නොමැත. සිය ජීවිතය හා පවුල තුළින් සමාජ වටිනාකම රැකගනිමින් තෘප්තිමත්ව රටට සමාජයට ණය නොවී ජීවත්වීමට හුරු වී සියල්ල පාලනය කර ගත හැකි දියුණු මනසක් ඇති මිනිසකු ලෙස තාක්‍ෂණික ලොව නිවැරදිව ග්‍රහණය කරගැනීමට අවැසි ශක්තිය ඔබ සතුය. එසේනම්, දැන්වත් ඒ ගැන සිතා වගකීම් සහගත ලෙස දූරදක්නා නුවණින් යුතුව අනාගතය උදෙසා පිඹුරුපත් සකස් කරන්න.

# දිනූ බිම රකින්නට වරම් ලැබ





පුත්තලම, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආධුනික පුහුණු මධ්‍යස්ථානයේ පුහුණුව ලැබූ ආධුනික සෙබළුන් 421 දෙනෙක් මාස හයක කාලසීමාවක් පුරාවට සිදුකළ පුහුණුව සාර්ථකව අවසන් කර 2025 පෙබරවාරි මස 14 වන දින අභිමානවත්ව විසිර ගියහ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආධුනික පුහුණු මධ්‍යස්ථානයේ සේනාවිධායක ලුතිනන් කර්නල් ආර්ජේඑන් සුබසිංහ අයිජී ගේ ආරාධනයකට අනුව මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස 58 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති සහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජේකේආර් ජයකොඩි ආර්ඩබ්ලිව්පී යූඑස්පී සහභාගි විය. එහිදී, ප්‍රධාන අමුත්තා අතින් පාඨමාලාවේ දක්ෂතම ආධුනික සෙබළා, හොඳම ශාරීරික යෝග්‍යතාවයෙන් හෙබි සෙබළා සහ දක්ෂතම වෙඩික්කරුට හිමි සම්මාන පිරිනැමිණි. මෙම අවස්ථාවට නිලධාරීන්, සෙසුනිලයන් සහ විසිරගිය ආධුනික සෙබළුන්ගේ පවුල්වල සාමාජිකයන් ඇතුළු විශාල පිරිසක් සහභාගි වූහ.

# මහැඟි පරිත්‍යාගයක්



පොළොන්නරුවේ පිහිටි පැරකුම් වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන් සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් පෙබරවාරි මස 27 වන දින නැගෙනහිර ආරක්‍ෂක සේනා ආඥාපතිගේ මගපෙන්වීම යටතේ එම මූලස්ථාන භටපිරිස් එකතුව සිදුකළහ. කොළඹ තරුණ පදනමේ සම්බන්ධීකරණයෙන් සිදුකළ මෙම වැඩසටහනට නැගෙනහිර ආරක්‍ෂක සේනා මූලස්ථානයේ නිලධාරීන්, සෙසුනිලයන් සහ තරුණ පදනමේ සාමාජිකයන් රැසක් එක්වූහ.




## තබමු පියවරක් - හදමු සැලසුමක්
## තනමු වැඩ ලොවක් - දිනමු ලෝකයක්

# "පුද්ගලික සංවර්ධන සැලසුමක් නිර්මාණය කරමු"
# (Personal Development Plan)




■ දිල්මි ශානුකී

වාණිජවේදී (විශේෂ) උපාධිධාරී

පේරාදෙණිය විශ්ව විද්‍යාලය.


ජීවිතයේ විවිධ හැල හැප්පීම් මධ්‍යයේ ජීවන සටනක නිරතවන ඔබට සාර්ථකත්වය කරා පිය නගන විට නොයෙකුත් අභියෝගයන්ට මුහුණ දීමට සිදුවේ. එලෙස කටයුතු කිරීමේදී විටෙක දරාගත නොහැකි මානසික පීඩාවක් දැනෙන්නට පුළුවන. මෙහිදී විශේෂයෙන්ම සලකා බැලිය යුතු කරුණ නම්, ජීවන ජයග්‍රහණයෙන් ඔබව වළක්වන ප්‍රධානතම සතුරන් බොහෝවිට හමුවන්නේ බාහිර ලෝකයෙන් යැයි ඔබ සිතා සිටිය ද, එම සතුරන් සැබෑ ලෙසම ඔබට මුණ ගැසෙන්නේ ඔබ තුළින්මයි. එම සතුරන් ඔබ විසින් නිවැරදිව හඳුනා නොගැනීම සහ සතුරන් පරාජය කිරීමට කිසිදු උත්සාහයක් නොගැනීම තුළින් ඔබේ ජීවිතයේ බොහෝ අවස්ථා ජයග්‍රහණයකින් තොරව අවසන් වනු ඇත. ඔබේ ජීවන ගමන සාර්ථකත්වයෙන් ඔබ්බට රැගෙන යාමට ඔබට අවශ්‍ය නම් තම අභ්‍යන්තරයේ අවසරයකින් තොරව ලැගුම් ගෙන සිටින සතුරන් නිවැරදිව හඳුනාගෙන පරාජය කිරීමට මේ මොහොතේ සිටම සැලසුම් සහගතව මෙහෙයුමක් දියත් කළ යුතුමය. ක්‍රියාන්විත රාජකාරියේ නියුතු ඔබට "මෙහෙයුමක් දියත් කිරීම" යන වදන කන වැකුණු සැනින් හුරුපුරුදු බවක් සිතට දැනෙනවා මෙන්ම දශක තුනකට අධික කාලයක් තිස්සේ පැවති යුද්ධමය වාතාවරණයේ සිදුවීම් සිහියට නැගෙනු ඇත. නමුත් මෙහිදී සඳහන් කරන මෙම මෙහෙයුම දියත් කරනු ලබන්නේ හුදෙක් සතුරු භූමියකම නොව ඔබගේ පුද්ගල අභ්‍යන්තරයේ සිට ඔබ සමග සටන් වදින සතුරන්ට එරෙහිවය. එම බිහිසුණු සටන් භූමිය පවතින්නේ ඔබගේ සිත තුළ වීම විශේෂත්වයකි.

දශක තුනකට අධික කාලයක් තිස්සේ අප මුහුණ දුන් යුද්ධමය වාතාවරණය හමුවේ එවකට යුද භූමිවල ක්‍රියාන්විත රාජකාරියේ නියුක්තව සිටි ඔබගේ අපරිමිත චිත්ත ශක්තිය සම්බන්ධයෙන් සිවිල් සමාජය තුළ වාද විවාදයක් නොමැති තරම්ය. ජීවිත පරිත්‍යාගයෙන් ඔබ කළ මෙහෙවර අගය කරන්නට ලබා දිය හැකි ඉහළම ගෞරව සම්මානයෙන් පිදුම් ලැබුව ද, ඔබගේ මෙහෙය එලෙසින් අගය කර නිම කළ නොහැකිය. අනන්ත වූ දුක් ගැහැට විඳිමින් තම ශරීර

**ඔබ පිළිබඳව නිවැරදි අවබෝධයක් පවතින්නේ ඔබටම පමණි. ඔබගේ ජීවිතයට නිවැරදි තක්සේරුවක් ලබාදිය හැක්කේ ද ඔබටම පමණි. ඔබ කවුරුන්ද යන වග නිවැරදිව දන්නේ ඔබම පමණකි. ඔබ සතුව සැඟව ඇති විශේෂ ශක්තීන් තිබෙන්නට පුළුවන. නමුත් එම ශක්තීන් ආවරණය වී පවතින තාක්කල් ඔබට එය සොයා ගැනීමට අසිරු විය හැක. ඔබ විසින් නිරන්තරයෙන් උත්සාහ කළ යුත්තේ තමා තුළ සැඟවී පවතින දක්ෂතාවයන් සහ ශක්තීන් හඳුනාගෙන එය තවදුරටත් ඔපමට්ටම් කර ගැනීමටයි.**



අවයව දන් දීමෙන් පමණක් නොව තම මුළු ජීවිතයම පූජා කර අප මාතෘ භූමිය සතුරාගෙන් මුදවාගෙන නිදහස් නිවහල් ජාතියක් ලෙස නැගී සිටීමට ඔබ කළ මෙහෙය වෙනුවෙන් ඔබට මෙන්ම ඔබගේ පවුලේ සමීපතමයින්ට නිසි ඇගයුමක් ලබා දෙන්නේ දැයි ප්‍රශ්නාර්ථයකි. එලෙස සටන් වැදීමට පුද්ගල අභ්‍යන්තරයේ පැවති ශක්තිය, ස්වයං විනය මෙන්ම එළඹ සිටි සිහියෙන් කටයුතු කිරීම මහා පිටුවහලක් වූ බවට නොරහසකි. "රණවිරුවා" යනු වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ස්වයං විනයකින් හික්මුණු, ජවසම්පන්න, නිවැරදි ඉලක්ක පසුපස හඹා යැමේ සුවිශේෂී දක්ෂතාවයක් පෙන්නුම් කරන අසහාය පුද්ගලයෙකි. එකී පුද්ගලයාගේ ගෞරවය මෙන්ම නිල ඇඳුමෙහි ගෞරවය ද එලෙසින්ම ආරක්ෂා කර මතු පරපුරට ද එය අවශෝෂණය කරවීම ඔබගේ වගකීමක් ලෙස සලකා කටයුතු කළ යුතුය. ඒ අනුව, වෘත්තීය ජීවිතයේ සාර්ථකත්වය මෙන්ම පෞද්ගලික ජීවිතයේ දියුණුව උදෙසා ක්‍රියා කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳ කෙටි හැඳින්වීමක් මෙම ලිපිය මඟින් ඉදිරිපත් කරනු ලැබේ.

අපගේ ජීවිතය ෂෘණාත්මක දිශාවට ඇද දමන සැබෑ සතුරන් කවුරුන් ද යන වග නිවැරදිව අවබෝධ කර ගැනීම තුළින් ඔබට ළඟා කර ගත හැකි සාර්ථකත්වයේ සීමා මායිම් මෙතෙකැයි කියා නිර්ණය කළ නොහැකි තරම්ය. සාර්ථකත්වයේ හිනි පෙත්තටම ගමන් කරන්නකුට "පුද්ගලික සංවර්ධන සැලසුමක්" *(Personal Development Plan)* තිබීම අත්‍යාවශ්‍යම අංගයකි. මෙකී පුද්ගලික සංවර්ධන සැලසුමක් ගොඩනගා ගැනීම වෙනුවෙන් "*SWOT* දෛශිකය" නැතිනම් "*SWOT* විශ්ලේෂණය" *(SWOT Analysis)* පිළිබඳව සුළු වශයෙන් හෝ දැනුමක් ලබා ගැනීම ජීවිත ප්‍රගමනයට දායක වන බව නොඅනුමානයි.

*SWOT* විශ්ලේෂණය පහත සඳහන් වචනවල මුල් අකුරු මූලික කොටගෙන නිර්මාණය වී ඇති සංකල්පයකි. ඒ අනුව එම සංකල්පය අභ්‍යන්තර සාධක හා බාහිර සාධක වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකි අතර, එය පහත පරිදි සරලව නිර්වචනය කළ හැකියි.

S - STRENGTHS (ශක්තීන්)
W - WEAKNESSES (දුර්වලතා)
} **අභ්‍යන්තර සාධක ( Internal Factors)**

O - OPPORTUNITIES (අවස්ථාවන්)
T - THREATS (තර්ජන)
} **බාහිර සාධක ( External Factors)**

*SWOT* විශ්ලේෂණයේ අභ්‍යන්තර සාධක ලෙස ශක්තීන් හා දුර්වලතාවයන් සලකනු ලබන අතර, අවස්ථාවන් හා තර්ජන බාහිර සාධක යටතට ගැනේ. එම සාධක තම ජීවිතයට සම්බන්ධ කොටගෙන වර්ධනය කරගත යුතු සාධක දියුණු කර ගැනීමටත්, මග හරවා ගතයුතු සාධක අවම කර ගැනීමටත් ස්වයං විනයකින් යුක්තව කටයුතු කළ යුතුය.

ඔබ පිළිබඳව නිවැරදි අවබෝධයක් පවතින්නේ ඔබටම පමණි. ඔබගේ ජීවිතයට නිවැරදි තක්සේරුවක් ලබාදිය හැක්කේ ද ඔබටම පමණි. ඔබ කවුරුන්ද යන වග නිවැරදිව දන්නේ ඔබම පමණකි. ඔබ සතුව සැඟව ඇති විශේෂ ශක්තීන් තිබෙන්නට පුළුවන. නමුත් එම ශක්තීන් ආවරණය වී පවතින තාක්කල් ඔබට එය සොයා ගැනීමට අසිරු විය හැක. ඔබ විසින් නිරන්තරයෙන් උත්සාහ කළ යුත්තේ තමා තුළ සැඟවී පවතින දක්ෂතාවයන් සහ ශක්තීන් හඳුනාගෙන එය තවදුරටත් ඔපමට්ටම් කර ගැනීමටයි.

ඔබට ඔබ පිළිබඳව කලකිරීමක් ඇති කරවන ආකාරයේ හැඟීම්වලින් හෙම්බත් වී සිටින විටෙක "සම්මා සතිය" හෙවත් නිවැරදි සිහියක සිත පිහිටුවා ගැනීම පළමුවෙන්ම සිදුකළ යුතුය. ඉන්පසු තම ජීවිතය අසාර්ථක වීම කෙරෙහි බලපෑම් කරන ලද කරුණු පිළිබඳව ස්වයං සමාලෝචනයක නිරත විය යුතුය. එහිදී තම දුර්වලතාවයන් නිවැරදිව අවබෝධ කරගත් සැනින් එකී සතුරන් පළවා හැරීමට අවශ්‍ය පියවර ගත යුතුයි. ඒ සඳහා තාවකාලික පැලැස්තර නොදා ස්ථිර පිළියම් යෙදීමට සිත දියුණු කර ගත යුතුයි.

ඔබ විසින්ම අවදි කරවන තෙක් ඔබ තුළ නිදන්ගතව පවතින ශක්තීන් නිවැරදිව හඳුනාගෙන වර්ධනය කර ගැනීමට පහත කුඩා පියවරයන් ඔස්සේ ඔබටම තනිව ගමන් කළ හැකි බව මතකයේ රඳවා ගන්න.

### • නිර්මාණශීලීත්වය කෙරෙහි උනන්දුවක් දක්වන්න.

චිත්‍ර ඇඳීම, සංගීතමය නිර්මාණ, ගෙවතු වගාව, සරල අත්කම් නිර්මාණ, සාහිත්‍ය නිර්මාණකරණයේ නියැලීම (කවි, ගීත, නිසදැස්, රචනා) මඟින් ඔබගේ අදහස් නිදහසේ ප්‍රකාශ කළ හැකි අතරම එතුළින් ඔබ තුළ සැඟවී ඇති ශක්තීන් හඳුනා ගැනීමට අවස්ථාවක් නිර්මාණය කර ඇත. මෙවැනි ක්‍රියාකාරකම්වල නිරත වීම මොළය ලිහිල් කිරීමට ඉඩ සලසයි. නිර්මාණශීලීත්වය ඔබේ මනස නිරන්තරයෙන් ප්‍රබෝධමත්ව තබා ගැනීමට උපකාරී වේ.

### • අර්ථවත් සංවාදවල නිරත වෙන්න.

සමහර විටෙක ඔබට මතුපිට තිබෙන ඉතාමත් සරල කතාවලට වඩා ගැඹුරු, අර්ථවත් සාකච්ඡා අවශ්‍ය වේ. සැබැවින්ම ඔබට සවන් දෙන්නකු සමග ඔබේ

සිතුවිලි පිළිබඳව කතා කිරීමෙන් මානසික වෙහෙස අවම කර අලුත් බලාපොරොත්තු කෙරෙහි සිත යොමු කරවයි.

**● සෘණාත්මක සිතුවිලිවලට අභියෝග කරන්න.**

ඔයාට කරන්න බැහැ කියලා හිතෙන සෑම විටෙකම, "නැහැ මම උත්සාහ කර බලනවා, මට පුළුවන් " යනුවෙන් සිතන්න පුරුදු වෙන්න.

මම පැරදුනොත් අනිත් අය මට හිනාවෙයි යන සිතුවිල්ල ආ සැනින් "අසාර්ථකත්වය යනු සාර්ථකත්වයේම කොටසක් වන හෙයින් පරාජයෙන් මට බොහෝ අතපසු වූ තැන් පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට පුළුවන්" යැයි සිතන්න.

අනිත් අය මට වඩා හොඳයි, එයා මට වඩා ගොඩක් දක්ෂයි, හැමෝම අගය කරන්නේ එයාවම විතරයි යන හැඟීම ඇති වූ විට "මගේ ගමන අද්විතීයයි, මට මගේම කියල ශක්තීන් තියෙනවා, මට හොඳ ආත්ම විශ්වාසයක් තියෙන නිසා මගේ ගමන මට තනිවම යන්න පුළුවන්" යැයි සිතන්න සිත පුරුදු කර ඒ අනුව වැඩ කරන්න. ආත්ම විශ්වාසය සමඟ දිනපතා සංවාදයේ යෙදෙන්න.

**● හෙට දිනට අද දින පියවරක් තබන්න.**

ඔබගේ සිත තුළ විශාල සැලසුමක් තිබෙන්නට පුළුවන. නමුත් ඒ සඳහා ඔබ තවම සූදානම් නැති බවක් හැඟෙන්නට පුළුවනි. සැලසුම පිළිබඳව පියවරක් ගැනීමට ඔබට සියයට සියයක විශ්වාසයක් දැනෙන තුරු කාලය ගත කරමින් බලා සිටීමෙන් ඔබ සඳහටම බලාපොරොත්තුවෙන් පමණක් සිටින බව අදහස් වේ. ඉතා කුඩා වුවද සැලසුම වෙනුවෙන් යම්කිසි පියවරක් ගැනීමේ ක්‍රියාව තුළින් විශ්වාසය වර්ධනය වේ.

සැලසුම ආරම්භ කිරීමට සියල්ල සම්පූර්ණ වන තුරු බලා නොසිට සිතට එකඟව ඔබට නිවැරදි යැයි හැඟෙන තැනින් එය ආරම්භ කරන්න. සැලසුම වෙනුවෙන් තබන සෑම පියවරක්ම විශ්වාසය තමන් සතු කර ගනිමින් කටයුතු කිරීමේදී තමන්ගේ ශක්තීන් වැඩිදියුණු කර ගැනීමට හැකියාව පවතී.

දුබලතා පිළිබඳව වෙහෙසෙනවා වෙනුවට ශක්තීන් කෙරෙහි අවධානය යොමු කරන්න.

ලෝකයේ සිටින කිසිදු පුද්ගලයෙකු හෝ භෞතික වස්තුවක් ගත් කළ කිසිවිටෙක සර්ව සම්පූර්ණ වන්නේ නැත. ඔබට නොමැති දේවල් පිළිබඳව නැවී නැවී සිතමින් සිටිනවාට වඩා ඔබ දැනටමත් සතුකරගෙන ඇති දේ කෙරෙහි අවධානය යොමු කිරීම ඉදිරි ගමනට පහසුවකි.

ඔබගේ ශක්තීන් මොනවාද? ඔබ මේ වනවිට අත්පත් කරගෙන ඇති ජයග්‍රහණ මොනවාද? ඔබ සතු කුසලතා මොනවාද? ඔබගේ විශේෂ හැකියාවන් මොනවාද? යන්න පිළිබඳව අවධානය යොමු කර ඔබගේ ජීවිතයේ ඔබ අත්පත් කරගත් කුඩා ජයග්‍රහණ ඉතාමත් සරලව තනිවම සමරන්න. තමන් ලැබූ ජයග්‍රහණ පිළිබඳව නැවත මතක් කර බලන්න. එවිට ඔබ හැකියාවන් ඇත්තෙකු බව ඔබ ඔබටම පසක් කර දෙනු ඇත.

**● දිරි ගැන්වීම් තුළ රැඳී සිටින්න.**

සෑම දිරිගැන්වීමක් තුළින්ම ස්වයං විශ්වාසය වර්ධනය වීමක් සිදුවේ. ඔබ නගා සිටුවීමට හැකි ඔබව විශ්වාස කරන පුද්ගලයින් වටා රැඳී සිටින්න උත්සාහ කරන්න. ඔබේ ශක්තීන් සොයා යන ගමනේදී ඔබේ මනස හැඩගැස්වීමට ඔබ වටා සිටින පිරිස ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරන බැවින් දිරිගන්වන්නන් සමඟ නිතර රැඳී සිටීමට උත්සාහ කරන්න.

**● කාලය ඵලදායී අයුරින් ගත කරන්න.**

ජීවිතයේ තේරුමක් නැති දේවල් වෙනුවෙන් කාලය කොයි තරම් නම් අපි වැය කරනවාද? ආපහු හැරිලා බලද්දී නිකරුණේ ගෙවුණු විනාඩි එකතු වෙලා පැයවල්, පැයවල් එකතු වෙලා දවස්, සති, මාස, අවුරුදු ගණන් ගෙවිලා ඇති. ඔබට ඉතුරු වෙලා තියෙන කාලය නිකරුණේ නාස්ති නොකර භාවිතා කරන්න පුළුවන් නම්, "හැම විනාඩියක් ම අපිට වැඩක් කරන්න පුළුවන් ප්‍රයෝජනවත් විනාඩියක්"

මම මේ සඳහා පොඩි උදාහරණයක් දෙන්නම්. ඔබ පාරේ ඇවිදිමින් සිටින විට රුපියලක් බිම වැටී තිබෙන අවස්ථාවක් පිළිබඳව සිහියට නගා ගන්න. ඔබ කිසිලෙසකින්වත් එය අහුලා ගැනීමට බිමට නැමුරු නොවනු ඇත. රුපියල පිළිබඳව අමතක කර ඔබ ඔබගේ ගමනෙහි නිරත වනු ඇත. නමුත්, එතැන රුපියල් පනහක හෝ සියයක නෝට්ටුවක් වැටී තිබෙනවා

ඔබ පාරේ ඇවිදිමින් සිටින විට රුපියලක් බිම වැටී තිබෙන අවස්ථාවක් පිළිබඳව සිහියට නඟා ගන්න. ඔබ කිසිලෙසකින්වත් එය අහුලා ගැනීමට බිමට නැමුරු නොවනු ඇත. රුපියල පිළිබඳව අමතක කර ඔබ ඔබගේ ගමනෙහි නිරත වනු ඇත. නමුත්, එතැන රුපියල් පනහක හෝ සියයක නෝට්ටුවක් වැටී තිබෙනවා දුටු විට ඔබ කුමක් කරනු ඇත්දැයි මඳක් සිතන්න. සමහර විටෙක ඔබ ඔබගේ ගමන මදක් නතර කොට අදාල මුදල් නෝට්ටුව අහුල ගනීවි. එහිදී ඔබට අමතක වූ කාරණාවක් ඇත. එනම්, රුපියල් පනහ හෝ රුපියල් සියය ඇතුළෙත් රුපියලේ වටිනාකම ගොඩ ගැසී ඇති බව මෙන්ම රුපියලේ කාසි එකතුවෙන් අදාල මුදල් නෝට්ටුව නිර්මාණය වී ඇති බව.

දුටු විට ඔබ කුමක් කරනු ඇත්දැයි මඳක් සිතන්න. සමහර විටෙක ඔබ ඔබගේ ගමන මදක් නතර කොට අදාළ මුදල් නෝට්ටුව අහුල ගනීවි. එහිදී ඔබට අමතක වූ කාරණාවක් ඇත. එනම්, රුපියල් පනහ හෝ රුපියල් සියය ඇතුළෙත් රුපියලේ වටිනාකම ගොඩ ගැසී ඇති බව මෙන්ම රුපියලේ කාසි එකතුවෙන් අදාළ මුදල් නෝට්ටුව නිර්මාණය වී ඇති බවත් ඔබගේ මතකයෙන් ගිලිහී ගොස් ඇත.

ඒ වගේම තම ජීවිතය අන්තිම තත්පරෙන් බේරුණු පුද්ගලයකුගෙන් ජීවිතයේ වටිනාකම අහන්න, එක තත්පරයකින් තමන් සතු සියලුම දේවල් අහිමි වුණු කෙනකුගෙන් කාලයේ වටිනාකම අහන්න. එවිට ඔබටම සිතේවි කාලයට වටිනාකමක් දෙන්න.

එමෙන්ම ඔබගේ ජීවිතයේ රැඳී පවතින බැඳීම් දෙස අවබෝධයෙන් බලන විට බැඳීම් කියන්නෙත් ඔබේ ජීවිතයේ විනාඩි, පැය, දවස්, සති, මාස, අවුරුදු වලින් ඔබ ගෙවීම් කරපු වටිනාකම්වල එකතුවකි.

ඔබගේ ජීවිතයේ වටිනා කාලය වැය කරන්නේ ඒ කාලයට වටිනාකමක් දෙන්න පුළුවන් කෙනෙක් හෝ දෙයක් වෙනුවෙන් ද කියල නැවත වරක් සිතා බලන්න. එසේ නොමැතිව ඔබ බොහෝවිට නොවටිනා බැඳීම් සහ භෞතික දේවල් වෙනුවෙන් ඔබේ වටිනා කාලය වැය කරන අවස්ථා බහුලයි. ඒ ගෙවුණු සෑම විනාඩියක්ම ඔබගේ කාලයයි. ඔබගේ සිහින අරමුණු වෙනුවෙන් යොදා ගැනීමට ඉතිරිව තිබූ කාලයයි. ඔබ ගෙවන සෑම විනාඩියක් තුළම ඔබගේ ජීවිතයේ අලුත් පිටුවක් වෙනුවෙන් වටිනාකමක් ගැබ්ව තිබෙන බව සිහියට ගන්න. ඒ නිසා මේ ගෙවන සෑම විනාඩියකම ලියැවෙන්නේ ඔබගේ අනාගතයයි. එබැවින් කාලය ඉතාමත් පරිස්සමට නාස්ති නොකර ප්‍රයෝජනයට ගත හැකි අයුරු සිතා බැලීමට ඉඩ ප්‍රස්තාවන් නිර්මාණය කළ යුතු අතර, එතුළින් පසුතැවීමට කාලයක් ඔබට ඉතිරි නොවනු ඇත.

අනවශ්‍ය සබඳතා වෙනුවෙන් කරනු ලබන කැපවීම් සහ විෂ සහිත සබඳතාවයන් ඔබව මානසික වෙහෙසට පත් කරවන අතර, එය මගහරවා ගැනීමෙන් කාලය හා ශක්තිය ආරක්ෂා කර ගත හැකිය.

ඒ අනුව, මෙම ලිපිය මගින් *SWOT* විශ්ලේෂණයේ අභ්‍යන්තර සාධක දෙකෙහි මුල්ම සාධකය වන ඔබ තුළ පවතින ශක්තීන් නිවැරැදිව හඳුනා ගැනීමට ඔබ කළ යුත්තේ කුමක්ද යන්න පිළිබඳව කෙටි හැඳින්වීමක් සිදුකර ඇත. ඔබගේ ශක්තීන් මොනවාද යන්න අවබෝධයෙන් යුක්තව නිවැරැදිව හඳුනා ගැනීම තුළින් ඔබට ජීවිතයේ යම්කිසි ප්‍රගතියක් අත්කර ගැනීමට හැකි වේ යැයි අපේක්ෂා කෙරේ.

*SWOT* විශ්ලේෂණයේ අනෙකුත් සාධක ඔබගේ සාර්ථකත්වයට දායක කර ගත හැක්කේ කෙසේද යන්න පිළිබඳව ලබන කලාපයේ ලිපියෙන් විස්තර කරනු ලැබේ.

"රණවිරුවා" වෙනුවෙන් ඔබ ඇසූ දුටු, අත්විඳි, අසා ඇති ඕනෑම හාස්‍යජනක සිද්ධියක් නිර්මාණශීලීව අප වෙත ලියා එවන්න. එසේ එවනු ලබන නිර්මාණ අප්‍රමාදව ඔබේ නමින්ම "රණවිරුවා" හි පළකිරීමට කටයුතු යොදා ඇත.



# රහ කැලි ඕනෑ

## අශ්ව ආහාරය

"අශ්වයෝ මොනවද කන්නේ අම්මේ?" පුංචි චාමික ඇසුවේ සටහන් පොත අතට ගනිමිනි.

"ලියා ගනින්... උඹේ තාත්තගෙ මුළු පඩියම කියලා..." චාමිකගේ අම්මා රේස් කොළය කියවන සිය සැමියා දෙස බලමින් කෝපයෙන් කීවාය...



## විනාඩි පහෙන්

"තාම කෑම උයලා ඉවර නැද්ද? මේ මොන කරුමයක්ද? මං යනව හෝටලේකට" රණසිංහ මහත්තයා වැඩ ඇරී නිවසට පැමිණ කෝපයෙන් කීවේය.

"විනාඩි පහක් ඉන්නකො අනේ..." බිරිඳ කීවා.

"ඇයි විනාඩි පහෙන් කෑම උයල දෙනවද?"

"නෑ මාත් ඇඳගෙන එන්නම් බිරිඳ පැවසුවා."



## මළ ගෙදර

යකෝ මළගෙදර එවුන් සේරම බීල නේද?

අනේ නෑ රාළහාමී... හැමෝම බීල නෑ...

මොකාද බීල නැති එකා...?

ගුණසෝම

කවුද ගුණසෝම කියන්නේ...?

ගුණසෝම තමයි රාළහාමී මැරිල තියෙන්නේ...



# සුබ මංගලම්



1 ශ්‍රීලයුකාබ හි රාජකාරී නියුතු
සැරයන් සඳරේඛා එම්ඩබ්එම්ඩබ්වන්
හා
බුද්ධි අංශයේ රාජකාරී නියුතු
ලාන්ස් කෝප්‍රල් නිමලදාස එම්ඩීජේවන්
පසුගියදා සුබ මොහොතින් යුගදිවි අරඹන ලදී.



1 ශ්‍රීලයුකාබ හි රාජකාරී නියුතු
මාණ්ඩලික සැරයන් වීරසිංහ අයිඩීපීවන්
හා
එම්පී සුමින්ද පතිරාජ
පසුගියදා සුබ මොහොතින් යුගදිවි අරඹන ලදී.

## සැබෑ වූ සිහිනයේ සුන්දර මතකය...

යුද්ධ හමුදා නිලධාරීන්ගේ හා සෙසුනිලයින්ගේ විවාහ මංගල ඡායාරූප රණවිරුවා හි පළකිරීමට ඉඩකඩ වෙන්කෙරේ. ඔබේ විවාහයේ සුන්දරතම දිනයේ මතකය රණවිරුවා පිටු අතරේ විචිත්‍රවත් ලෙස පළකරවා ගන්නට මෙය මහඟු අවස්ථාවකි. එබැවින් ඔබගේ මංගල දිනයේදී ලබාගත් වර්ණ ඡායාරූපයක් විස්තර සමඟින් අපවෙත යොමු කරන්න.

# සුබ උපන් දිනයක්



දෙවන වියට පා තබන
සයුල් නෙත්රු පුතණුවන්ට
සුබ උපන් දිනයට ආසිරි පතන්නේ
අම්මා හා තාත්තා ඇතුළු පවුලේ සැම
(සෙ/244350 කෝප්‍රල් රුවන් ප්‍රියශාන්ත ආර්එම්,
සෙ/265766 කෝප්‍රල් පින්ශාරිකා ඩබ්ලිවම්පි )



හයවන වියට පා තබන
මෙනුල සංකේත් පුතණුවන්ට
සුබ උපන් දිනයට ආසිරි පතන්නේ
අම්මා හා තාත්තා ඇතුළු පවුලේ සැම
(සෙ/703167 සැරයන් සම්පත ඩීවීඑස්
සෙ/725390 සැරයන් වර්ණකුලසූරිය ඩබ්ලිවම්)

## සෙනේබර පැතුමක්...

ඔබගේ ආදරණීය සිඟිත්තාගේ උපන් දිනය වෙනුවෙන් වර්ණ ඡායාරූපයක් රණවිරුවා පිටු අතරේ පළකර ගන්නට මහඟු අවස්ථාවක්. ඔබ කළ යුත්තේ සිඟිති දියණියගේ හෝ පුතණුවන්ගේ ඡායාරූපයක් යුද්ධ හමුදාවේ සිටින පියාගේ හෝ මවගේ විස්තර ද සහිතව අප වෙත එවීම පමණයි.



හයවන වියට පා තබන
ඉඳුමින මනුසර පුතණුවන්ට
සුබ උපන් දිනයට ආසිරි පතන්නේ
අම්මා හා තාත්තා ඇතුළු පවුලේ සැම
(සෙ/725412 සැරයන් ලක්මාලි කේඩී)



පළමුවන වියට පා තබන
සතාරා සදෙව්මි දියණියට
සුබ උපන් දිනයට ආසිරි පතන්නේ
අම්මා හා තාත්තා ඇතුළු පවුලේ සැම
(සෙ/318471 කෝප්‍රල් කලුආරච්චි ටීඩීඑස්)







# සන්කුවික් ජාතික වෙරළ වොලිබෝල් ශුරතාවලියේ දී යුද්ධ හමුදාවෙන් දස්කම්

සන්කුවික් ජාතික වෙරළ වොලිබෝල් ශුරතාවලිය - 2025 සඳහා සහභාගි වී විශිෂ්ට දක්ෂතා දක්වමින් එම තරගාවලියේ පිරිමි විවෘත කාණ්ඩයේ ශුරතාවය ඇතුළු ශුරතා කිහිපයක් දිනාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩකයෝ සමත්වූහ. මෙම තරගාවලිය ඉකුත් ජනවාරි මස 31 සිට පෙබරවාරි මස 02 වන දින දක්වා මීගමුව බ්‍රවුන්ස් වෙරළ තීරයේ දී පැවති අතර, දිවයින පුරා කණ්ඩායම් 160කට අධික සංඛ්‍යාවක් ඊට සහභාගි වූහ.

තරගාවලියේ අවසන් මහා තරගයේ දී, පිරිමි විවෘත කාණ්ඩයේ සුවිශේෂී දක්ෂතා දක්වමින් යුද්ධ හමුදා "බී" කණ්ඩායම, ශ්‍රී ලංකා ගුවන් හමුදා කණ්ඩායමට එරෙහිව තරග 2-0 (21 - 15, 21 - 16) ක් ලෙස ජයග්‍රහණය හිමිකරගත්හ. මෙම තරගාවලිය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කරමින් කණ්ඩායම් හතක් සහභාගි වූ අතර, විවිධ කාණ්ඩ ඔස්සේ ඔවුහු ජයග්‍රහණ හිමිකරගත්හ. එහිදී, පිරිමි විවෘත කාණ්ඩයේ ශුරතාවය යුද්ධ හමුදා "බී" කණ්ඩායම ද දෙවන අනුශුරතාවය - යුද්ධ හමුදා "ඒ" කණ්ඩායම ද තෙවන අනුශුරතාවය - යුද්ධ හමුදා "සී" කණ්ඩායම ද හිමිකර ගත්හ.

## බළලත් නිලධාරි II සමිත දුලාන් කේව් හට එතෙරින් තවත් රන් පදක්කමක්



ශ්‍රී ලංකා යුද්ධ හමුදා මළල ක්‍රීඩක බළලත් නිලධාරි II සමිත දුලාන් කේව් ලෝක පැරා මළල ක්‍රීඩා ග්‍රෑන්ඩ් ප්‍රික්ස් - 2025 තරගාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් රන් පදක්කමක් දිනාගැනීමට සමත්විය. ඩුබායි රාජ්‍යයේ පැවති මෙම තරගාවලියේදී ලොව ප්‍රමුඛ පෙළේ පැරා-මළල ක්‍රීඩකයින් සමඟ තරගවැදී මීටර් 61.88 ක දුරක් වාර්තා කිරීමට ඔහුට හැකියාව ලැබිණි.

ලෝක පැරා මළල ක්‍රීඩා ග්‍රෑන්ඩ් ප්‍රික්ස් යනු ඉහළ පෙළ තරගාවලි සඳහා පැරා ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරාගැනීමේ තරගාවලියකි. ජාත්‍යන්තර පැරා ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ සුවිශේෂී සන්ධිස්ථානයක් වශයෙන් මෙම ජයග්‍රහණය හැඳින්විය හැකිය. ගෝලීය පැරා-මළල ක්‍රීඩාව තුළ ශ්‍රී ලංකාවේ කීර්තිනාමය ප්‍රවර්ධනය සඳහා මෙම ජයග්‍රහණය තුළින් හැකියාව ලැබෙන අතර තරුණ ක්‍රීඩක ක්‍රීඩිකාවන් අභියෝගයන් හමුවේ විශිෂ්ටත්වය කරා රැගෙන යාමට ඒ තුළින් ලැබෙනුයේ නොමඳ පිටුවහලකි.

# මුෂ්ඨි ප්‍රහාර ශූරතාවලියේදී යුද්ධ හමුදාවට ජයග්‍රහණ රැසක්







ශ්‍රී ලංකා මුෂ්ඨි ප්‍රහාර සංගමය විසින් ගාලු මුවදොර පිටියේදී සංවිධානය කරන ලද 97 වන ජාතික මුෂ්ඨි ප්‍රහාර ශූරතාවලියේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ ජයග්‍රහණ රැසකට හිමිකම් කියූහ. දින 4ක් පුරා පැවති මෙම තරගාවලිය සඳහා ක්‍රීඩා සමාජ 25ක් නියෝජනය කරමින් මුෂ්ඨි ප්‍රහාර ක්‍රීඩක ක්‍රීඩිකාවන් 130කට අධික සංඛ්‍යාවක් තරග වැදුණි.

එහිදී යුද්ධ හමුදා පිරිමි මුෂ්ඨි ප්‍රහාර කණ්ඩායම රන් පදක්කම් 9ක්, රිදී පදක්කම් 5ක් සහ ලෝකඩ පදක්කම් 3ක් දිනා ගනිමින් පිරිමි අංශයේ ශූරතාව දිනා ගත් අතර, කාන්තා මුෂ්ඨි ප්‍රහාර කණ්ඩායම රන් පදක්කම් 3 ක්, රිදී පදක්කම් 5 ක් සහ ලෝකඩ පදක්කම් 3ක් දිනා ගනිමින් කාන්තා අංශයේ අනුශූරතාව හිමිකර ගත්තේය. යුද්ධ හමුදා මුෂ්ඨි ප්‍රහාර ක්‍රීඩකයෝ මෙම ඉසව්වේ ඉහළ දක්ෂතා පෙන්නුම් කරමින් සාජන් සෙල්වදොරෙයි අනුස්මරණ අභියෝග කුසලානය, වසරේ සාර්ථකම මුෂ්ඨි ප්‍රහාර කණ්ඩායම සඳහා හිමි මුත්තයියා සේවියර් රෝස් අනුස්මරණ අභියෝග කුසලානය, දක්ෂතම මුෂ්ඨි ප්‍රහාර ක්‍රීඩකයාට හිමි සම්මානය, හොඳම පරාජිත මුෂ්ඨි ප්‍රහාර ක්‍රීඩකයාට හිමි සම්මානය සහ දක්ෂතම මුෂ්ඨි ප්‍රහාර කාන්තා සම්මානය ඇතුළු සම්මාන රැසක් දිනා ගනිමින් ජයග්‍රණය තවදුරටත් තහවුරු කර ගත්හ.

ලාන්ස් කෝප්‍රල් ධර්මසේන ආර්එම්පී තරගාවලියේ වඩාත්ම කැපී පෙනෙන මුෂ්ඨි ප්‍රහාර ක්‍රීඩකයාට හිමි සම්මානය සහ බොම්බෝඩියර් ජයවර්ධන එම්එම්එල්පී හොඳම පරාජිත මුෂ්ඨි ප්‍රහාර ක්‍රීඩකයාට හිමි සම්මානය දිනාගත් අතර, සැරයන් ප්‍රියදර්ශනී එස්එච් තරගාවලියේ වඩාත්ම කැපී පෙනෙන මුෂ්ඨි ප්‍රහාර ක්‍රීඩිකාව ලෙස සම්මාන ලැබුවාය. යුද්ධ හමුදා මුෂ්ඨි ප්‍රහාර කමිටුවේ සභාපති මේජර් ජෙනරල් ඒකේ රාජපක්ෂ යූඑස්පී ගේ මගපෙන්වීම සහ අධීක්ෂණය යටතේ යුද්ධ හමුදා මුෂ්ඨි ප්‍රහාර කණ්ඩායම මෙම ජයග්‍රහණයන් සඳහා කැපවී කටයුතු කරනු ලැබීය.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එතෙරින් තවත් රන් පදක්කමක්




ශ්‍රී ලංකාවේ පැරා-මළල ක්‍රීඩා ඉතිහාසය තුළ කැපීපෙනෙන ජයග්‍රහණයක් සනිටුහන් කරමින් ඩුබායි රාජ්‍යයේදී 2025 පෙබරවාරි මස 11 දින පැවති "පැරා මළල ක්‍රීඩා ග්‍රෑන්ඩ් ප්‍රික්ස් - 2025" තරගාවලියේ යගුළිය විසිකිරීමේ ඉසව්වෙන් රන් පදක්කමක් දිනාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා මළල ක්‍රීඩක මාණ්ඩලික සැරයන් එච්.ජී පාලිත බණ්ඩාර සමත්විය. ප්‍රමුඛ පෙළේ ජාත්‍යන්තර ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැසක් සමග තරගවැදිමින් ඔහු එහිදී සිය සුවිශේෂී කුසලතා ප්‍රදර්ශනය කරනු ලැබීය. මෙම ජයග්‍රහණය ඔහුගේ පුද්ගලික කැපවීම පමණක් නොව ශ්‍රී ලංකාවේ පැරා-මළල ක්‍රීඩාවේ ශක්තිය ද පෙන්නුම් කිරීමකි. මෙම ජයග්‍රහණය ජාත්‍යන්තර පැරා-ක්‍රීඩාව තුළ ශ්‍රී ලංකාවේ පැවැත්ම තහවුරු කරනු ලබන අතර ඉදිරි තරගාවලියන්හිදී තවදුරටත් සාර්ථකත්වය කරා යාම සඳහා අවශ්‍ය මංපෙත් සකසාදීමක් ද වේ.



# ආරක්ෂක සේවා ගොල්ෆ් ශූරතාවලියේදී යුද්ධ හමුදාවෙන් වැඩි දස්කම්





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ගොල්ෆ් කම්ටුව මගින් සංවිධානය කරනු ලැබූ 13 වන ආරක්ෂක සේවා ගොල්ෆ් ශූරතාවලිය 2025 පෙබරවාරි මස 10 සහ 11 දෙදින තුළ නුවරඑළිය ගොල්ෆ් සමාජයේදී ත්‍රිවිධ හමුදාවේ ගොල්ෆ් ක්‍රීඩකයින් 100කට අධික පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත්විණි. එහිදී, ආරක්ෂක සේවා ක්‍රීඩා ඉතිහාසයේ ප්‍රථම වරට පිරිමි කාණ්ඩයේ ශූරතාවය දිනාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා පිරිමි ගොල්ෆ් කණ්ඩායම සමත්විය. ශ්‍රී ලංකා ගුවන් හමුදා ගොල්ෆ් කණ්ඩායමට එරෙහිව ලකුණු 26ක් රැස්කරමින් ඔවුනු එම ශූරතාවට හිමිකම් කීහ.

එහිදී කාන්තා කාණ්ඩයේ අනුශූරතාවය දිනාගැනීමට ද ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා ගොල්ෆ් කණ්ඩායම සමත් වූ අතර එම කාණ්ඩයේ ශූරතාවය ශ්‍රී ලංකා ගුවන් හමුදා කාන්තා ගොල්ෆ් කණ්ඩායම විසින් දිනාගන්නා ලදී. යුද්ධ හමුදා කාන්තා ගොල්ෆ් කණ්ඩායමේ කෝප්‍රල් රත්නායක ආර්එම්ජීඑස් තරගාවලියේ හොඳම කාන්තා ක්‍රීඩිකාවට හිමි සම්මානය ද, කාන්තා කාණ්ඩයේ දුරම ප්‍රහාරයට හිමි සම්මානය ලාන්ස් කෝප්‍රල් විජේගුණරත්න කේඩබ්ලිව්වීඑස් විසින් ද, යුද්ධ හමුදා ගොල්ෆ් කණ්ඩායමේ ඉංජිනේරු කාන්තා සෙබළ දිල්රුක්ෂි කේයූඑන් ළඟම ප්‍රහාරයට හිමි සම්මානය ද දිනාගනු ලැබූහ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ගොල්ෆ් කම්ටුවේ හිටපු සභාපති වශයෙන් මෙම ඓතිහාසික ජයග්‍රහණය සඳහා අඩිතාලම සැකසීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටුකළ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩියූ පීඑස්සී අයිජී එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ජයග්‍රහණය වෙනුවෙන් එම කම්ටුවේ වත්මන් සභාපතිතුමන්ට සහ එම ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත සිය සුභපැතුම් පිරිනැමීය. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස බටහිර ආරක්ෂක සේනා ආඥාපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ගොල්ෆ් කම්ටුවේ සභාපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි විය.

## යුද්ධ හමුදා පාපන්දු ශූරතාවලිය - 2025





යුද්ධ හමුදා පාපන්දු කම්ටුවේ සභාපති මේජර් ජෙනරාල් කේජීයූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී ගේ මඟපෙන්වීම මත යුද්ධ හමුදා පාපන්දු කම්ටුව වෙතින් සංවිධානය කරනු ලැබූ අන්තර් රෙජිමේන්තු "සත් සාමාජික පාපන්දු ශූරතාවලිය - 2025" හි අවසන් මහා තරගය ඉකුත් පෙබරවාරි මස 14 වන දින පනාගොඩ, පාපන්දු ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. මෙම තරගාවලිය සඳහා රෙජිමේන්තු 11ක් නියෝජනය කරමින් පාපන්දු කණ්ඩායම් සහභාගි විය. මෙම තරගාවලියේ ශූරතාවය දිනාගැනීමට සන්නද්ධ බුද්ධි බලකා පාපන්දු කණ්ඩායම සමත්වූ අතර අනුශූරතාවය විජයබාහු පාබල රෙජිමේන්තු පාපන්දු කණ්ඩායම විසින් දිනාගන්නා ලදී. අවසන් මහා තරගය නැරඹීම සඳහා යුද්ධ හමුදා නිලධාරීහු සහ සෙසුනිලයන් විශාල පිරිසක් සහභාගි වූහ.

# මෙරටදී දිවිපිදූ ඉන්දියන් විරුවන් සැමරේ







වර්ෂ 1987 - 1990 කාලය තුළදී එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන්ට එරෙහිව මෙරටදී සටන් වැදුණු ඉන්දීය සාම සාධක හමුදාවේ දිවිපිදූ රණවිරුවන් සිහි කිරීමේ උත්සවයක් ඉන්දියානු ජනරජ දිනයට සමගාමීව 2025 ජනවාරි මස 26 වන දින පලාලි පිහිටි ඉන්දීය රණවිරු ස්මාරකය අභියස දී පැවැත්විණ.

යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් වයිඒබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සීගේ මඟපෙන්වීම මත සිදුකෙරුණු මෙම සැමරුම් අවස්ථාවට ශ්‍රී ලංකා ඉන්දීය කොන්සල් ජෙනරාල් සායි මුරලි මහත්මා සහ ඉන්දීය කොන්සල් ජෙනරාල් කාර්යාලයේ නිලධාරී පිරිසක් ද එක්වූහ.


# රණවිරුවා







**අධීක්ෂණය**

බ්‍රිගේඩියර්
ඩබ්ලිව්ඩීඑස් ගමගේ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී
පීඑස්සී

**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
එම්අයිඩීඑස් චන්ද්‍රකුමාර
යූඑස්පී පීඑස්සී අයිජී





**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ

**සහාය සංස්කාරක**

කපිතාන්
එච්පීජේ හවන්ති

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 ඔනි II සේනාරත්න ජීසී 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑල්එම් 11 ඉසේරෙ

**ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය**

"රණවිරුවා"
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර.

**ඊමේල්**

dtemedia&psyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුධ දිගුව**

51445 / 51446 / 51447

**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය

# සරණක් අවැසි තැන රණවිරුවන් මිස අන් කවුරුන්ද?

**විපතේදී වහා පිහිට වන්නේත්, සැපතේදී අනෙකාගේ සතුට දැක සතුටු වන්නේත් රණවිරුවකු මිස අන් කවරෙක්ද? තිස් වසක ත්‍රස්තවාදය නිමකොට මව්බිම නිදොස් කොට නිදහස් කළ පසුවද රණවිරුවන් කිසිවිට ජනතාව ආරක්ෂා කිරීම වෙනුවෙන් වූ සිය මෙහෙවරෙන් අත්මිදුනේ නැත. දියේ ගිලීම්, නායයෑම්, සුළි සුලං, ගංවතුර, පස්කඳු කඩා වැටීම් ආදී ඕනෑම හදිසි විපතකදී ද රණවිරුවන් නොවලහා පෙරට විත් ජනතාවගේ ආරක්ෂාව, රැකවරණය තම ප්‍රථම කාර්යය බවට පත්කරගන්නේ ඕනෑම අවස්ථාවක දී තම දිවි දෙවෙනි කොට අන් දිවි රැකීමට දිවිහිමියෙන් කැපවන බව පසක් කරමිනි.**



ඉකුත් මාර්තු මස 01 දින කොළොන්නාව ප්‍රදේශයේ පිරිසක් නත්පේරියල් ප්‍රදේශයේ සංචාරයක නිරත වූහ. එහිදී, ඔවුන් හිරිකදු ඔය අවට ගතකරමින් සිටියදී හදිසියේ එහි ජල මට්ටම ඉහළ යාම හේතුවෙන් අනපේක්ෂිතව සිරවූහ. එහිදී, මුල් අවස්ථාවේ එයින් පිරිසක් ජල පහරෙන් මෙගොඩට පැමිණ තිබුණද 35 දෙනක් ඊට මැදිව දැඩි ජීවිත අවදානමකට ලක්වූහ. නත්පේරියල් යුද්ධ හමුදා අනුකණ්ඩයට මේ පිළිබඳ දැනගන්නට ලැබෙන්නේ එම අවස්ථාවේදීය.

ඒ අනුව වහා ක්‍රියාත්මක වූ එහි ස්ථානගතව සිටි ගැමුණු හේවා බලකායේ ආපදා සහන කණ්ඩායම ඒ වෙත ලඟාවී එම පිරිස මුදාගැනීම පිණිස ක්ෂණික මෙහෙයුමක් දියත් කළහ. ඒ වනවිටද, එම ගඟේ ජල මට්ටම තවදුරටත් වැඩිවෙමින් තිබූ පසුබිමක මොහොතක හෝ ප්‍රමාදය ඔවුන්ගේ ජීවිතවල ඉරණම තීන්දුවීමට ඉඩ ඇති බැව් සෙබළුන්ට අවබෝධ විය. එහිදී, තම ජීවිත අවධානම නොතකා එලෙස සිරවී සිටි සියලුදෙනාගේ ජීවිත නිරුපද්‍රිතව බේරාගන්නට එම හටපිරිස් කටයුතු කරන ලද්දේ දේශයේ මුර දේවතාවුන් තමන් බැව් යළි යළිත් සිහිපත් කරමිනි.



රණබිමේ මතක

# පස් අස්සෙ කතාබස්
# ඒ බිමේ තාම ඇහෙනවා

යුද්දෙ කාලෙ ගිනිඅව් තරමටම පස්බැම්මත් රණවිරුවන්ට සම්පයි. ඉස්සි ඉස්සී බැලුව දුඹුරුපාට පස්බැම් අස්සෙ රස්නෙ වැටුණු ලේ කඳුළු කතා බොහොමයි. එදා හිස්වෙච්ච බිම්වල අස්සක් මුල්ලක් නෑර අද රැස් කකා සෙනඟ ඇවිද්දට දූලි පිරුණු මඩ තැවරුණු ඒ කර්කශ මහ පොළොවෙ ඇස්, ඉස්, මස්, ලේ දන්දුන්නු බොහෝ පිරිසක් අදටත් නිහඬව මිහිදන්ව ඇති බව යුදබිමේ පය නොගහපු කිසිවෙක් දන්නෙ නැහැ.



ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.